කාන්තා, ළමා කටයුතු හා
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

# ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

## ශ්‍රී ලංකාව

ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා
තාක්ෂණික සහයෝගය

UNFPA

# පටුන


හැඳින්වීම 4

තාර්කික පදනම 7

ප්‍රතිපත්ති ප්‍රකාශය 8

ප්‍රධාන මූලධර්ම සහ ප්‍රතිපත්තිමය බැඳීම් 10

1 වැනි තේමාගත ක්ෂේත්‍රය: අනන්‍යතාව සහ ස්වාධීනත්වය 12

2 වැනි තේමාගත ක්ෂේත්‍රය: ආර්ථික සවිබලගැන්වීම සහ ඵලදායී රැකියා නියුක්තිය 13

3 වැනි තේමාගත ක්ෂේත්‍රය: සමාජ සමානාත්මතාව සහ සවිබලගැන්වීම 14

4 වැනි තේමාගත ක්ෂේත්‍රය: පරිසරය සහ ආපදා කළමනාකරණය 19

5 වැනි තේමාගත ක්ෂේත්‍රය: තීරණ ගැනීමේදී සමානාත්මතාව 20

6 වැනි තේමාගත ක්ෂේත්‍රය: යුක්තිය සහ සාමය හා ආරක්ෂාව කරා ප්‍රවේශය 21

7 වැනි තේමාගත ක්ෂේත්‍රය:: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස 23

8 වැනි තේමාගත ක්ෂේත්‍රය: ළමයින් -ගැහැණු ළමයා පිළිබඳ විශේෂ අවධානය සහිතව 24

පාලනය, ක්‍රියාත්මක කිරීම සහ හවුල්කාරිත්වය සහ සම්පත් ඒකරාශී කිරීම 25

ඇමුණුම: තේමාගත ක්ෂේත්‍ර පිළිබඳ සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු 27

# ස්තුතිය

කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටු දැකීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. ඒ අනුව පවුල, සේවා ස්ථානය සහ ප්‍රජාව ඇතුළු සෑම තත්ත්වයකදීම කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සමාන අයිතිවාසිකම් සහ අවස්ථා සහතික කිරීම සඳහා වූ ජාතික මට්ටමේ උපාය මාර්ග ශක්තිමත් කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් කොළඹ විශ්ව විද්‍යාලයේ විද්වතුන් කණ්ඩායමකගේ මහඟු සහයෝගයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා ඉ සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමේ ආරම්භය 2017 වර්ෂයේදී කාන්තා, ළමා කටයුතු විෂයභාර අමාත්‍යාංශය විසින් සනිටුහන් කරන ලදී.

ඉහත කටයුතු සාර්ථක කර ගැනීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති සහ කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදෙස් සහ මගපෙන්වීම අමාත්‍යාංශය වෙත ලැබීම අපට මහත් ගෞරවයක් විය.

කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතුවල නිරත වූ මෙම අමාත්‍යාංශයේ නිලධාරීන්ට කළ සමීප මඟ පෙන්වීම අප සිහිපත් කරනුයේ අතිශය ස්තුතිපූර්වකවය.

"ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කම් සිදු කිරීම් සහ කාන්තා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කර එහි නිර්දේශ පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම" සඳහා පිහිටුවන ලද "පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ "සභාපතනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිණිය සහ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සියලුම සාමාජිකයින් වෙත අපගේ හදපිරි ප්‍රණාමය පිරිනමමු.

මෙම භාරදූර කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා අමාත්‍යාංශය මඟින් පත්කළ උපදේශක කමිටු සාමාජිකයින් වන ජාතික කාන්තා කමිටුවෙහි හිටපු සභාපතිනි ස්වර්ණා සුමනසේකර මහත්මිය සහ හිටපු විධායක අධ්‍යක්ෂිකා මානෙල් ජයමාන්න මහත්මිය, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ජාතික වැඩසටහන් සහ ප්‍රතිපත්ති විශ්ලේෂක ශාරිකා කුරේ මහත්මිය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂඥ ශ්‍රියානි පෙරේරා මහත්මිය, එක්සත් ජාතීන්ගේ කාන්තා වැඩසටහනෙහි ශ්‍රී ලංකා නියෝජිත, රමායා සල්ගාදු මහත්මිය, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ වැඩසටහන් නිලධාරී හිරෝෂණී ගුණතිලක මහත්මිය සහ සිවිල් සංවිධාන නියෝජිත ආචාර්ය විජය ජයතිලක මහතා වෙත අපගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමු.

කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ මීට පෙර සිටි ලේකම්වරුන් වන කුමාරි ජයසේකර සහ නීල් බණ්ඩාර හපුහින්න යන මහත්ම මහත්මීන් මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ මූලික අදියරේ දී මේ හා සම්බන්ධ වී දැක්වූ මඟපෙන්වීම සහ උපදෙස් නොමැති වූයේ නම් මෙම ප්‍රතිපත්තිය සකස් කළ නොහැකි වනු ඇත. එමෙන්ම ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන්, ප්‍රවීණයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් ලබාදුන් බුද්ධිමය දායකත්වය ද අගය කරමු. ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේදී ඔවුන්ගේ නිර්මාණාත්මක අදහස් පමණක් නොව, උපදේශන මාලාවේදී ඔවුන්ගේ වටිනා කාලය ද කැප කිරීම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙමු.

මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී පැවති සියලුම සැසි සඳහා තම නොමසුරු දායකත්වය ලබාදුන් පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධානීන් ඇතුලු සියලුම නිලධාරීන්ට පළාත් පාලන ආයතන, සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන්, ප්‍රජා මූලික සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ හවුල්කාර සංවිධාන සහ අනෙකුත් සියලුම ආයතනවල නියෝජිතයන් වෙත ස්තුති වන්ත වෙමු. බිම් මට්ටමේ ජනතා හඬ නියෝජනය කළ ඔවුන්ගේ සුවිශේෂී දායකත්වය අපි විශේෂයෙන් අගය කරමු.

තවද, ප්‍රතිපත්තිය සකස් කිරීම ආරම්භයේ සිට එය අවසන් කිරීම දක්වා ලබාදුන් තාක්ෂණික සහ මූල්‍ය සහාය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත කුන්ලේ අදෙනියි මහතා සහ එහි ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලයට සහ උපදේශක ආචාර්ය රමණී ජයසුන්දර මහත්මියට ස්තූතිවන්ත වෙමු.

මෙම ජාතික ප්‍රතිපත්තිය අවසන් කිරීමේ ක්‍රියාවලියේදී එහි සමාලෝචනය කරමින් ඔවුන්ගේ වටිනා අදහස් හා යෝජනා ලබාදෙමින් තම කාලය හා ශ්‍රමය කැපකළ සියලුම හවුල්කරුවන්ට සහ නිලධාරීන්ට ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු.

මෙම කාර්යයේදී ඉහළ දායකත්වයකින් සහ කැපවීමකින් කටයුතු කළ කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, නිල්මිණී හේරත් මහත්මිය ඇතුළු ඒ සඳහා සහභාගි වූ සියළුම නිලධාරීන් විශේෂයෙන්ම සිහිපත් කරමු.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ මෙම ජාතික ප්‍රතිපත්තිය දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ අනෙකුත් සියලුම ක්ෂේත්‍රවල අඛණ්ඩ සමාජ වෙනසක් සමඟ කාන්තා අයිතිවාසිකම් වලට සහ මූලික නිදහසට වෙනස් කොට සැලකීමකින් තොරව ගරු කිරීමෙහි සාධනීය වෙනසක් ඇති කරනු ඇතැයි අවසාන වශයෙන් අපි විශ්වාස කරමු.

**ලේකම්**

**කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

# හැඳින්වීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන් ඇති ආවේනික හිමිකම ශ්‍රී ලංකාව පිළිගන්නා අතර කාන්තාවන්, පිරිමින්, ගැහැණු ළමුන්, පිරිමි ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය අතර සමානාත්මතාව සංවර්ධනයෙහි ප්‍රධාන අංශයක් ලෙස  සලකයි. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 51% ක් කාන්තාවන්ගෙන් සැදුම් ලබයි. වයස අවුරුදු 18ට අඩු ළමුන් අතර ගැහැණු ළමුන් ඒ හා සමාන සංඛ්‍යාවක්  සිටී. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සම්බන්ධයෙන්  ලබා ගත හැකි ජාතික මට්ටමේ දත්ත කිසිවක් නොමැත

ජීවිතයේ සියළු අවස්ථා වලදී කාන්තාවන් සහ ගැහැණු  ළමුන් විසින් මුහුණ දෙනු ලබන ආවේනික අසමානතා, කොන් කිරීම සහ වෙනස් ආකාරයෙන් සැලකීම හඳුනා ගනිමින්  ශ්‍රී ලංකාව කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබලගැන්වීමට කැප වෙයි.  සාධනීය ජයග්‍රහණ සහ නිෂේධාත්මක තත්ත්වයන් ප්‍රදර්ශනය කරන ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ තත්ත්වය සංකීර්ණය. එහි ප්‍රතිඵලයක් ලෙස, රටවල් වල ස්ත්‍රී පුරුෂ සමාජභාව අසමානතාව මනින ලෝක ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා දර්ශකයෙහි රටවල් 132ක් අතර ශ්‍රී ලංකාව  75 වැනි ස්ථානයෙහි පිහිටුවනු ලැබ ඇත.

1978 දී  පනවන ලද ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ව්‍යවස්ථාවෙහි ස්ත්‍රී පුරුෂ භේදය යන හේතුව මත වෙනස්කමකට භාජන නොවිය යුතුය යන ප්‍රතිපත්තිය නියම කරයි. 12 වැනි ව්‍යවස්ථාව, නීතිය ඉදිරියේ සියළු තැනැත්තන් සමාන වීමේ, සියළු තැනැත්තන්ට නීතියේ ආරක්ෂාව සමානව ලැබීමේ අයිතිය සහතික කරන අතර කිසිම පුරවැසියකු, වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන  හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ  විශේෂයකට භාජනය නොවිය යුතුය යන බැඳීමට යටත් කරයි. කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ ආබාධිත තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීතිවලින් හෝ විධායක ක්‍රියාමාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම සමානාත්මතාව පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන මගින් කිසිසේත් අවහිර නොවිය යුතුය යන බැඳීමට යටත් කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තවදුරටත් තහවුරු කෙරෙන ක්‍රියා වෙනුවෙන් විධිවිධාන සලස්වයි. [12(4) ව්‍යවස්ථාව]

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන් බැඳීමට යටත් කරවන එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ප්‍රඥප්ති වලට සහ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුති වලට ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත. 1981 දී ශ්‍රී ලංකාව කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) අපරානුමත කර ඇත.  ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මත පදනම්ව වෙනස් ආකාරයෙන් සැලකීම මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස  පැහැදිලිවම වෙන් කොට දක්වන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ ආර්ථික,සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ඇතුළුව තවත් ජාත්‍යන්තර සම්මුති ගණනාවකටද ශ්‍රී ලංකාව අත්සන් තබා තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට රටේ ඉලක්කගත කැපවීම ගෙනහැර

දක්වමින් ශ්‍රී ලංකාව 1993 දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම පිළිබඳ වියානා ප්‍රකාශනයට අත්සන් තැබුවේය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය යෝජනා අංක 1325ට සහ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට ශ්‍රී ලංකාවේ බැඳීම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබලගැන්වීම පිණිස රටේ බැඳීම් ශක්තිමත් කර ඇත. දරිද්‍රතාවය අවසන් කිරීම හා පෘථිවිය ආරක්ෂා කිරීම සහ 2023 වන විට සියළු ජනතාව සාමය සහ සෞභාග්‍යය අත්විඳින බව සහතික කිරීම සඳහා වන ක්‍රියාමාර්ග වෙනුවෙන් විශ්වීය කැඳවුමක් ලෙස එක්සත් ජාතීන් විසින් 2015 දී සම්මත කර ගන්නා ලද තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකාව තවදුරටත් බැඳී සිටී.

කාන්තාවන්ට විශේෂිත වූ ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය බැඳීම් ඇති වූයේ කාන්තාවන් වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ දශකය (1975 සිට 1985) අතරතුරදී සහ විශේෂයෙන්ම 1975 ජාත්‍යන්තර කාන්තා වර්ෂයේ ප්‍රතිඵලයක් ලෙසිනි. ශ්‍රී ලංකාවේ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ප්‍රධාන ප්‍රතිපත්ති ලේඛනය වන්නේ 1993 සකස් කරන ලද කාන්තා ප්‍රඥප්තියයි. ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය රජය විසින් 1993 මාර්තු මස කෙටුම්පත් කර සම්මත කර ගන්නා ලද අතර එය කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම හා කාන්තාවන්ට අදාළ තීරණාත්මක ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීම සඳහා රජයේ බැඳීම ප්‍රකාශ කරන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රකාශනය වේ.

1978 සිට ශ්‍රී ලංකාව කාන්තාවන් සවිබලගැන්වීම සඳහා කැපවූ අමාත්‍යාංශයක් පවතින බවට වගබලා ගෙන ඇත. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ලබා දීමට ක්‍රියා කරනු පිණිස ප්‍රඥප්තිය විසින් රාජ්‍ය යාන්ත්‍රණයට සිදු කරන ලද වඩාත්ම කැපී පෙනෙන හඳුන්වා දීම වන්නේ ප්‍රඥප්තියේ අධීක්ෂණ හස්තය ලෙස ජාතික කාන්තා කමිටුව ස්ථාපනය කිරීමයි. ජනාධිපති විසින් පත්කරනු ලබන කමිටුවක් වන ජාතික කාන්තා කමිටුවට පහසුකම් සලසනු ලැබ ඇත්තේ ප්‍රඥප්තියෙහි විධිවිධාන මගිනි. ජාතික කාන්තා කමිටුවේ බලපැවරුම පුළුල් කාණ්ඩ තුනක් යටතට ගැනේ: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීම පිළිබඳ පැමිණිලි භාර ගැනීම, සන්නිරීක්ෂණය හා ඒවාට එරෙහි ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාල ආයතන හෝ බලධාරීන් වෙත යොමුකිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ගැටළු පිලිබඳ පර්යේෂණ සිදු කිරීම ප්‍රවර්ධනය සහ උපදෙස් පතන ලද හෝ එසේ කිරීම අවශ්‍ය යැයි ජාතික කාන්තා කමිටුව සලකන අවස්ථාවලදී කාන්තා කටයුතු භාර අමාත්‍යවරයාට උපදෙස් දීම. කෙසේ වෙතත්, කාන්තා ප්‍රඥප්තියට නෛතික පිළිගැනීම නොමැති වීම, එයට නෛතික, පරිපාලනමය හා ආඥාත්මක පිළිගැනීම සහ ක්‍රියාත්මක කරවීම හා අධීක්ෂණය සඳහා නිත්‍යානුකූල බලය අහිමි කරවයි.

ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ගණනාවක් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම කෙරෙහි බලපෑම් ඇති කරයි. මෙම ප්‍රතිපත්ති වලට එක් කර ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගැනීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම කරා ක්‍රියා කිරීමට ප්‍රතිපත්ති රාමුව සපයයි. කාන්තා ප්‍රඥප්තියට අමතරව, කාන්තාවන් කේන්ද්‍ර කරගත් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් අතරට ක්‍රියාත්මක වීම වෙනුවෙන් බෙයිජිං වේදිකාව මතින් පැන නැගුණු කාන්තාවන් පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (1996), ශ්‍රී ලංකාවේ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016), ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැලැක්වීමේ පනතට ආධාරක වන ක්‍රියාකාරී සැලැස්ම (2005), සහ ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙහි (2017-2021) කාන්තා අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය ඇතුලත් වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම සමෝධානය කරන ප්‍රධාන ප්‍රතිපත්ති අතරම ශ්‍රී ලංකාවේ සුපිලිපන් වැඩ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2006), ජාතික ශ්‍රම විගමන ප්‍රතිපත්තිය (2009) සහ නීති ආධාර ප්‍රතිපත්තිය (2015) අයත් වේ. මේ සියළුම ප්‍රතිපත්ති රාමු සහ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කෙරෙන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

රෝම ලන්දේසි නීතිය, ඉංග්‍රීසි නීතිය සහ පෞද්ගලික නීති (උඩරට නීතිය, තේසවලාමෙයි සහ මුස්ලිම් නීතිය) යන නීතිවල සංකලනයකින් සැදුම් ලබන සංගෘහිත සහ සංගෘහිත නොවූ නීති ආකාර සමූහයකින් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සමන්විත වේ. කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ ශාරීරික ඒකාග්‍රතාව රාජ්‍යය විසින් ආරක්ෂා කරනු ලැබීම ශක්තිමත් කරවන විශේෂිත අවස්ථා ගණනාවක් දණ්ඩ නීති සංග්‍රහය හඳුනා ගනී. ශ්‍රමය හා රැකියා නියුක්තිය පාලනය කරන නීති, විවාහය සහ පවුල් සබඳතා පාලනය කරන නීති, ඉඩම් හා දේපල සම්බන්ධ නීති, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී තෝරාගත් සාධනීය විධිවිධාන සහිතව බොහෝ සෙයින්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට විශේෂයක් නොමැතිව පවතී. කෙසේ වෙතත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තරයේ සහතික කිරීම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම හා සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කරන ප්‍රබල නීති කිහිපයක් සමඟ නීති රාමුව ප්‍රධාන වශයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අපක්ෂපාතී ප්‍රවේශයක් ගැනීම තිබියදීත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම සහතික කරන විශේෂ ක්‍රියාමාර්ග කිසිවක් බොහොමයක් නීතිවල අඩංගු නොවන අතර, ඇතැම් අවස්ථාවලදී කාන්තාවන්ට හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට එරෙහිව විවෘතව වෙනස් කොට සැලකීමට හේතු වී ඇත.

# තර්කානුකූල පදනම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව යනු මූලික මානව හිමිකමක් වන අතර එය සමෘද්ධිමත්, සාමකාමී සහ තිරසර රටක් සඳහා අවශ්‍ය වන පදනමක් ද වේ. ශ්‍රී ලංකා රජය විසින් රටෙහි ප්‍රගතිශීලී සංවර්ධනය වේගවත් කිරීම සඳහා කැපවීමේ අවශ්‍යතාවය සහ ඒ සඳහා යොමුවූ පැහැදිලි ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමට ලක් කරනු ලැබේ. එපරිද්දෙන් සමානාත්මතා පදනමක් මත මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් බුක්ති විඳිනු ලැබීම සහතික කිරීම සඳහා වන ධනාත්මක සහ සහයෝගය සලසන ක්‍රියාත්මක වීමක් අවශ්‍ය වේ. අයිතිවාසිකම් යනු සියල්ලන්ම සඳහා සමාන වන යථාර්ථයක් බව සහතික කිරීමත්, ශ්‍රී ලංකාවේ අනාගතය වෙනුවෙන් ඉතාමත් වැදගත් වන තිරසර සංවර්ධනය තුළ කාන්තාවන් සහ පිරිමින් සමාන හවුල්කරුවන් බවට පත් කිරීම සහ පැනනගින අභියෝගයන් ග්‍රහණය කර ගැනීම ඔස්සේ සියලු පැතිකඩ ආශ්‍රිතව සෑම ගැටලුවක්ම ආමන්ත්‍රණය කිරීමත් සඳහා අවශ්‍ය වන පරිවර්තනීය වෙනසක් සඳහා මගපෙන්වීම සැලසීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අසමානතාවයන් යනු ඉතා තදින් මුල්බැසගත් කාරණයක් බවත්, එසේම කාන්තාවන් සහ පිරිමින් සතු භූමිකාවන්, වගකීම් සහ අනන්‍යතාවයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ඒකාකෘතිකරණයන් අඛණ්ඩවම පිලිබිඹු වන බවත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය. මෙම සංදර්භය තුළ මේ ප්‍රතිපත්තිය මගින් උත්සාහ කරනුයේ කාන්තාවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන්ට ජාතික සංවර්ධනය කෙරෙහි දායකත්වය සපයන අතරතුර ස්වකීය අයිතිවාසිකම් පූර්ණ වශයෙන් බුක්ති විඳිය හැකි ඒ සඳහා ඉඩකඩ සලසන වටපිටාවක් නිර්මාණය කිරීමටයි.

තාක්ෂණය සහ ආර්ථිකය යන ක්ෂේත්‍රයන් තුළ සැලකිය යුතු වෙනස්කම් සිදුවී ඇති අතර එමගින් කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන් කෙරෙහි ධනාත්මක මෙන්ම සෘණාත්මක බලපෑම් ඇති කරමින් රටෙහි සමාජ- සංස්කෘතික වටපිටාව පරිවර්තනයකට ලක් කොට ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශේෂයෙන්ම යුද්ධයේ බලපෑමට ලක් වූ කාන්තාවන් ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ නව ගැටළු මතු වී තිබෙන අතර කාන්තාවන් සවිබලගැන්වීම සහ ඔවුන් විසින් සමාන අයිතිවාසිකම් බුක්ති විඳීම කෙරෙහි ඉතා ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබමින් ස්වාභාවික ආපදා වැනි පාරිසරික ගැටලුද මතු වී ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තුළින් නීති, ප්‍රතිපත්ති, වැඩසටහන් සහ යාන්ත්‍රණ සකස් කිරීම සඳහා මගපෙන්වීම සැපයීමටත් ඒවා ප්‍රමිතිගත කිරීමටත් අවශ්‍ය රාමුව ස්ථාපනය කරනු ලැබේ. තවදුරටත්, මෙම ප්‍රතිපත්තිය මගින් අරමුණු කරනු ලබන්නේ රජයේ සියලු අංශයන් සහ ව්‍යුහයන් තුළ මෙන් ම රජයේ සහ පෞද්ගලික සේවා ස්ථානයන්, ප්‍රජාව, පවුල සහ සිවිල් අවකාශය තුළ පවා කාන්තාවන් සඳහා සමාන අයිතිවාසිකම් හා අවස්ථා සහතික කිරීමටයි.

## දැක්ම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් වනුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය, සමාන අවස්ථා සැලසීම සහ සියල්ලන් සඳහා සම සාධාරණ යුක්තියට ඉඩකඩ සලසනු ලබන සහ සහතික කරනු ලබන රටක් නිර්මාණය කිරීම.

## මෙහෙවර

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය තුළින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සහ සියලු කාන්තාවන්, පිරිමින්, ගැහැණු ළමුන්, පිරිමි ළමුන් සහ ස්ත්‍රී පුරුෂ යන දෙපාර්ශ්වය නොවන වෙනත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවයන්ට අයත් පුද්ගලයන් සියලු ස්වරූපයේ වෙනස් කොට සැලකීම් වලින් ආරක්ෂා කිරීම සහතික කිරීම.

## ප්‍රතිපත්ති ප්‍රකාශය

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, කාන්තාවන්ගේ හා පිරිමින්ගේ සමානාත්මතාව තහවුරු කෙරෙන, සියළු කාන්තාවන් මූලික අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳින, පොදු හා පෞද්ගලික ජීවිතය යන දෙකෙහිදීම කාන්තාවන් සහ පිරිමින් යන දෙපාර්ශවයටම ඔවුන්ගේ පූර්ණ විභවය අත් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදයට සමානව හා සාධාරණව සහභාගි වීමට හා ඉන් ප්‍රතිලාභ ලැබීමට හැකි සාධාරණ සමාජයක් අරමුණු කරයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, දේශපාලන, ආර්ථික,සමාජ,සංස්කෘතික සහ අනෙකුත් සියළු අවකාශ තුළ කාන්තාවන්, ගැහැණු ළමුන්, පිරිමින්, පිරිමි ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතර කණ්ඩායම් විසින් මානව හිමිකම් සහ මූලික නිදහස සමානව භුක්ති විඳිනු ලබනු පිණිස සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම මගින් වෙනස් කොට නොසැලකීමේ සහ මානව හිමිකම් වලට ගරු කිරීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීම අරමුණු කරයි.

එබැවින්,

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම වෙනුවෙන් ප්‍රතිපත්ති, ව්‍යවස්ථාදායක සහ ආයතනික රාමු ඇති කිරීම සහතික කළ යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සියළු දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික, සිවිල් හා අනෙකුත් සියළු අවකාශ තුළ පිරිමින් හා සමාන සහ සාධාරණ පදනමින් කාන්තාවන් විසින් සියළු මානව හිමිකම් හා මූලික නිදහස නීතිප්‍රකාරව සහ තත්ත්වාකාරයෙන් භුක්ති විඳීනු ලබන බවට වගබලා ගත යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීමේ අරමුණින් නීති පද්ධති ශක්තිමත් කිරීම ඇතුළුව කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් හඳුනා ගැනීම, ඒවාට විසඳුම් සැපයීම හා සහන සැලසීම සිදු වන බවට වගබලා ගත යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන හා ආර්ථික ජීවිතය තුළ සහභාගිත්වය හා තීරණ ගැනීම කරා කාන්තාවන්ට සමාන සහ සාධාරණ ප්‍රවේශය සහතික කළ යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සෞඛ්‍ය ආරක්ෂණය, සියළු මට්ටම්වලදී ගුණාත්මක අධ්‍යාපනය, රැකියා හා වෘත්තීය මාර්ගෝපදේශනය, රැකියා නියුක්තිය, සමාන වේතනය, වෘත්තීයමය සෞඛ්‍යය හා ආරක්ෂාව, සමාජ ආරක්ෂාව සහ රාජ්‍ය තනතුරු කරා කාන්තාවන්ට සමාන සහ සාධාරණ ප්‍රවේශය සහතික කළ යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, පිරිමින් හා කාන්තාවන් යන දෙපාර්ශ්වයේම සක්‍රිය සහභාගිත්වය තුලින් වෙනස් කොට සලකන, දුබල කරවන හා බැහැර කර තබන සමාජමය ආකල්ප සහ ප්‍රජා පිළිවෙත් වෙනස් කිරීම සහතික කළ යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ සංවර්ධනයෙහි සියළු ක්ෂේත්‍ර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම මූලප්‍රවාහකරණය කිරීමට වග බලා ගත යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සමාන සහ සාධාරණ ප්‍රතිලාභ සහතික කිරීම පිණිස සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ ජාතික සහ ජාත්‍යන්තර සංවර්ධන

හවුල්කරුවන් ඇතුළුව අදාල සියළු පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම සහ ශක්තිමත් කිරීම සහතික කරනු ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ආපදා සහ අනෙකුත් බාහිර කම්පන අවස්ථා වලදී කාන්තාවන්ගේ බලපෑම හා ප්‍රතිචාර හඳුනාගෙන ආපදා අවදානම් අවම කිරීමේදී හා කළමනාකරණය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම සහතික කළ යුතුය.

### අපේක්ෂිත ප්‍රතිඵලය

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සියළු මට්ටම් වලදී සියළු අංශ තුළ සහ අංශ හරහා අදාල තේමාගත ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරනු පිණිස බහු ආංශික සහයෝගිත්ව හරහා කාලානුරූපව සිදු කෙරෙන උපාය මාර්ගික මැදිහත්වීම් මගින් ප්‍රතිපත්තියෙහි දැක්ම හා වගකීම් සාක්ෂාත්කරණය සහතික කළ යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පුරුෂභාවයන් සහ ස්ත්‍රීභාවයන් ඇතුළත් කරගන්නා වූ හා කාන්තාවන්ගේ හා පිරිමින්ගේ අනන්‍යතා, මෙම අනන්‍යතා අතර සම්බන්ධතා සහ බල සබඳතා නිර්මාණය කරන හා සවිබලගන්වන ව්‍යුහමය සන්දර්භය නිර්මාණය කරන සංකල්පයක් ලෙස හඳුනාගනී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සමාන බලය බෙදීයාම වෙනුවෙන් පහසුකම් සැලසීම, පුද්ගලික, සමාජ,දේශපාලන,ආර්ථික සහ සංස්කෘතික අවකාශ තුළ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස සහ ආරක්ෂාව සහතික කිරීම, සමාන අවස්ථාවන්ට ප්‍රවේශය සහ සමාන ප්‍රතිලාභ, ප්‍රතිඵල සහ ප්‍රතිවිපාක සහතික කිරීම තහවුරු කිරීම ආදිය කෙරෙහි පුළුල් අවධානය යොමුකර ඇති.

# සියළු ක්ෂේත්‍ර ආවරණය කරන මූලධර්ම

## ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ වෙනස්කොට සැලකීමෙන් වැළකීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අන්තගර්තව ඇති සැමට සමානාත්මතාව යන මූලික ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර ප්‍රඥප්ති හා ගිවිසුම් වෙත ඇති බැඳීම් සහ ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව තිබෙන අතර හිමිකම්වල සමානාත්මතාව සහ මානව අභිමානය කෙරෙහි ගෞරවය යන පුළුල් රාමුව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හඳුනාගනී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, කාන්තාවන්, පිරිමින් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර වල සමානාත්මතා පදනමින් සියළු තැනැත්තන් මූලික මිනිස් අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිලාභ භුක්ති විඳින බව සහතික කිරීම පිණිස සියළු ක්ෂේත්‍රවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහගත කිරීම සහ කාන්තාවන්, ගැහැණු ළමුන්, ආන්තීකරණයට ලක්වූ පිරිමින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සහ ද්විමය නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා ඇත්තවුන් සියළු ක්ෂේත්‍ර තුළ සවිබලගැන්වීම හා ඔවුන්ගේ අභිවෘද්ධිය සඳහා උපායමාර්ග සැකසීම යන ද්විත්ව ප්‍රවේශය හරහා සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සමානාත්මතා මූලධර්මය, වෙනස් ආකාරයෙන් නොසැලකීමේ මූලධර්මය සහ රාජ්‍ය බැඳීම් මූලධර්මය යන මූලධර්ම වලට බැඳී සිටින අතර සමාන හඬ, සමාන සහභාගිත්වය සහ සියළු කාන්තාවන්ගේ, පිරිමින්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර වල නියෝජනය පිළිබඳව සංකල්පමය ස්ථාවරයක් ගනී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි දැක්ම වන්නේ සියල්ලන්ටම ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව, සමාන අවස්ථා සහ සාධාරණ යුක්තිය වෙනුවෙන් විධිවිධාන සලස්වන හා ඒවා සහතික කරන රටක් නිර්මාණය කිරීමයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි මෙහෙවර වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සහ සියළු කාන්තාවන්, පිරිමින්, ගැහැණු ළමුන්, පිරිමි ළමුන් හා ද්විමය නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහිත ජනතාව සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම් වලින් ආරක්ෂා වන බව සහතික කිරීමයි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, කඩිනමින් සාක්ෂාත් කරගත යුතු අරමුණු (2023-2025), අතරමැදි අරමුණු (2026-2030) සහ දිගුකාලීන අරමුණු (2023-2033) සහිතව පහත සඳහන් දේ සහතික කිරීම සඳහා 2023-2033 දක්වා වසර දහයක් (10) වෙනුවෙන් ප්‍රතිපත්ති බැඳීම් වෙනුවෙන් රාමුවක් සපයයි:

# ප්‍රතිපත්ති බැඳීම්

- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සහතික කිරීම සඳහා රජයේ බැඳීම සාක්ෂාත්කරණය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීමට අදාලව සැලකිල්ලට ගත යුතු කරුණු, ප්‍රමිති සහ සම්මතයන් ජාතික ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති වල සියළු අංශ තුළට සඵලදායක ලෙස සමෝධානය කිරීම
- නීති, ප්‍රතිපත්ති, වැඩසටහන්, ආයතන සහ ප්‍රජාවන් ශක්තිමත් කිරීම මගින් කාන්තාවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතර කණ්ඩායම් වලට එරෙහි සියළු ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීම
- පාලන ආයතන ඇතුළුව සමාජ, සංස්කෘතික, දේශපාලන සහ ආර්ථික අවකාශ තුළ කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම

- ස්ත්‍රී පුරුෂ සමාජභාව ඒකාකෘතිකරණය තුරන් කිරීමට අදාලව වෙනස් කොට සලකන ආකාරයේ සමාජමය ආකල්ප, චර්යාවන් හා වටිනාකම් පරිවර්තනයට ලක් කිරීම
- කාන්තාවන්ගේ තත්ත්වයේ අභිවෘද්ධිය මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අත්කරගැනීම වෙනුවෙන් ආයතනික රාමු ශක්තිමත් කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රධාන තේමාගත ක්ෂේත්‍ර 8 ක් යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

1 වැනි තේමාගත ක්ෂේත්‍රය: අනන්‍යතාව සහ ස්වාධීනත්වය

2 වැනි තේමාගත ක්ෂේත්‍රය: ආර්ථික සවිබලගැන්වීම සහ ඵලදායී රැකියා නියුක්තිය

3 වැනි තේමාගත ක්ෂේත්‍රය: සමාජ සමානාත්මතාව සහ සවිබලගැන්වීම

4 වැනි තේමාගත ක්ෂේත්‍රය: පරිසරය සහ ආපදා කළමනාකරණය

5 වැනි තේමාගත ක්ෂේත්‍රය: තීරණ ගැනීමේදී සමානාත්මතාව

6 වැනි තේමාගත ක්ෂේත්‍රය: යුක්තිය සහ සාමය හා ආරක්ෂාව කරා ප්‍රවේශය

7 වැනි තේමාගත ක්ෂේත්‍රය: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස

8 වැනි තේමාගත ක්ෂේත්‍රය: ළමයින් -ගැහැණු ළමයා පිළිබඳ විශේෂ අවධානය සහිතව

ඇමුණුම: තේමාගත ක්ෂේත්‍ර වල සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, වියපත් කාන්තාවන්, ආබාධිත තත්ත්ව සමඟ දිවි ගෙවන කාන්තාවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතර කාන්තාවන් සහ ද්විමය නොවන අනන්‍යතා සහිත කාන්තාවන්, සියළු වෛවාහික තත්ත්වයන්හි කාන්තාවන් සහ ගෘහමූලික කාන්තාවන් විසින් මුහුණ දෙනු ලබන විශේෂ අවාසි ඇතුළුව ස්ත්‍රී පුරුෂ සමාජභාවී දෘෂ්ටිකෝණය සැලකිල්ලට ගන්නා අතර එබඳු සියළු කණ්ඩායම් වල ගැටළු තේමාගත ක්ෂේත්‍ර තුළට මූලප්‍රවාහකරණය කරයි.

**කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වයට සහ ආර්ථික අර්බුදයට ප්‍රතිචාර දැක්වීම :** කාන්තාවන් සහ ගැහැණු ළමුන් සහ ආබාධිත තැනැත්තන් සහ අන්ත දරිද්‍රතාවයෙන් පෙලෙන්නන් වැනි අනෙකුත් ආන්තිකකරණය වූ කණ්ඩායම් විසින් මුහුණ දෙනු ලබන දැනට පවතින අසමානතා තවදුරටත් තීව්‍ර කරමින් ආපදා තත්ත්වයන් කාන්තාවන්ට හා පිරිමින්ට වෙනස් ආකාරයෙන් බලපායි. කෝවිඩ් 19 ගෝලීය වසංගතය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය (2022) මානව හිමිකම් මත බරපතල බලපෑමක් ඇති කර තිබේ. ආහාර හා සෞඛ්‍ය ආරක්ෂණයට, අධ්‍යාපනයට හා මිනිසුන්ගේ ජීවිතවල අනෙකුත් ක්ෂේත්‍රවලට බාධා ඇති වීම, කණස්සල්ල, විශාදය, ලෙඩ රෝග, ළමුන්, ගැබිණි මව්වරුන් සහ කිරි දෙන මව්වරුන් ඇතුළු සියල්ලන්ගේ මන්දපෝෂණය සහ නිවසට කොටු වී සිටින දීර්ඝ කාලපරිච්ඡේද වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි, විශේෂයෙන්ම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙහි වැඩිවීම යන ආකාර වලින් මිනිසුන්ගේ ජීවිත වලට දැඩි බලපෑම් ඇති කර තිබෙන අතර සියළු ජනතාවගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය තුළ වහ වහා විසඳුම් සැපයීම අවශ්‍ය බහුවිධ ගැටළු නිර්මාණය කර තිබේ.

## 01 වැනි තේමාගත ක්ෂේත්‍රය: අනන්‍යතාව සහ ස්වාධීනත්වය

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- කාන්තාවන්ගේ අනන්‍යතාව සහ ස්වාධීනත්වය කෙරෙහි බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිකරණය, සංස්කෘතික සහ ආගමික ප්‍රාග් විනිශ්චයන් සහ ආයතනගත වෙනස් කොට සැලකීම අවසන් කිරීම
- පුරවැසිභාවයට හා ජාතිකත්වයට සමාන අයිතිවාසිකම් ලබා දීම

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිකරණය සහ සංස්කෘතික හා ආගමික ප්‍රාග් විනිශ්චයන් සහ නීති සහ පරිපාලනමය පිළිවෙත් හරහා ඒවා ආයතනගත කිරීම හේතුවෙන් කාන්තාවන් සහ ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය විසින් මුහුණ දෙනු ලබන වෙනස් කොට සැලකීම වැළැක්වීම සහතික කිරීම.
- ජාතිකත්වය අත්කරගැනීමට, වෙනස් කිරීමට හා රඳවා ගැනීමට, දරුවන්ට ජාතිකත්වය පවරා දීමට හා ඡන්ද බලය ක්‍රියාවේ යෙදවීමට නිදහස සඳහා කාන්තාවන්ට සමාන අයිතිවාසිකම් හිමි වන බවට වග බලා ගැනීම.

### උපාය මාර්ග

1. කාන්තාවන්ගේ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයේ සමානාත්මතාව කරා පරිවර්තනීය වෙනසක් වෙනුවෙන් අසාධාරණ ස්ත්‍රී පුරුෂ සමාජභාව මතවාද සහ පීතෘ මූලික විශ්වාස පිළිබඳව දැනුවත් බව ඇති කිරීම.
2. කාන්තාවන්ට සමානාත්මතාව ලබා නොදෙන හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර කණ්ඩායම් වලට එරෙහිව වෙනස් කොට සලකන අසාධාරණ නීති වෙනස් කිරීමට නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.
3. කාන්තාවන් හා පිරිමින් විසින් වෛවාහික හවුල්කරුවන්ට ජාතිකත්වය පැවරීමට හැකි වන පරිදි පරිපාලනමය ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීම.

## 2 වැනි තේමාගත ක්ෂේත්‍රය: ආර්ථික සවිබලගැන්වීම සහ ඵලදායී රැකියා නියුක්තිය

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- පිරිමින්, කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර කණ්ඩායම් රටේ ආර්ථික සංවර්ධනයෙහි සමාන සහභාගිත්වය සහ ආර්ථික නිරතවීම හා සවිබලගැන්වීම වෙතින් සාධාරණ ප්‍රතිලාභ සමානව භුක්ති විඳීම සහතික කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- විධිමත් රැකියා නියුක්ති අංශය තුල කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සහ අවිධිමත් අංශය තුළ වැඩ කරන කාන්තාවන්ගේ දායකත්වය හඳුනා ගැනීම.
- වතු, විගමනික ගෘහස්ථ හා නිවෙස් පාදක සේවකයන් ඇතුළුව විධිමත් හා අවිධිමත් රැකියා නියුක්ති ක්ෂේත්‍ර තුළ සියළු කාන්තාවන්ට හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයට සමාන අවස්ථා සහ ප්‍රතිලාභ, නෛතික සුරක්ෂිතතාවය, පුහුණුව, කුසලතා සංවර්ධනය සහ ඩිජිටල් නවෝත්පාදනය කරා ප්‍රවේශය, විශේෂ ආරක්ෂාවන් සහ සමාජ ආරක්ෂණය කරා ප්‍රවේශය සහතික කිරීම.

### උපාය මාර්ග

1. ජාතික සුනිසි රැකියා ප්‍රතිපත්තිය ඇතුළුව සියළු ශ්‍රමය හා සබැදි ප්‍රතිපත්ති වල ඇතුළත්ව ඇති සියළු ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
2. කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සියළු ආකාරයේ වෙනස් කොට සැලකිම් වලට විසඳුම් සැපයීම සඳහා අධීක්ෂණය, දුක්ගැනවිලි සහන හා ප්‍රතිකාර්මික යාන්ත්‍රණ ඇති කිරීම.
3. ශ්‍රී ලංකාවේ අවිධිමත් ආර්ථිකය තුළ සිටින සේවකයන් හා විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් නීති සම්මත කර එහි ප්‍රතිඵලයක් ලෙස නෛතික ආරක්ෂාව හා අයිතිවාසිකම් ආරක්ෂාව ඇති කිරීම.
4. ශ්‍රම හා රැකියා නියුක්ති අයිතිවාසිකම් සහ සේවා ස්ථානයේදී කාන්තාවන්ට එරෙහිව වෙනස් කොට සලකන අසාධාරණ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය මතවාද සහ පීතෘ මූලික විශ්වාස හා ආකල්ප වෙනස් කිරීමට මග පාදන ක්‍රියා වෙනුවෙන් කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරය අතර නීතිය පිළිබඳ දැනුවත් බව ඇති කිරීම.
5. ආර්ථිකයට දායකත්වය මත මුදල්මය වටිනාකමක් රඳවමින්, අවිධිමත් අංශයේ වැඩ ඵලදායී වැඩ ලෙස ඇතුලත් කිරීමට ජාතික දත්ත සහ සංඛ්‍යාලේඛන වැඩි දියුණු කිරීම.

# 3 වැනි තේමාගත ක්ෂේත්‍රය: සමාජ සමානාත්මතාව සහ සවිබලගැන්වීම

## 3.1 අධ්‍යාපනය

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- කාන්තාවන්ට හා ළමුන්ට වැඩිහිටි අධ්‍යාපනය ඇතුළු අධ්‍යාපනය කරා සමාන, සාධාරණ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේදී ප්‍රවේශය සහතික කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා සියළු අංශවල වෘත්තිය අධ්‍යාපනයේ ආයතනික යාන්ත්‍රණ, විෂයමාලා හා ඉගැන්වීම ස්ත්‍රී පුරුෂ සමාජභාව සංවේදී වූ අධ්‍යාපන ක්‍රමයක් සහතික කිරීම.
- කාන්තාවන් වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සහතික කිරීම.
- කාන්තාවන්ට වැඩිහිටි අධ්‍යාපනය කරා ප්‍රවේශය සහතික කිරීම.
- දරිද්‍රතාව, භූගෝලීය පිහිටීම, වාර්ගිකත්වය, ආගම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතිකරණය හේතුවෙන් කාන්තාවන් විසින් මුහුණ දෙනු ලබන අවාසි තුරන් කෙරෙන බව සහතික කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ කොටසක් ලෙස පරිපූර්ණ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය ඇතුලත් කිරීම සහතික කිරීම.

### උපාය මාර්ග

1. සාමාන්‍ය අධ්‍යාපන අංශ සංවර්ධන සැලැස්ම (2020-2025) සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාල තක්සේරුවක් සිදු කර, සම්පත් සපයා ක්‍රියාත්මක කිරීම.
2. වැඩිහිටි අධ්‍යාපනය,වෘත්තීය අධ්‍යාපනය සහ පරිපූර්ණ ලිංගික සෞඛ්‍ය අධ්‍යාපනය වෙනුවෙන් වර්තමාන විෂයමාලා ඇතුළුව සමාජය තුළ ඒකාකෘතිකරණය වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් සහ ආකල්ප වෙනස් කරන අංශ සක්‍රියව අන්තර්ගත කරගැනීම පිණිස පෙළපොත් සහ ඉගැන්වීමේ ක්‍රම ඇතුළුව අධ්‍යාපන විෂයමාලා පිළිබඳව ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතා සමාලෝචනයක් සිදු කිරීම.
3. සියල්ලන්ට වැඩිහිටි ඉගෙනුම ප්‍රවර්ධනය කරන සක්‍රිය ක්‍රියාමාර්ග හරහා කාන්තාවන්ට හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට ප්‍රවේශය වැඩි කිරීම සඳහා කෘත්‍යාත්මක සාක්ෂරතා මධ්‍යස්ථාන, ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සමාලෝචනය කිරීම.

## 3.2 සෞඛ්‍යය

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- සියළු කාන්තාවන්ගේ ජීවන චක්‍රය මුළුල්ලේම ශාරීරික, මානසික, පෝෂණ හා ප්‍රජනන සෞඛ්‍යය සහතික කිරීම සඳහා වැළැක්වීමේ හා සුව කිරීමේ සේවා ඇතුළුව ලබා ගත හැකි ඉහළම ප්‍රමිතියේ සෞඛ්‍ය ආරක්ෂණ තොරතුරු සහ සේවා කරා සෑම තැනකදීම ප්‍රවේශය ලබා දීම.
- තම ප්‍රජනන හැකියාව හා ශාරීරික ඒකාග්‍රතාව පාලනය කිරීමට කාන්තාවන්ට අයිතිය ලබා දීම.
- බලහත්කාරයෙන්, වෙනස් කොට සැලකීමෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් තොරව සියළු තැනැත්තන්ට ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය අයිතිවාසිකම් ලබා දීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ප්‍රජනන සෞඛ්‍ය සේවා, මානසික සෞඛ්‍ය සේවා හා බෝවන සහ බෝ නොවන රෝග වලට විසඳුම් සැපයීම සඳහා සේවාව ඇතුළුව සෞඛ්‍ය ආරක්ෂණ තොරතුරු සහ සේවා කරා සෑම තැනකදීම ප්‍රවේශය සහතික කිරීම.
- සංකීර්ණ සහ විකාශය වන සමාජ සම්මතයන් සහ නැගී එන අභියෝග සැලකිල්ලට ගනිමින් කාන්තාවන්ගේ ජීවිතයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා සමස්ත සෞඛ්‍යය හා යහපැවැත්ම වැඩි දියුණු කිරීමේ සියළු ආකාරයේ මැදිහත් වීම් සහතික කිරීම.

### උපාය මාර්ග

1. පිරිමින් සහ කාන්තාවන් කෙරෙහි සමානව කේන්ද්‍රගත වන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන්ගේ, පවුල්වල සහ කුටුම්භවල යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේදී පිරිමින්ගේ සම්බන්ධ වීම සහතික කරන ජීවනචක්‍ර ප්‍රවේශයක් සහතික කිරීම සඳහා සෞඛ්‍ය ප්‍රතිපත්ති සහ පවුල් ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම.
2. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සෞඛ්‍ය සේවා කරා ප්‍රවේශ වීමේ වැදගත්කම සහ එහිදී පවතින සීමාකාරී සාධක හඳුනා ගන්නා සෞඛ්‍ය ප්‍රතිපත්ති හඳුන්වා දී සංවේදී සෞඛ්‍ය සේවා කරා සැමට ප්‍රවේශය සහතික කිරීම සඳහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
3. මානසික, ශාරීරික සහ සමාජීය යහපැවැත්ම තහවුරු කිරීම සඳහා කාන්තාවන්ට සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට, විනෝදාස්වාදයට, විවේකයට හා සමස්ත යහ පැවැත්මට අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
4. අධ්‍යාපනය, සෞඛ්‍යය, ආබාධිත තත්ත්වය හා රැකියා ආමන්ත්‍රණය කරන ජාතික උපාය මාර්ග සහ වැඩසටහන් තුළට, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාලව සැලකිලිමත් විය යුතු කරුණු හා ප්‍රජනන සෞඛ්‍යය හා අයිතිවාසිකම් සමෝධානය කිරීම.
5. විද්‍යාත්මකව නිවැරදි, වයසට ගැලපෙන, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ සංස්කෘතිය කෙරෙහි සංවේදී ආකාරයෙන් ලිංගික ප්‍රජනන සෞඛ්‍යය අයිතිවාසිකම් අධ්‍යාපනය, තොරතුරු සහ සේවා කරා සෑම අයෙකුටම සෑම තැනකදීම ප්‍රවේශය සහතික කිරීමට ආධාරක යාන්ත්‍රණ නිර්මාණය කිරීම.
6. කාන්තාවන්ගේ ශාරීරික ඒකාග්‍රතාවයට ඔවුනට ඇති අයිතිය හා ඔවුන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අයිතිවාසිකම් සහතික කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම. ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීම / කැපීම වැනි හානිකර පිළිවෙත් තහනම් කිරීම සහ ගැබිණි කාන්තාවන් ජීවිතයට තර්ජනයක් ඇති අවස්ථාවලදී පමණක් නොව, සියළු ස්ත්‍රී දූෂණ, ව්‍යභිචාර සහ කලලයට දැඩි ලෙස හානි වීම සිදුව ඇති අවස්ථාවලදී වෛද්‍ය අධීක්ෂණ යටතේ ආරක්ෂා සහිත නිත්‍යානුකූල ගබ්සා කිරීම් කරා ප්‍රවේශයට ඉඩ සලසමින් ගබ්සා කිරීම අපරාධ වරදක් නොවන ලෙස වෙනස් කිරීම.
7. සියළු වයස් වලට අයත් කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සඳහා ශාරීරික හා මානසික සෞඛ්‍යය අංශ ප්‍රතිචාර ශක්තිමත් කිරීම.

8. වියපත් වන කාන්තාවන්ගේ ගැටළු වලට ප්‍රතිචාර දැක්වීම පිණිස දිගුකාලීන රැක බලා ගැනීම, වේදනා සැහැල්ලු කරවන ප්‍රතිකාර, මානසික සෞඛ්‍ය සේවා හා මනෝ විද්‍යාත්මක සහාය වෙනුවෙන් සමාජ ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම.
9. පෝෂණ ගැටළු, බෝවන හා බෝ නොවන රෝග ඇතුළු සෞඛ්‍ය ගැටළු වලට විසඳුම් සැපයීමේදී බහු ආංශික සහභාගීත්වය සහතික කිරීම.
10. ජනගහනයේ සෞඛ්‍යය හා යහපැවැත්ම මත සෘණාත්මක ලෙස බලපාන හානිකර ස්ත්‍රී පුරුෂ සමාජභාවී හා සමාජ සම්මතයන් ඉවත් කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම.

## 3.3 මූලික අවශ්‍යතා

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- ජීවිතය පූර්ණ හා සඵලදායක ලෙස විඳීම වෙනුවෙන් මූලික අවශ්‍යතාවලට ඇති අයිතිය තහවුරු කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාමාර්ග සහතික කිරීම
- ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම
- පිරිසිදු ජලය සහ ප්‍රශස්ත මට්ටමේ සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව කරා ප්‍රවේශය සහතික කිරීම
- ප්‍රමාණවත් නිවාස සහතික කිරීම හා ඉඩම් හිමිකාරිත්වය හා ඉඩම් නොමැතිකම ඇතුළු ඉඩම් ගැටළුවලට විසඳුම් සැපයීම

### උපාය මාර්ග

### දරිද්‍රතාව

1. දේශපාලන අනුග්‍රහයෙන් තොරව සියළු කාන්තාවන්, පිරිමින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට සමානාත්මතාව සහතික කිරීම සඳහා රජයේ දරිද්‍රතාව තුරන් කිරීමේ ප්‍රතිපත්තිය සමාලෝචනය කර සකස් කිරීම.
2. තත්ත්වය විශ්ලේෂණය කර දුගී කාන්තාවන්ගේ, පිරිමින්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයේ අවශ්‍යතා වලට ප්‍රතිචාර දැක්වීමට රජයේ ධාරිතාව ශක්තිමත් කිරීම.
3. දරිද්‍රතාව තුරන් කිරීමේ සහ දරිද්‍රතාව අඩු කිරීමේ වැඩසටහන් කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය මත ඇති කරන බලපෑම සම්බන්ධයෙන් අධීක්ෂණ සහ ඇගයීම් දත්ත රැස් කිරීමේ රජයේ ප්‍රයත්නයන්ට සහාය වීම.
4. ආදායම් මට්ටම් වැඩි කිරීම සඳහා කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයට, විශේෂයෙන්ම දැනටමත් කෘෂිකර්මයෙහි නිරත ග්‍රාමීය කාන්තාවන්, නාගරික දිළිඳු ප්‍රදේශවල ජීවත්වන කාන්තාවන් සහ තෝරාගත් රැකියා හා ආදායම් උත්පාදිත ක්ෂේත්‍රවලට නියම කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරය වෙනුවෙන් ස්වයං රැකියා යෝජනා ක්‍රම සකස් කිරීම ප්‍රවර්ධනය කිරීම.
5. කාන්තාවන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයේ මූල්‍ය සාක්ෂරතාව වැඩි දියුණු කිරීමට මුලපිරීම සමඟ ණය කරා ප්‍රවේශ වීමට හැකියාව ලබා දීම.

### ආහාර සුරක්ෂිතතාව

1. විශේෂයෙන්ම ආර්ථික අර්බුද අතරතුරදී තීරණ ගැනීම, ප්‍රතිලාභ කරා ප්‍රවේශය සහ රජයේ ආහාර සුරක්ෂිතතා වැඩසටහන් තුළ සමාන හා සාධාරණ සහභාගිත්වය අනුව කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය ප්‍රධාන ප්‍රවාහගත කිරීම.

### ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව

1. ජාතික පානීය ජල ප්‍රතිපත්තිය, ජාතික සනීපාරක්ෂා ප්‍රතිපත්තිය සහ ග්‍රාමීය ජල සම්පාදන සහ සනීපාරක්ෂා ප්‍රතිපත්තිය වැනි අංශවල විශේෂිත උපායමාර්ගික ලේඛන සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාව සහ සමාජ අන්තර්කරණ විශ්ලේෂණයක් සිදු කිරීම සහ කාන්තාවන් හා බැහැර කරන ලද ප්‍රජාවන් උපාය මාර්ගික ප්‍රධාන ප්‍රවාහගත කිරීම සහතික කිරීම සඳහා තාක්ෂණික මඟපෙන්වීම සැපයීම.

**වාසස්ථාන - නිවාස සහ ඉඩම් නොමැතිකම**

1. ජාතික නිවාස ප්‍රතිපත්තියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සහ සමාජ අන්තර්කරණ විශ්ලේෂණයක් සිදු කිරීම සහ තීරණ ගන්නා මට්ටමේදී ඇතුළුව සියළු මට්ටම් වලදී කාන්තාවන් සහ බැහැර කරන ලද ප්‍රජාවන් ඇතුළත් කිරීමට උපායමාර්ගික නිර්දේශ ලබා දීම.

2. පසුගාමී අංශ හඳුනාගෙන, ඉඩම් හා නිවාස හිමිකාරිත්වයට ප්‍රවේශය හා සුහිසි ජීවන තත්ත්වය හා සබැඳි සේවා කරා ප්‍රවේශය, පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව කරා ප්‍රවේශය සහ ඉඩම් හා නිවාස හිමිකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා ණය කරා ප්‍රවේශය සියළු ආන්තීකරණයට ලක් වන ප්‍රජාවන් වෙත සහතික කිරීම

## 3.4 මාධ්‍ය

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- මාධ්‍ය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ වල කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය හා ඒ කරා ප්‍රවේශය සඳහා මෙන්ම ඒවායේ බලපෑම සඳහා අවස්ථාව සැපයීම හා කාන්තාවන්, ගැහැණු ළමුන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර සවිබලගැන්වීමේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙවලමක් ලෙස යොදා ගැනීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- සියළු ආකාරයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන සුළු මාධ්‍ය සමානව අත්විඳීම සහතික කිරීම.
- රැකියා සහ ආයතන ඇතුළුව මාධ්‍ය තුළ කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය සහ සක්‍රිය නිරතවීම ප්‍රවර්ධනය කිරීම.

### උපාය මාර්ග

1. සියළු ආකාරයේ මාධ්‍ය තුළ කාන්තාවගේ හඬ හා සහභාගිත්වය වැඩි කිරීම පිණිස සාකල්‍ය ප්‍රවේශයක් ගන්නා කාන්තාවන් ඒකාකෘතිකරණය හා සූරාකෑම වෙනුවෙන් විසඳුම් සපයන සහ මාධ්‍ය තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සඳහා විධිමත් උපාය මාර්ග නිර්මාණය කරන, කාන්තාව සහ මාධ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ මාධ්‍ය හා පුවත්පත් කලාව වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය වෙනුවෙන් ප්‍රඥප්තිය (2006 දී සම්මත කරන ලද) කාන්තාව සහ මාධ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට ඇමුණුමක් ලෙස සංශෝධනය කර ක්‍රියාත්මක කිරීම.

3. සමාන සක්‍රිය සහභාගිවන්නන් ලෙස ප්‍රධාන ප්‍රවාහ මාධ්‍ය හා සමාජ මාධ්‍ය වෙත කාන්තාවන්ගේ ප්‍රවේශය වැඩි කිරීම, පුහුණුව සහ තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග තුළින් වැඩිදියුණු කිරීම.
4. පර්යේෂණ මගින් මෙහෙයවෙන සාක්ෂි පාදක කරගත් විෂයමාලා සංවර්ධනය, විශේෂඥ තාක්ෂණික මගපෙන්වීම අධ්‍යාපන ආයතන සහ කාන්තා සංවිධාන ඇතුළු රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් සමග සහයෝගීත්ව හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳව සමාජ මාධ්‍ය වෙනුවෙන් පුළුල් ප්‍රවේශය සහිත සංවේදීකරණ වැඩසටහන් සියළු මාධ්‍ය ආයතන වෙත සිදුකිරීම.
5. ඩිජිටල් මාධ්‍ය වෙනුවෙන් තාක්ෂණය ඇතුළුව මාධ්‍ය තුළ වෘත්තීය කුසලතා පුහුණුව හරහා ග්‍රාමීය සහ නාගරික කාන්තාවන් වෙනුවෙන් මාධ්‍ය ක්ෂේත්‍රය කරා ප්‍රවේශය ලබා දීම. සියළු මාධ්‍ය වේදිකාවන්හි කාන්තාවන් සමානව නිරූපණය සහතික කිරීම පිණිස නෛතික සාක්ෂරතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආචාර ධර්ම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී භාෂාව පිළිබඳව සියළු මාධ්‍යවේදීන්ට අනිවාර්ය සහ නිරන්තර පුහුණුව, මාධ්‍ය වාර්තාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට නොසැලකීම නිරීක්ෂණය පිණිස කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිරීක්ෂණ යාන්ත්‍රණයක් පිහිටුවීම/ශක්තිමත් කිරීම.
6. සියලු මාධ්‍ය පසුතලයන්/වේදිකාවන් තුළ කාන්තාවන් සමානාත්ම පදනමකින් පිලිබිඹු කිරීම සහතික කිරීම සඳහා නෛතික සාක්ෂරතාව, ස්ත්‍රි පුරුෂ සමාජභාවීය ආචාර ධර්ම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් ප්‍රතිචාර දක්වන භාෂාව පිළිබඳව සියලු මාධ්‍ය නිලධාරීන් සඳහා වන අනිවාර්ය සහ විධිමත් පුහුණුව.
7. මාධ්‍ය වාර්තාකරණය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වෙනස්කොට සැලකීම් සිදුවන්නේද යන්න අධීක්ෂණය කිරීම සඳහා ජාතික කාන්තා කමිටුව තුළ මාධ්‍ය පිළිබඳ සුපරීක්ෂාකාරීව පසුවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම / සවිමත් කිරීම.
8. දැන්වීම් වෙනුවෙන් යොදා ගැනෙන සියළු අවස්ථා වලදී කාන්තාවන්ගේ සහ ගැහැණු ළමුන්ගේ අභිමානය සුරැකෙන දැන්වීම් කර්මාන්තයේ අනුකූලතාව සහතික කිරීමට යාන්ත්‍රණය සකස් කිරීම.
9. මාර්ගගත මාධ්‍යයන් ඔස්සේ කාන්තාවන් හිංසනයට භාජනය කිරීමට දැඩි දඬුවම් ලබාදිම, ව්‍යාජ මාර්ගගත ගිණුම් සහ පුද්ගලයන් අතර හුවමාරුකරන ඡායාරූප, memes , විද්‍යුත් තැපැල් පණිවුඩ ආදිය අනවසරයෙන් මාර්ගගතව හෙළි කිරීම සහ හුවමාරුකිරීම අපරාධ වරදක් බවට පත් කිරීම සමඟ කාන්තාවන්ගේ සයිබර් ආරක්ෂාව සහතික කරන නීති ඇතිකිරීම
10. කාන්තාවන්ට එරෙහි සයිබර් අවකාශය හරහා සිදු වන හිංසන වාර්තා කිරීමට සහ එයට ශක්තිමත්ව ප්‍රතිචාර දැක්වීමට අදාල නියෝජිත ආයතන (උදා.ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය) ශක්තිමත් කිරීම.
11. රහස්‍යභාවය, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සහ වාර්ගිකත්වය, පංතිය සහ ලිංගික නැඹුරුව මත පදනම්ව කාන්තාවන්ට වෙනස් කොට නොසැලකීම වැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවී ආචාර ධර්ම පිළිබඳව සයිබර් අපරාධ විමර්ශන නියෝජිත ආයතන වලට මාර්ගෝපදේශ සකස්කිරීම
12. කාන්තාවන් වෙනුවෙන් සයිබර් ආරක්ෂාව, පුරවැසි අයිතිවාසිකම් සහ සයිබර් අවකාශය හරහා හානියක් සිදු වුවහොත් සහන සැලසීමේ යාන්ත්‍රණ සම්බන්ධයෙන් මහජන දැනුවත්බව ප්‍රවර්ධනය කිරීමට මාධ්‍ය යොදා ගැනීම.

# 04 වැනි තේමාගත ක්ෂේත්‍රය: පරිසරය සහ ආපදා කළමනාකරණය

## ප්‍රතිපත්තියෙහි බැඳීම්

- පරිසරය ආරක්ෂා කිරීමේදී හා කළමනාකරණය කිරීමේදී කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයේ හඬට හා පූර්ණ සහභාගිත්වයට අවස්ථාව සැලසීම.

## ප්‍රතිපත්තියෙහි අරමුණු

- ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන ආකාරයට පරිසර කළමනාකරණය, ආපදා කළමනාකරණය සහ දේශගුණ ක්‍රියාමාර්ග සහතික කිරීම.
- පරිසරය හා සබැඳි සියලු අංශවල කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයෙහි පූර්ණ හා සක්‍රිය සහභාගිත්වය සහතික කිරීම.

## උපාය මාර්ග

1. තීරණ ගැනීමේ මට්ටම් ඇතුළු සියළු මට්ටම් වලදී හඬ හා පූර්ණ නිරතවීම සහතික කරමින් පරිසර කළමනාකරණය, දේශගුණික ක්‍රියාමාර්ග සහ බලශක්ති කළමනාකරණය පිළිබඳ සියළු ප්‍රතිපත්ති, ක්‍රියාකාරී සැලසුම් සහ මුල පිරීම් වලට කාන්තාවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සහ අනෙකුත් ආන්තිකකරණයට ලක්වූ කණ්ඩායම් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ජාතික සැලැස්මක් සකස් කිරීම.
2. සැලසුම් කිරීම සහ පාරිසරික සංරක්ෂණ උපායමාර්ග, ආපදා කළමනාකරණය, අවදානම අඩු කිරීම, පුනරුත්ථාපනය සහ ප්‍රතිචාර දැක්වීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය ඇතුළුව පාරිසරික ගැටළු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ සියළු මට්ටම් වලදී කාන්තා සහභාගිත්වය සහතික කිරීම.
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන දේශගුණ අනුවර්තන සහ බලපෑම් සමනය කිරීමේ ප්‍රතිපත්ති සමෝධානය කිරීම සහ ස්වාභාවික ආපදා වැනි දේශගුණය හා සබැඳි සිදුවීම් වලින් කාන්තාවන්ගේ ජීවනෝපාය මත සිදුවන බලපෑම සහ දේශගුණික අනුවර්තනය යන කරුණු සැලකිල්ලට ගන්නා බවට වග බලා ගැනීම.
4. පවතින සහ ඉදිරියේදී ඇතිවන දේශගුණ මූල්‍ය යාන්ත්‍රණ සියළු මට්ටම් වල කාන්තාවන්ට සමාන ප්‍රතිලාභ ලබා දීම සහතික කිරීම.
5. ස්වාභාවික ආපදාවලට සූදානම් සහිත බව, ප්‍රතිචාර දැක්වීම සහ ඒවායින් යථා තත්ත්වයට පැමිණීම අතරතුරදී කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර ශක්තිමත් කිරීම.
6. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී සංරක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ඉඩම්, වනාන්තර සහ ජෛව විවිධත්ව කළමනාකරණය සම්බන්ධයෙන් තීරණ වලදී කාන්තාවන්ගේ සමාන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.
7. සංරක්ෂණය සහ පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතය කාන්තාවන්ගේ ආර්ථික සංවර්ධනය සමඟ සම්බන්ධ කරන උපායමාර්ග සැකසීම.
8. ධීවර අංශය තුළ කාන්තා සහභාගිත්වය ශක්තිමත් කිරීම සහ සාගර සහ වෙරළ සංරක්ෂණය වෙනුවෙන් ඔවුන්ගේ දැනුම සහ කුසලතා යොදා ගැනීම.

## 05 වැනි තේමාගත ක්ෂේත්‍රය: තීරණ ගැනීමේදී සමානාත්මතාව

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- දේශපාලන, ආර්ථික හා පොදු ජීවිතයේ තීරණ ගැනීමේ සියළු මට්ටම් වලදී නායකත්වය වෙනුවෙන් කාන්තාවන්ගේ පූර්ණ හා සඵලදායක සහභාගිත්වය සහ සමාන අවස්ථා සහතික කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

සියළු අංශවල තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ සමාන නියෝජනය වෙනුවෙන් ක්‍රමානුකූල සහාය සහතික කිරීම සඳහා තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග ජාතික මට්ටමින් ගැනීම.

### උපාය මාර්ග

1. කාන්තාවන්ගේ දේශපාලන සහභාගිත්වය වැඩි කිරීම සඳහා ජාතික හා පළාත් මට්ටමේ ව්‍යවස්ථාදායක කෝටා ක්‍රමය ව්‍යාප්ත කිරීම.
2. ජන ජීවිතය තුළ පිරිමින් සහ කාන්තාවන් අතර වැඩ හා මවුපිය වගකීම් හවුලේ බෙදා ගැනීම, පිලිගැනීම හා ප්‍රවර්ධනය ඇතුළත් ඡන්දදායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළු අධ්‍යාපන වැඩසටහන් ග්‍රාමීය ප්‍රදේශ ඇතුළු රටේ සියළු ප්‍රදේශවල පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම.
3. දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ වැඩි සහභාගිත්වය වෙනුවෙන් ඇති අඩුපාඩු සහ අභියෝග හඳුනාගෙන පිළියම් යෙදීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයට ආධාර කිරීම සහ සහාය වීම.
4. පොදු ජීවිතයෙහි සියළු අංශ තුළ තීරණ ගැනීමේදී කාන්තා සහභාගිත්වය සම්බන්ධයෙන් ගුණාත්මක අධ්‍යයන සිදු කිරීම සහ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර තුළ කාන්තා සහභාගිත්වය සහ කාන්තාවන් සවිබලගැන්වීම සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩ වල සාධනීය ප්‍රතිඵල හා බලය හා තීරණ ගැනීමේ හැකියාව සහිත කාන්තාවන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම අතර පරතරයට විසඳුම් ලබා දීම.

# 06 වැනි තේමාගත ක්ෂේත්‍රය: යුක්තිය, සාමය සහ ආරක්ෂාව කරා ප්‍රවේශය

## 6.1 යුක්තිය කරා ප්‍රවේශය

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- යුක්තිය සහ ආරවුල් විසඳීම කරා සමාන හා සාධාරණ ප්‍රවේශය සහතික කිරීම

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ව්‍යවස්ථාදායක, ව්‍යුහාත්මක සහ පටිපාටිමය ප්‍රතිසංස්කරණ හරහා යුක්තිය කරා සමාන හා සාධාරණ ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම.
- කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය විසින් මුහුණ දෙනු ලබන වෙනස් කොට සැලකීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට පිළියම් යෙදීම සඳහා ඔවුනට යුක්තිය කරා ප්‍රවේශය වෙනුවෙන් සහාය සැපයීමේ සංවේදී ක්‍රම ඇති කිරීම
- අයිතිවාසිකම් හා අධිකරණමය පිළියම් සම්බන්ධයෙන් කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය අතර පුළුල් දැනුවත් බව ඇති කිරීම.

### උපාය මාර්ග

1. ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සඵලදායක ලෙස ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති කිරීම.
2. සංකීර්ණ සහ තැතිගන්වනසුලු අධිකරණ ක්‍රියාවලි හරහා ගමන් කිරීමට කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය වෙනුවෙන් යුක්තිය කරා ප්‍රවේශය වැඩි කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග නිර්මාණය කිරීම.
3. කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය වෙනුවෙන් යුක්තිය කරා අතිරේක සහ විකල්ප මාර්ග ශක්තිමත් කිරීම.
4. කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය වෙනුවෙන් යුක්තිය කරා ප්‍රවේශය පිළිබඳව නීති විද්‍යාල වල සහ විනිසුරුවරුන්, සහ නීතිඥයන් වෙනුවෙන් අඛණ්ඩ නීති අධ්‍යාපන වැඩසටහන් වල අධ්‍යාපනය සහ දැනුවත් කිරීම.
5. වාර්ගිකත්වය, ආගම, ආබාධිත තත්ත්වය, සහ පදිංචි ස්ථානය වැනි අන්තර් ආංශික තත්ත්වයන් කෙරෙහි විශේෂ අවධානය සහිතව කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය අතර නෛතික අයිතිවාසිකම් සහ යුක්තිය කරා ප්‍රවේශය පිළිබඳ දැනුවත් බව ඇති කිරීම.
6. කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයන් පිළිබඳව නිශ්චිත විධිවිධාන ඇතුළත් සිරකරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාතික සැලැස්මක් සම්මත කර ගැනීම සහ ප්‍රමාණවත් සම්පත් සහ වගවීම සහිත අධීක්ෂණය සහිතව එය ක්‍රියාත්මක කිරීම.
7. මිනිස් ජාවාරම වැළැක්වීම සහ එයට සඵලදායක ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ව්‍යවස්ථාදායක රාමුව සහ සම්මත වගකීම් ශක්තිමත් කිරීම.

## 6.2 සාමය සහ ආරක්ෂාව

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- යුද්ධය සහ ගැටුම් පවතින කාල අතරතුරදී කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සහ ආන්තිකකරණයට ලක්වූ කණ්ඩායම් සහ අවදානමට පත් පිරිමින් යන පාර්ශ්වයන්ගේ ආරක්ෂාවට විසඳුම් සපයමින් ඔවුන්ගේ ආරක්ෂාව සහ සාමය සහ ප්‍රතිසන්ධානය ගොඩනැගීමේදී ඔවුන්ගේ පූර්ණ සහභාගිත්වය සහතික කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ජාත්‍යන්තර හෝ අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් කාල වලදී මානුෂීය සම්මතයන්ට අනුව සමාන ආරක්ෂාව සහතික කිරීම.
- විධිමත් සහ අවිධිමත් සාමය ගොඩනැගීමේදී හා පශ්චාත් ගැටුම් යාන්ත්‍රණ වල සමාන නායකත්වය ප්‍රවර්ධනය කිරීම.
- ගැටුම් වැලැක්වීමේදී, සමථකරණයේදී ගැටුම් විසඳීමේදී සහ ප්‍රතිසන්ධානයේදී කාන්තාවන්ගේ කාර්යභාරය වැඩි කිරීම.

### උපාය මාර්ග

1. ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා 2011 උගත් පාඩම් සහ සංහිඳියා කොමිෂන් සභා වාර්තාව සමාලෝචනය කර සංශෝධනය කිරීම.
2. කාන්තාවන් සාමය සහ ආරක්ෂාව පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම - 2023 වෙත සම්පත් සපයා ක්‍රියාත්මක කර අධීක්ෂණය කිරීම.
3. ක්‍රියාත්මක කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ප්‍රමාණවත් සම්පත් සහ අධීක්ෂණය සහිතව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කාන්තා ගෘහමූලික ගෘහ ඒකක වෙනුවෙන් ජාතික රාමුව සමාලෝචනය කර සංශෝධනය කිරීම.
4. ප්‍රතිසන්ධාන, සංක්‍රාන්ති යුක්ති සහ ගැටුම් නිරාකරණ යාන්ත්‍රණ තුළ කාන්තාවන්ගේ සමාන නියෝජනය සහ අදහස් විමසීම සහතික කිරීම.
5. සන්නද්ධ ගැටුම අවසාන වීමත් සමඟ විශේෂයෙන්ම සංක්‍රාන්ති වැඩපිළිවෙලවල් යටතේ දිගු කාලීන යුද්ධයෙන් සහ ගැටුමෙන් බලපෑමට ලක් වූ ආබාධිත කාන්තාවන් සවිබලගැන්වීමේ උපායමාර්ග හඳුනා ගැනීම.

# 07 වෙනි තේමාගත ක්ෂේත්‍රය: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස

### ප්‍රතිපත්තියෙහි බැඳීම්

- පෞද්ගලික, පොදු, වෘත්තීයමය සහ ඩිජිටල් අවකාශ තුළ  කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහි සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ප්‍රචණ්ඩත්වය, චිරස්ථායීකරණ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් පිලිබඳව ප්‍රමාණවත් අධ්‍යාපනය ලබා දීම සහ  වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයන්ට ප්‍රතිචාර දැක්වීම පිණිස වින්දිත හිතකාමී වෛද්‍ය, නෛතික, මනෝ සමාජ රැකවරණ ස්ථාන සහ හදිසි සහාය සේවා පැවතීම, ප්‍රවේශ හැකියාව සහ ඒ වෙනුවෙන් වියදම් දැරීමේ හැකියාව සහතික කිරීම.
- හානිකරවිය හැකි ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සම්මතයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිකරණය සහ සමාජ සංස්කෘතික විශ්වාස හේතුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ එවැනි දේ ආයතනගත වීම නීති සහ සහාය සේවා හරහා වැලැක්වීම සහතික කිරීම.

### උපාය මාර්ග

1. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020) සංශෝධනය කර ක්‍රියාත්මක කිරීම.
2. අධීක්ෂණය සහ ඇගයුම වෙනුවෙන් දැඩි යාන්ත්‍රණක් සහිතව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට විසඳුම් සැපයීම සඳහා ජාතික ප්‍රතිපත්තිය සහ වැඩසටහන් සම්බන්ධීකරණය සහිතව සඵලදායක ලෙස  ක්‍රියාත්මක කිරීම සහතික කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම.
3. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි සියළු වින්දිතයන් විසින්  මුහුණ දෙනු ලබන සැබෑ ගැටළු වලට ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් නොවන නීතියේ පවතින අඩුපාඩු ආමන්ත්‍රණය කරන නීති සහ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සහ යල් පැන ගිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය ඒකාකෘතිකරණය  සහිත විධිවිධාන ඉවත් කිරීම.
4. ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයන්ට සාකල්‍ය සේවා සැපයීම සඳහා බහු පාර්ශ්වකාර හා අන්තර් අමාත්‍යාංශ ප්‍රතිචාර ශක්තිමත් කිරීම.

## 08 වැනි තේමාගත ක්ෂේත්‍රය: ළමයින් - ගැහැණු ළමයා පිළිබඳ විශේෂ අවධානය සහිතව

### ප්‍රතිපත්තියෙහි බැඳීම

- දෙමව්පියන් එක් අයෙකුගේ හෝ දෙදෙනාගේම, නෛතික භාරකරු / භාරකරුවන්ගේ හෝ ළමයාගේ රැකවරණය භාර වී ඇති වෙනත් කවර හෝ තැනැත්තකුගේ රැකවරණයෙහි සිටින අතරතුර, ලිංගික අපයෝජනය ඇතුළුව සියළු ආකාරයේ ශාරීරික හෝ මානසික ප්‍රචණ්ඩත්වයෙන්, හානි හෝ අපයෝජන වලින් නොසලකා හරිනු ලැබීමෙන් හෝ නොසැලකිලිමත් සැලකිලි වලින්, හිංසා කිරීමෙන් හෝ සූරා කෑමෙන් ගැහැණු ළමයා ආරක්ෂා කිරීම සඳහා සියළු සුදුසු ව්‍යවස්ථාදායක, පරිපාලනමය, සමාජ සහ අධ්‍යාපනික ක්‍රියාමාර්ග සහතික කිරීම.

### ප්‍රතිපත්තියෙහි අරමුණු

- ගැහැණු ළමුන්ට හානිකර පිළිවෙත්, මානසික සහ ශාරීරික ප්‍රචණ්ඩත්වය ඔවුන්ව අපයෝජනය, නොසලකා හැරීම හා සූරාකෑම වැළැක්වීම හා ඒවාට පිළියම් යෙදීම.
- ගැහැණු ළමුන්ගේ අධ්‍යාපනික, සෞඛ්‍ය සහ විනෝදාස්වාද අයිතිවාසිකම් පූර්ණ ලෙස භුක්ති විඳීමට හැකියාව ලබා දීම.

### උපාය මාර්ග

1. අදාල සියළු ආයතන සම්බන්ධ කර ගනිමින්, ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තරසම්මුතිය තිය සමග අනුකූලව පරිපූර්ණ සහන සැලසීමේ උපාය මාර්ග සහිතව ගැහැණු ළමයාගේ ආරක්ෂාව හා සවිබලගැන්වීම වෙනුවෙන් කාලීන අවශ්‍යතා අවධාරණය කරන ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කිරීම.

## පාලනය, ක්‍රියාත්මක කිරීම සහ හවුල්කාරිත්වය සහ සම්පත් ඒකරාශී කිරීම

### පාලනය

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිලිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි පාලන ව්‍යුහය, කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීම මත බලපාන විවිධ රාජ්‍ය ආයතන, ඒවායේ බලපැවරුම් හා ඒවා අතර අන්තර් සබඳතා පිලිගනී. රජය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාවට සහ කාන්තා අයිතිවාසිකම් වලට ගරු කරන බව, සහතික කරන බව හා ආරක්ෂා කරන බව සහ තෙවන පාර්ශ්ව විසින් අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබීම වලක්වන බව සහතික වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය සහ කාන්තාවන්ගේ, පිරිමින්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රජය බැඳී සිටින බව සහතික කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව හා කාන්තා අයිතිවාසිකම් මත රාජ්‍ය ආයතනික ව්‍යුහ සැකසිය යුතු යි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වෙනස් වන සන්දර්භයන්ට අනුව ප්‍රතිපත්තියට මගපෙන්වන, සමාලෝචනය කරන හා අධීක්ෂණය කරන යෝග්‍ය රාමුව සහතික කිරීම අතිශය වැදගත්කමින් යුක්තය.


යෝජිත ජාතික කාන්තා කොමිෂන් සභා පනත අනුව පිහිටුවීමට අපේක්ෂිත ජාතික කාන්තා කොමිෂන් සභාව සහ කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය වෙත ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය පාලනය කිරීම, පැවරෙනු ඇත.

### ක්‍රියාත්මක කිරීම හා හවුල්කාරිත්ව

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අදාල අමාත්‍යාංශවල නායකත්වයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සහ පාර්ලිමේන්තුවේ කාන්තා මන්ත්‍රී සංසදයේ අධීක්ෂණය සහිතව, සියළු රජයේ සහරාජ්‍ය නොවන ආයතන, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය ඇතිව සිදු කෙරෙනු ඇත. ක්‍රියාත්මක කිරීම, ප්‍රධාන රේඛීය අමාත්‍යාංශ, උපජාතික මට්ටමේ පාලන ආයතන, දිස්ත්‍රික් හා කොට්ඨාශ මට්ටමේ රජයේ ව්‍යුහය හා සියලු රජයේ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන අංශය සහ සිවිල් සමාජය සහ පෞද්ගලික අංශය සමඟ සහෝපකාරී සහ සම්බන්ධීකරණය වූ ප්‍රවේශයක් සහතික කරනු ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව හා කාන්තාවන් සවිබලගැන්වීම පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය, ප්‍රතිපත්තියෙහි දක්වා ඇති ප්‍රමුඛතා සඳහා ප්‍රමාණවත් සම්පත් සම්පාදනය, තිරසර බව සහ ළඟාවීම සහතික කරන සඵලදායක හා සාකල්‍ය ක්‍රියාත්මක කිරීම හරහා සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීමට අත්‍යවශ්‍ය බැවින් රජය, සිවිල් සමාජය හා බිම් මට්ටමේ සංවිධාන, පෞද්ගලික අංශය, එක්සත් ජාතීන් සහ සංවර්ධන හවුල්කරුවන් අතර උපායමාර්ගික හවුල්කාරිත්වය සඳහා මූලප්‍රවාහගත කිරීම සහතික කරනු ඇත.

## පාලන හා අධීක්ෂණ යාන්ත්‍රණය




### සම්පත් ඒකරාශී කිරීම

ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය අයවැයකරණ ක්‍රියාවලි හරහා මුදල්මය අයවැය වෙන් කිරීම් මානව සම්පත් හා බාහිර මූල්‍ය, තාක්ෂණික හා  මානව සම්පත් රැස් කර ගැනීම සමඟ ශ්‍රී ලංකා රජය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය වෙනුවෙන් පූර්ණ සම්පත් සැපයීම සහතික කරනු ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ  කාරක සභාවේ  අධීක්ෂණය සහිතව රාජ්‍ය මුදල් සම්බන්ධ කටයුතු කරන අමාත්‍යාංශයේ සහයෝගයෙන් මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, කලින් කලට අධීක්ෂණය හා සමාලෝචනය, ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති කිරීම, ක්‍රමානුකූල දත්ත රැස් කිරීම හා කාර්තු  පදනමින් කලින් කලට වාර්තා කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කරනු ඇත.

# ඇමුණුම

## 01 වැනි තේමාගත ක්ෂේත්‍රය: අනන්‍යතාව සහ ස්වාධීනත්වය

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- කාන්තාවන් පිළිබඳව සෘණාත්මක සමාජ සංස්කෘතික වටිනාකම් වලට හේතු වෙමින් ශ්‍රී ලංකාව තුළ තවමත් කාන්තාවන්ට අහිතකර ලෙස බලපාන ස්ත්‍රී පුරුෂ සමාජභාවී මතවාද ප්‍රබලව පවතී. කාන්තාවන්ට එරෙහිව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ඇතුළුව කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීමට මඟ පාදමින් කාන්තාවන්ව දෙවන ස්ථානයෙහි තබන පීතෘ මූලික වටිනාකම් සහ ආකල්ප පවතී.
- පීතෘමූලික වටිනාකම් ශ්‍රී ලාංකික සමාජය හා ආර්ථිකය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සබඳතා කෙරෙහි තවදුරටත් බලපෑම් ඇති කරන නමුත් මව්වරුන් හා ආර්ථික නිෂ්පාදකයන් ලෙස ඔවුන්ගේ ප්‍රධාන භූමිකාව තුළ කාන්තාවෝ බොහෝ විට පවුල තුළ තත්ත්වාකාර බලතල අත්කරගෙන සිටිති. විවාහය හා පවුල තුළ කාන්තාවන්ගේ භූමිකාව දැඩි ලෙස ඒකාකෘතිකරණයට ලක්ව ඇති අතර පිරිමියා පවුලේ ප්‍රධානියා සහ ප්‍රධාන ආදායම් උපයන්නා ලෙස සැලකෙද්දී ඔවුන්ව දකිනු ලබන්නේ ප්‍රාථමික රැක බලාගන්නන් ලෙස ය.
- කාන්තාවෝ තවදුරටත් 'යැපෙන භාර්යාවන්' හෝ 'අතිරේක ආදායම් උපයන්නන්' ලෙස සලකනු ලබමින් ශ්‍රම සංචිතයක් ලෙස යොදාගනු ලබති. කාන්තාවන් ප්‍රජනන කාර්යභාරයන්හි බර ඉසිලීම හා විවාහය හා පවුල සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී ඔවුන්ගේ සහභාගිත්වය හා ශ්‍රම බලකාය හා සමාජය තුළ ඔවුන්ගේ ඵලදායී නිරතවීම සීමා කිරීම මෙයින් පිලිබිඹු කෙරේ. ඵලදායක කාර්යභාරයන්ට පමණක් සීමා කරනු ලැබ පවුල තුළ පිරිමින්ගේ සහභාගිත්වය වැඩි කර කාන්තාවන් මත ඇති ගෘහස්ථ බර අඩු කරවන පරිදි පිරිමින් ගෘහස්ථ හා දරුවන් හදා වඩා ගැනීමේ කාර්යභාරයන්ට අවස්ථාව අහිමි කරනු ලැබීමෙන් පිරිමින් වෙනස් ආකාරරෙයන් සලකනු ලැබීමට ලක් වෙති.
- ශ්‍රී ලංකාවේ පොදු නීති විවාහය තුළ කාන්තාවන්ට හා පිරිමින්ට සමානාත්මතාව ලබා දීම, වයෝ පූර්ණත්ව වයස විවාහ වීමේ වයස ලෙස හඳුනා ගැනීම හා ළමුන්ගේ භාරකාරිත්වය හා වෛවාහික දේපල හිමිකාරිත්වයට සමාන අයිතිවාසිකම් පිළිගැනීම සිදු කරයි. විවාහය අවලංගු කිරීම සඳහා පවතින නිත්‍යානුකූල අවසරය ඇති ආකාර තුළ විවාහය අවලංගු කිරීමේ අවස්ථාව කාන්තාවන්ට හා පිරිමින්ට සමානව ලැබේ. කෙසේ වෙතත්, ඉස්ලාම් ධර්මය අදහන පිරිස් පාලනය කරන පෞද්ගලික නීති විවාහවීමේ වයස, වෛවාහික හිමිකම් වල සමානාත්මතාව සහ විවාහය අවලංගු කිරීමට අදාලව කාන්තාවන්ට එරෙහිව වෙනස් කොට සැලකීම සිදු කරයි. තේසවලාමෙයි නීතිය යටත් වන දෙමළ සම්භවයක් ඇති කාන්තාවන් පාලනය කරන පෞද්ගලික නීති, සැමියාගේ ලිඛිත අවසරය නොමැතිව වෛවාහික දේපල හිමිකාරිත්වයේදී හා බැහැර කිරීමේදී කාන්තාවන්ට එරෙහිව වෙනස් කොට සලකයි.
- නෛතික තහවුරු කිරීමක් නොමැති වුවද සාම්ප්‍රදායිකව පිරිමියා ගෘහ මූලිකයා ලෙස පිලිගනු ලැබේ. පවුලේ වැඩිහිටි පිරිමියෙකු නොමැති විට පමණක් කාන්තාවන් ගෘහ මූලිකයන් ලෙස සලකනු ලබන අතර එමගින් පිරිමි ගෘහ මූලිකයන්ට සාපේක්ෂව දෙවැනි තැනට පත් කරනු ලබති. තීරණ ගැනීම හා සම්පත් කරා කාන්තාවන්ගේ ප්‍රවේශයට සහ පිරිමියා හා සමානව විධිමත් ගෘහමූලිකයෙකු ලෙස පිලිගැනීම සම්බන්ධයෙන් මෙය කාන්තාවන්ට අහිතකර ලෙස බලපායි. ගෘහස්ථ ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ ගෙවීම් නොලබන රැකබලා ගැනීමේ වැඩ ශ්‍රී ලංකාව තුළ කිසිදු පිලිගැනීමකට ලක්ව නොමැති අතර සමාජමය වශයෙන් වටිනාකමක් දීම හෝ මුදල්මය වටිනාකම ගණන් ගැනීම සිදු නොවේ. ගෙවීම් නොලබන රැකබලා ගැනීමේ වැඩ අතරට රැක බලා ගැනීම, ගෘහ කළමනාකරණය සහ පවුලේ ව්‍යාපාරවලට දායක වීම අයත් වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විධිමත් ශ්‍රම බලකායේ නොසිටින කාන්තාවන් සංවර්ධනයට ලබා දෙන දායකත්වය ජාතික සංඛ්‍යා ලේඛන වල දක්නට නොලැබේ.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව කෙරෙහි ශ්‍රී ලංකාවේ බැඳීම් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය විධිමත් ලෙස පිලිගැනීමට ලක්ව නොතිබීම හේතුවෙන් ඔවුන්ව පිළිනොගැනෙන අතර ඔවුනට එරෙහිව වෙනස් කොට සැලකීම සිදු වේ. තවද, දණ්ඩනීති සංග්‍රහය සමලිංගික සබඳතා අපරාධ වරදක් කිරීමද මෙයට හේතු වී ඇත.
- ශ්‍රී ලාංකික කාන්තාවන්ට හා පිරිමින්ට ජාතිකත්වය හා පුරවැසිභාවය අත් කර ගැනීම, වෙනස් කිරීම හා රඳවා ගැනීම හා දරුවන්ට ජාතිකත්වය හා පුරවැසිභාවය පිරිනැමීමට නීතියෙන් සමාන හිමිකම් ඇත. කෙසේ වෙතත්, නියාමන හා පරිපාලනමය ක්‍රියාවලී, විවාහයේදී පුරවැසිභාවය පැවරීමට කාන්තාවන් හා පිරිමින් සතු නිසඟ අයිතිය පිළිනොගනී.

## 2 වැනි තේමාගත ක්ෂේත්‍රය: ආර්ථික සවිබලගැන්වීම සහ ඵලදායී රැකියා නියුක්තිය

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- රටේ අධ්‍යාපනයට අදාලව අත් කර ගෙන ඇති දේ සහ අනෙකුත් සමාජ දර්ශක ඉහළ මට්ටම් වලින් තිබියදීත්, ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වය දීර්ඝ දිගටම පහළ මට්ටමක තිබීම තීරණාත්මක සංවර්ධන ගැටළුවකි. කාන්තාවන්ගේ සහභාගිත්වය පිරිමි ශ්‍රම බලකා සහභාගිත්වයෙන් අඩක් වන අතර ඔවුහු ජාතික දත්ත හා සංඛ්‍යාලේඛන වලට හසු කර නොගන්නා අංශ වල සැඟවී සිටිති. පිරිමි ශ්‍රම බලකා සහභාගිත්වයෙන් අඩක් ලෙස කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 35.4 ක් කැපී පෙනෙන ලෙස පහළ මට්ටමක පවතී. කාන්තාවන්ගෙන් 37% ක් ගෙවීම් නොලබන රැකබලා ගැනීමේ වැඩ වල නිරත වන අතර වයස අවුරුදු දහයට වැඩි ගැහැණු ළමුන්ද මෙයට ඇතුළත් වේ.
- රැකියා නියුක්ති අනුපාතික වල වෙනස්කම්, කාන්තාවන්ගේ ප්‍රජනන භූමිකාව හා විවාහක තත්ත්වය මත පදනම් වූ තදින් මුල් බැසගත් ස්ත්‍රී සමාජභාවී භූමිකා පුද්ගලික හා රාජ්‍ය පීතෘ මූලික බවට මග පාදන සමාජ සම්මතයන් හා ශ්‍රම වෙළඳපලට කාන්තාවන් සම්බන්ධ වීම නිශ්චය කරන ව්‍යුහමය බාධක වෙත පැවරිය හැකිය. එබැවින්, සුනිසි රැකියා නියුක්ති කරා ඔවුන්ගේ අභිලාෂයන් සීමා කෙරේ. තවද, ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය පාලනය කරන ව්‍යවස්ථාදායක රාමුව කාන්තාවන්ට බොහෝ බාධක ඇති කරන අතර තාක්ෂණයෙහි හා වැඩ කිරීමේ ආකෘති වල සීඝ්‍ර වෙනස්වීම් ආමන්ත්‍රණය කිරීම අතින් ගත් කල යල් පැන ගිය එකකි.
- කාන්තාවෝ තවදුරටත් රටේ වැඩ කරන දුප්පතුන්ගෙන් විශාල බහුතරයක් නියෝජනය කරයි, ඔවුන් අඩු ආදායමක් උපයන අතර පිරිමින්ට වඩා දීර්ඝ කාලීන විරැකියාවෙන් අහිතකර බලපෑමට ලක් වෙයි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීම විසින් ඇති කරන ලද අවාසි සහ නිවසේදී හා රැකියාවේදී ඔවුන්ගේ භූමිකා මගින් ඔවුන් මත පැටවෙන ද්විත්ව බරයි. ඵලදායී සම්පත්, අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය සහ ශ්‍රම වෙළඳපොල අවස්ථා කරා කාන්තාවන්ට බොහෝ විට ඇත්තේ අඩු ප්‍රවේශයකි. සීමිත ව්‍යවසායකත්ව සහ නවෝත්පාදන කුසලතා, විශාල සංඛ්‍යාවක් අවිධිමත් අංශයේ නිරත වීම හා යැපුම් ගොවිතැනේ වැඩි වශයෙන්ම කාන්තා නියෝජනය, පූර්ණ ආර්ථික සවිබලගැන්වීම සාක්ෂාත් කර ගැනීමට අභියෝග කරයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතු කරුණු රැකියා ප්‍රවර්ධනයට සමෝධානය කිරීම, සුනිසි හා ඵලදායී ආදායම් අවස්ථා සහතික කිරීමට හා ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වේ.
- කාන්තාවන්ගේ ප්‍රජනන භූමිකාව හා විවාහක තත්ත්වය මත පදනම් වූ තදින් මුල් බැසගත් ස්ත්‍රී සමාජභාවී භූමිකා පුද්ගලික හා රාජ්‍ය පීතෘ මූලික බවට මග පාදන සමාජ සම්මතයන් හා ශ්‍රම වෙළඳපලට කාන්තාවන් සම්බන්ධ වීම නිශ්චය කරන ව්‍යුහමය බාධක ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වයේ අඩු මට්ටම් වලටත් විවිධ ආකාරයේ ඵලදායක වැඩ වලදී කාන්තාවන්ගේ අදෘශ්‍යමාන බවටත් හේතු වේ.
- අධ්‍යාපනයේ සිට රැකියාවට සංක්‍රාන්තියෙහි පරතරය පියවීම පිණිස ප්‍රමාණවත් වෘත්තීය අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන් නොතිබීම පිරිමින් සහ කාන්තාවන් යන දෙපාර්ශ්වයටම බලපාන සාධකයක් වුවද මේවායේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ගම්‍යයන්, කාන්තාවන් තොරතුරු හා රැකියා අවස්ථා කරා ප්‍රවේශ වීමට අභියෝග කරන සමාජ සම්මතයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඒකාකෘතිකරණය හේතුවෙන් වඩාත් නරක අතට හැරේ.
- වැවිලි අංශයේ, කර්මාන්ත අංශයේ (වැඩි වශයෙන්ම අපනයන සැකසුම් කම්හල්වල) හා විගමනික ශ්‍රමිකයන් ලෙස වැඩකරමින් ජාතික ආර්ථිකයට ඉහළම දායකත්වය ලබා දෙන්නේ කාන්තාවන්ය. මෙම අංශ වල විශාල සංඛ්‍යාවන්ගෙන් නියෝජනය වන කාන්තාවෝ වැඩි වශයෙන් ම සමාජ ආරක්ෂණය, නීතියේ ආරක්ෂාව හා රැකියාවේ දියුණුව සඳහා අවම අවස්ථා සහිත අඩු කුසලතා අවශ්‍ය හා අඩු වැටුප් ඇති රැකියාවන්ට සීමා වී සිටිති.
- තාක්ෂණය හා සබැඳි ක්ෂේත්‍ර වල වේගවත්ව වැඩිදියුණු වූ තත්ත්වයන් තුළ තීරණ ගන්නා හෝ වෘත්තික මට්ටමේ රැකියාවන් වල කාන්තාවන් ප්‍රමාණවත් ලෙස ඇතුළත් කරගෙන නොමැත.
- පෞද්ගලික අංශයේ සිටින කාන්තාවන්, බඳවා ගැනීමේදී, ස්ථානගත කිරීමේදී, වේතන , උසස්වීම්, සේවා තත්ත්වයන් හා රැකියා සුරක්ෂිත බව සහ ප්‍රගතිශීලී එනමුත් මූලික මාතෘ ප්‍රතිලාභ හා දෙමාපිය ප්‍රතිලාභ භුක්ති විඳීමට නොහැකි වීම ඇතුළුව ප්‍රතිලාභ සම්බන්ධයෙන් විවිධ මට්ටම් වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීමට මුහුණ දෙයි.

- යල්පැනගිය සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතිකරණය මත පදනම් වූ වෘත්තියමය බෙදීම් බොහෝ අංශ සමාජමය වශයෙන් යෝග්‍ය ලෙස හෝ ඔවුන්ගේ සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකා පිලිබිඹු කරන ඒවා ලෙස සලකනු ලබන රැකියා අවස්ථා කාන්තාවන්ට ලබා දීමට මග පාදන අතර එහි ප්‍රතිඵලයක් ලෙස වඩා හොඳ වේතන හා සේවා තත්ත්වයන් සහිතව පිරිමින්ට ලබාගත හැකි රැකියා අවස්ථා කාන්තාවන්ට අහිමි වේ.
- ඇතැම් විධිමත් අංශයේ රැකියාවල සහ අවිධිමත් අංශයේ රැකියා වල බොහෝ සෙයින් පැතිර පවතිනු දක්නට ලැබෙන පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වේතන විෂමතා සැඟවුණු ගැටළුවකි. එහිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීම සමඟ සමාන වැඩ වෙනුවෙන් සමාන වැටුප් යන්න හැම විටම අනුගමනය කරනු නොලැබේ.
- විධිමත් අංශයේ, කෘෂිකර්මාන්තයේ හා පවුලේ ව්‍යවසායට, ගෘහස්ථ වැඩ වලට දායක වන්නන් ලෙස ඇතුළුව නිවෙස පාදක කරගත් වැඩ, පිරිසිදු කිරීම් කර්මාන්තය, ඉදි කිරීම් හා කුඩා ව්‍යාපාරික ආයතන වල වැඩ කරන කාන්තාවන්ට හිමිකම් හා නෛතික ආරක්ෂාව නොමැතිකම සහ වාණිජ ලිංගික ශ්‍රමිකයන් අපරාධකරුවන් බවට පත් කිරීම ශ්‍රම බලකාය තුළ සිටින කාන්තාවන් අනතුරට භාජන විය හැකි සහ කොන් කරන ලද තත්ත්වයට පත් කර ඇත.
- පුද්ගලික හා ගෘහස්ථ අවකාශ තුළ කාන්තාවන්ගේ රැකබලා ගැනීමේ වැඩ, ආර්ථික වශයෙන් තක්සේරු නොකෙරෙන අතර රැකබලා ගැනීමේ වැඩ දායකත්වය ජාතික දත්ත හෝ ජාත්‍යන්තර ආදායම් සංඛ්‍යා ලේඛන වල පිලිබිඹු නොවෙයි.
- ණය හා ආයෝජන කුසලතා හා පුහුණුව සහ වෙළඳපොලවල් කරා ප්‍රවේශය නොමැතිව කාන්තාවෝ මධ්‍ය හා කුඩා පරිමාණ ව්‍යවසාය අංශය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීමට මුහුණ දෙන අතර එයින් එම ව්‍යවසාය තිරසාර පවත්වාගෙන යාමට දුෂ්කරතා නිර්මාණය කිරීම හා ව්‍යවසාය වර්ධනය කර ගැනීමට අවස්ථාව ඔවුනට අහිමි වීම සිදු වේ.
- උපද්‍රව සහිත භෞතික වැඩ පරිසර, සේවා ස්ථානයේදී ලිංගික අඩන්තේට්ටම් සහ දුක්ගැනවිලි වලට සහන සැපයීමට ප්‍රමාණවත් නොවන තොරතුරු හා ක්‍රම, විධිමත් හා අවිධිමත් රැකියා නියුක්ති අංශ වල කාන්තාවන් විසින් මුහුණ දෙනු ලබන වෘත්තීය හා ආරක්ෂා ගැටළු අතරට අයත් වේ.

# 3 වැනි තේමාගත ක්ෂේත්‍රය: සමාජ සමානාත්මතාව සහ සවිබලගැන්වීම

## 3 .1 අධ්‍යාපනය

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- පසුගිය වසර 70 පුරා අධ්‍යාපනය කරා ප්‍රවේශය වැඩි කිරීමට ශ්‍රී ලංකාව ගන්නා ලද ප්‍රයත්නයන්, ප්‍රාථමික, ද්විතියික, හා තෘතියීයක අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය වැඩි කර ඇති අතර රටේ කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට වැඩි අවස්ථා නිර්මාණය කිරීම එහි ප්‍රතිඵලය වී ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම කලාපය තුළ 'සාර්ථකත්වයෙහි කථාව' ක් ලෙස දකිනු ලැබේ. සාක්ෂරතා අනුපාතික වල ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමතාව සහිතව ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතිකය සියයට 92 ක් ලෙස ඉහළ මට්ටමක පවතී. සාමාන්‍ය සාක්ෂරතා අනුපාතය පිරිමින්ගේ සියයට 92.5 ක් වෙද්දී කාන්තාවන්ගේ එය සියයට 91.6 ක් ලෙස ස්වල්පයක් අඩු මට්ටමක පවතින අතර කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට අදාලව සමාන අනුපාතික සහිතව සියළු ජනතාව අධ්‍යාපනික අත් කර ගැනීම ඉහළ මට්ටමක පවතී.
- කෙසේ වෙතත්, අධ්‍යාපනයේදී අත් කරගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමතාව ශ්‍රී ලංකාවේ නිත්‍ය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අත් කර ගැනීමට දායක වී නොමැත. ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් සහ ද්විමය නොවන ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහිත තැනැත්තන් විසින් මෙම අංශය තුළ මුහුණ දෙනු ලබන ගැටළු රැසක් අතරට මේවා අයත් වේ. කෘත්‍යාත්මක සාක්ෂරතාවයෙහි අදෘශ්‍යමාන විෂමතා, අධ්‍යාපනය තුළ සහභාගිත්වය හා පැවැත්ම, විෂයමාලාව සහ ඉගැන්වීම යන දෙකෙහිදීම සාමාන්‍ය අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාව ඒකාකෘතිකරණය, ජ්‍යෙෂ්ඨ මට්ටමේදී විෂය තේරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා, විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු ශිල්පය හා ගණිතය (STEM) තුළ කාන්තාවන්ගේ අඩු නියෝජනය, සහ වෘත්තීය පුහුණුවේදී ස්ත්‍රී පුරුෂ සමාජභාව ඒකාකෘතිකරණය මෙම ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට මෙන්ම පිරිමින්ට හා පිරිමි ළමුන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට බලපාන ප්‍රධාන ගැටළු ලෙස සලකනු ලැබේ.
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) දැනුම, ආර්ථික සංවර්ධනය, දේශපාලන හා සමාජ යුක්තිය බෙදා හදා ගැනීමට පහසුකම් සලසන ක්ෂේත්‍රයක් වුවත් එය භාවිතයේදී, ප්‍රවේශයේදී, ලබා ගත හැකි වීමේදී හා යටිතල පහසුකම් වලදී පෙර සිට පවතින සමාජ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී බෙදා වෙන් කිරීම් පවතින ක්ෂේත්‍රයකි. කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට අන්තර්ජාලය කරා ඇත්තේ අඩු ප්‍රවේශයකි. ඔවුන් අන්තර්ජාලය පාදක දැනුම හා අන්තර්ක්‍රියා කරා ප්‍රවේශ වීමේදී අඩුවෙන් ක්‍රියාශීලී වන අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සබැඳි අධ්‍යාපනය කරා ප්‍රවේශ වන්නේ පිරිමින්ට හා පිරිමි ළමුන්ට වඩා අඩුවෙනි. තරුණ තරුණියන්ගෙන් සියයට 53.8 කට පමණක් අන්තර්ජාලය කරා ප්‍රවේශය තිබෙන අතර ගැහැණු ළමුන් මෙම ජනගහනයෙන් සියයට 33ක් පමණි.
- වැඩි වශයෙන්ම පුහුණුව, බඳවා ගැනීම හා සේවයේ ස්ථානගත කිරීම සමඟ ඇති ගැටළු හේතුවෙන්, ශ්‍රී ලංකාවේ සුදුසුකම් ලත් හා පළපුරුදු ගුරුවරුන්ගේ හිඟයක් පවතී. ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගුරු වෘත්තිය වඩාත් කැමති රැකියා විකල්පයක් ලෙස සලකන අතර විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල ගුරු හිඟයට විසඳුම් ලබා දීම ගුරුවරියන්ට සහායක පරිසර ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය කර නොමැත.
- ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය හා වෘත්තීය ක්ෂේත්‍ර තුළ වැඩිහිටි අධ්‍යාපන අවස්ථා දක්නට තිබෙන අතර ශාස්ත්‍රීය නොවන සහ කෘත්‍යාත්මක වැඩිහිටි අධ්‍යාපන අවස්ථා අවමය. ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා සහ වැඩිහිටි කාන්තාවන් සාක්ෂරතාව ඇතුළුව මූලික අධ්‍යාපනය ලබා ගැනීම මත රඳවනු ලබන සමාජමය පීඩනය හේතුවෙන් මෙහිදී කාන්තාවන් තවදුරටත් අවාසි සහගත තත්ත්වයට මුහුණ දෙයි.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් හා ඒකාකෘති චිරස්ථායී කිරීම අධ්‍යාපනික විෂයමාලා, ඉගැන්වීමේ ක්‍රම, ගුරුවරුන් හා අධ්‍යාපනික ආයතන වලට කාවැදී ඇති අතර කාන්තාවන්ගේ ප්‍රවේශ අවස්ථා වලට සෘණාත්මකව බලපෑම මෙන්ම සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාල සෘණාත්මක ආකල්ප, ප්‍රත්‍යක්ෂයන් හා පිළිවෙත් තවදුරටත් ශක්තිමත් කිරීමට මග පෑදීම සිදු කරයි.
- නව යොවුන් ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ටද, වැඩිහිටියන්ටද, පරිපූර්ණ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අධ්‍යාපනය නොතිබීම හා ඒ කරා ප්‍රවේශය නොමැති වීම, අනවශ්‍ය ගැබ් ගැනීම්, ලිංගික සෞඛ්‍යය නොසලකා හැරීම, ලිංගික වශයෙන් සම්ප්‍රේෂණය වන රෝග බෝවීමේ අවදානමට පත් වීම,

අනාරක්ෂිත හා නීතිවිරෝධී ගබ්සා කිරීම් සහ කුලුපග හවුල්කරු විසින් සිදුකරනු ලබන ලිංගික ප්‍රචණ්ඩත්වය ඇතුළු ලිංගික අපයෝජනයට හේතු වී ඇත.

- ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් සමානව ප්‍රවේශ වන ප්‍රාථමික සිට උපාධි මට්ටම දක්වා රජයේ අනුග්‍රහයෙන් අධ්‍යාපනය කරා පරිපූර්ණ ප්‍රවේශය සැපයීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපනයට අයිතිය සම්බන්ධයෙන් සංවාදය ඉතා සුළුවෙන් පවතින අතර දරිද්‍රතාව, සංචරණ හැකියාව නොමැති වීම, ආබාධිත තත්ත්වය, ලිංගික අනන්‍යතා, භූගෝලීය තත්ත්වය, සෘණාත්මක ආකල්ප මගින් කොන් කරන ලද ගැහැණු ළමුන් කාන්තාවන්, හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයේ සහ පෞද්ගලික නීතිවල සීමාකාරී විධිවිධාන වල අහිතකර බලපෑමට ලක්වූවන් විසින් ජීවිත කාලය පුරා අධ්‍යාපනය ඇතුළුව අධ්‍යාපනයට ප්‍රවේශය සක්‍රියව හඳුනා ගැනීමට බාධා ඇති කරයි.

## 3 .2 සෞඛ්‍යය

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- විශේෂයෙන්ම සෞඛ්‍ය ආරක්ෂණය සම්බන්ධයෙන් නිදහසින් පසු හඳුන්වා දෙන ලද සමාජ ප්‍රතිපත්ති දිවයින පුරා සියළුම සමාජ ආර්ථික ස්තර වලම පාහේ වෙසෙන කාන්තාවන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කර තිබේ. ශ්‍රී ලංකාව සෞඛ්‍ය දර්ශක රැසක් අතින් පෙරමුණ ගෙන සිටීමෙන් මෙය පැහැදිලි වේ. පිරිමින්ට වසර 72.4 ක් වන ආයු අපේක්ෂාව හා සැසඳූ කළ කාන්තාවන්ගේ එය වසර 79.6 ක් වැනි වඩා ඉහළ අගයක් ගනී. මාතෘ සෞඛ්‍යයට අදාළව විවාහක කාන්තාවන්ගෙන් 99% කටම පුහුණු සෞඛ්‍ය ආරක්ෂණය සපයන්නන්ගෙන් පූර්ව ප්‍රසව ආරක්ෂණය ලැබෙන අතර 2015 මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 30/100,000 වූයේ සේවාවන් වල ගුණාත්මක බව හා ආවරණය පෙන්නුම් කරමිනි.
- මෙලෙස, මාතෘ සෞඛ්‍යය වැනි කාන්තාවන්ටම සුවිශේෂී වූ සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශය සහිතව කාන්තාවෝ සෞඛ්‍ය සේවාවන් කරා ඉහළ හා සමාන ප්‍රවේශය භුක්ති විඳිති. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය ද යම් මට්ටමක සෞඛ්‍ය ආරක්ෂණ සැපයුම භුක්ති විඳිති.
- කෙසේ වෙතත්, ජීවිතයේ ගුනාත්මක බව වැඩි දියුණු කර සෑම ස්ථානයකම සෞඛ්‍ය ආවරණය අත් කර ගැනීම සඳහා සාකල්‍ය මැදිහත්වීම් සහතික කරනු පිණිස සියළු අංශ තුළ ජීවන චක්‍ර ප්‍රවේශයක් තුළින් කාන්තාවන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්ම විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මෙය රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍ය සේවාවන්ගෙන් ඔබ්බට ගොස්, මානසික, ශාරීරික සහ සමාජ යහපැවැත්ම සහතික කිරීම පිණිස විනෝදාස්වාදය, විවේකය හා සෞඛ්‍ය සම්පන්න ජීවන රටා පිළිවෙත් සඳහා කාන්තාවන්ට අවස්ථා ලැබීම හරහා සෞඛ්‍ය සම්පන්න ජීවන රටා ප්‍රවර්ධනය හා සම්බන්ධ වේ.

- කාන්තාවන්ගේ සෞඛ්‍යයට අදාල ජයග්‍රහණ තිබුණද, පවුල් සැලසුම සහ ප්‍රජනන සෞඛ්‍යය, කාන්තාවන්ගේ අයිතිවාසිකම් වලට ප්‍රතිවිරුද්ධව යන සහ කාන්තාවන්ගේ හා පවුලේ සෞඛ්‍යයට අනතුරු ඇති කරවන ආකාරයේ සමාජ, සංස්කෘතික, දේශපාලන හා ආගමික ගම්‍යයන් අත් කරගෙන තිබේ.
- වියපත් වන, ආර්තවහාවය ඉක්මවූ කාන්තාවන් ඔස්ටියො ආතරයිටිස්, ඔස්ටියොපොරෝසිස් සහ අස්ථි බිඳීම් වල සිට චිත්ත වික්ෂේපය (ඩිමෙන්ෂියා) සහ ජීවිතයේ අවසාන භාගයේ ගැටළු අත් විඳින බැවින් වියපත් කාන්තාවන්ගේ සෞඛ්‍ය ගැටළු සංකීර්ණය. මෙම අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉටු කිරීම සඳහා සුදුසු සෞඛ්‍ය, මූල්‍ය සහ සමාජ සහාය දැනට ප්‍රමාණවත් නොවේ.
- වඩා තරුණ කාන්තාවෝ ප්‍රශස්ත වයස වන තුන්වැනි දශකයෙන් ඔබ්බට සරු බව පිළිබඳ ගැටළු වලට මුහුණ දෙන අතර ඒ අනුව වඳ බව හා වෙන් කළ නොහැකිව සබැඳී සාංකාව, සමාජ අපවාදය, මූල්‍යමය බර හා සමාජ ගැටළු වලට මුහුණ දෙති.
- කාන්තාවෝ ඔවුන්ගේ ප්‍රජනන හෝමෝන වලට කෙලින්ම බලපාන ස්ථුලත්වය හා ශරීරයේ අධික මේද මෙන්ම අධි රුධිර පීඩනය, රුධිරයේ සීනි මට්ටම වැඩි වීම, පරිවෘත්තිය සහලක්ෂණය සහ රෝධක නිදි ඇප්නියාව වැනි බහුවිධ පරිවෘත්තීය අවදානම් වලට ලක්වීමේ වඩා ඉහළ අවදානම් තත්ත්වයක සිටිති.

- නිදන්ගත ආබාධිකත්වය හා පරායත්ත බව ඇති කරවන නිදන්ගත බෝ නොවන රෝග ලෙස කාණ්ඩගත කරනු ලැබ ඇති දියවැඩියාව සහ එහි සංකූලතා, හෘදයාබාධ, ආඝාතය සහ වකුගඩු රෝග හා සමඟාමී අකල් ඇතිරෝමාවට ගොදුරු වීමේ වැඩි අවදානමක් මෙවැනි කාන්තාවන්ට ඇත.
- කාන්තාවන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේදී ඒකාකෘතිකරණය වූ භූමිකාවන්ට නොගැලපෙන කාන්තාවන්ට සැපයෙන සෞඛ්‍යය සේවාවන් කරා ප්‍රවේශ වීමෙන් වැළැක්වීමට ඉඩ ඇති ඒකාකෘතිකරණය වූ යටිතානයන් තිබේ. දැනට කාන්තාවන්ගේ සෞඛ්‍යය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේදී ස්වකීය වර්ගයා බෝ කරන්නන්, රැක බලා ගන්නන්, ලිංගික අවශ්‍යතා සපුරන්නන් හා පවුලේ යහපැවැත්මේ හා සෞභාග්‍යයේ නියෝජිතයන් ලෙස කාන්තාවන්ගේ උපකාරක වටිනාකම හුවා දක්වනු ලැබේ. කාන්තාවන්ගේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය, මාතෘත්වය සහ ලිංගික වශයෙන් සම්ප්‍රේෂණය වන ආසාදන හා රෝග යන සීමිත සන්දර්භය තුළ නොව පුළුල් ලෙස සැලකිල්ලට ගැනීම අවශ්‍යය. අවිවාහක කාන්තාවන් විවාහක කාන්තාවන් තරමටම වැදගත් වන අතර තෝරාගැනීම් කිරීමට, ඔවුන්ගේ කැමති ජීවන රටා අනුගමනය කිරීමට නිදහස සහ සෞඛ්‍යය ආරක්ෂණ සහ සහාය සේවා කරා සමාන ප්‍රවේශය ඔවුනට තිබිය යුතුය. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවී අසාධාරණ ආකල්ප බිඳ දැමීම සඳහා කාන්තාවන්ගේ සෞඛ්‍යයට ඇති අයිතිය පිළිගැනීමේදී පිරිමින් නිරත කරවීම තීරණාත්මක වැදගත්කමින් යුක්තය.
- අවදානම් ගැනීම, ශක්තිමත්ව සිටීම, උදව් හා සෞඛ්‍ය සහාය නොපැතීම, අයිතිය ඇති බවට විශ්වාසයෙන් සිටීම හා කාන්තාවන් මත ආධිපත්‍යය පැතිරවීම මත පදනම් වූ 'පිරිමිකම' පිළිබඳ අදහස් ප්‍රවර්ධනය කරන හානිකර ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන්ගෙන් පිරිමින් හා පිරිමි ළමුන් බලපෑමට ලක් වේ. එබඳු සම්මතයන් පිරිමින්ට වඩා ඉහළ මට්ටමේ සිය දිවි නසාගැනීමේ අනුපාතික, මනුෂ්‍ය ඝාතන, ද්‍රව්‍ය අවභාවිතය, අනාරක්ෂිත ලිංගික පිළිවෙත්, මාර්ග රථ වාහන අනතුරු හා අනෙකුත් බෝ වන හා බෝ නොවන රෝග වෙනුවෙන් ප්‍රමාද වී ප්‍රතිකාර ලබා ගැනීම ඇතුළු ඍණාත්මක ප්‍රතිඵල ඇති කිරීමට දායක වී තිබේ.
- කාන්තාවන් සවිබලගැන්වීම හා කාන්තාවන්ගේ පෝෂණය සහ පවුලේ පෝෂණය අතර සම්බන්ධතාව හඳුනාගැනීම වර්තමාන ප්‍රතිපත්ති හා වැඩසටහන් සැකසීම් ප්‍රයත්නයන් තුළ දක්නට නොමැති තරම්ය. මාතෘ හා ළමා පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රයත්නයන් තිබෙන අතර පරම්පරා අතර පෝෂණ ගැටලු චක්‍ර බිඳ දැමීම දුෂ්කර කරවමින්, ආර්තවය, නව යොවුන් ගැහැණු ළමුන් හා වැඩිහිටි කාන්තාවන් වෙනුවෙන් පෝෂණ අවශ්‍යතා හා තොරතුරු නොසලකා හරිනු ලැබ ඇත.
- පිරිමින් මත පටවනු ලැබ ඇති හානිකර ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන්, පිරිමින් කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සිදු කිරීමේ ඉඩ හා කාන්තාවන් ලිංගික හා ප්‍රජනන තීරණ ගැනීම පාලනය කිරීම වැඩි කරන බැවින් ඒවා කාන්තාවන්ගේ සෞඛ්‍යයට හා යහපැවැත්මටද ඍජුවම බලපායි. ළමුන් රැක බලා ගැනීමේදී, ගෙවීම් නොලබන ගෘහස්ථ වැඩ වලදී හා රැක බලා ගැනීමේදී පිරිමින් සීමිත ආකාරයෙන් සම්බන්ධ වීම, රැක බලා ගැනීමේ කාර්යයෙහි විසමානුපාතික බරක් කාන්තාවන් මත පටවා තමන්වම රැක බලා ගැනීම, නිවාඩු පාඩුව සිටීම, විනෝදාස්වාදය හා විවේකය සඳහා ඔවුන්ගේ කාලය සීමා කරමින් පවුලේ සෞඛ්‍ය හා යහපැවැත්ම සම්බන්ධයෙන් වඩා පුළුල් ගම්‍යයන් ඇති කරවයි.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ බලපෑම් ගණනින් විශාලව මෙන්ම පුළුල්ව පැතිර පවතින අතර, කාන්තාවන්ගේ ශාරීරික සෞඛ්‍යයට, මානසික සෞඛ්‍යයට සහ ප්‍රජනන සෞඛ්‍යයට සහ ඔවුන්ගේ ආත්ම අභිමානයට, ආත්ම සම්භාවනාවට සහ ඵලදායීතාවට අහිතකර ලෙස බලපාමින් අනෙකුත් සියළු ක්ෂේත්‍ර (සමාජ, ආර්ථික, සංස්කෘතික,දේශපාලන) තුළ ඔවුන්ගේ අගනා දායකත්වය අඩු කරනු ඇතිවාක් මෙන්ම ඔවුන්ගේ දරුවන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම කෙරෙහිද අහිතකර ලෙස බලපානු ඇත. සෞඛ්‍ය ආරක්ෂණය සැපයීමේදී මෙම සබඳතාව දක්නට තිබෙන නමුත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය බරපතල සෞඛ්‍ය ප්‍රතිවිපාක සහිත, ජීවිත තර්ජනය ඇති කරවන්නක් ලෙස ප්‍රමාණවත්ව හඳනාගනු ලැබ නොමැති අතර වින්දිතයන් වෙනුවෙන් වෛද්‍ය, මනෝසමාජීය, පුනරුත්ථාපන සහ රැකවරණ සේවා ප්‍රමාණවත් නොවන මට්ටමින් පවතී. .
- ස්ත්‍රී ජනනේද්‍රිය විවෘත කිරීම / කැපීම ශ්‍රී ලංකාවේ සැඟවුණ ගැටළුවක් වන අතර එහි වින්දිතයෝ දීර්ඝ කාලීන ප්‍රතිවිපාක වලට මග පෑදීමට ඉඩ ඇති ශාරීරික හා මනෝවිද්‍යාත්මක සෞඛ්‍ය සංකූලතා වලින් වීඩා විඳිති. මෙම පුරුද්දෙහි වෛද්‍ය ප්‍රතිලාභ කිසිවක් දැන ගැනීමට නොමැති අතර ඇතැම් ආගමික හා සංස්කෘතික හේතු මත එය සිදු කරනු ලැබේ. කන්‍යාභාවය පරීක්ෂා කිරීම, ජීවන චක්‍ර / වැඩිවිය පැමිණීමේ චාරිත්‍ර, අඩු වයසින් විවාහ වීම හා පුතෙකු ලැබීමට වැඩි කැමැත්ත වැනි සීමිත

සන්දර්භ තුළ දක්නට ඇති අනෙකුත් සම්ප්‍රදායික හෝ සංස්කෘතික පිළිවෙත් කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ ශාරීරික සෞඛ්‍යය හා මානසික යහපැවැත්ම මත බලපෑම් ගණනාවක් ඇති කරයි.

- ගැබිණි කාන්තාවන්ගේ ජීවිතය බේරා ගැනීමට හැර ගබ්සාව සිදු කිරීම ශ්‍රී ලංකාව තුළ අපරාධ වරදකි. එහි නීතිමය තත්ත්වය ගබ්සාවන් සිදු කර ගැනීමෙන් කාන්තාවන් වැළැක්වීම සිදු නොකරන නමුත් සංකූලතා ඇති වූ විට වහා වෛද්‍ය සහාය පැතීමෙන් කාන්තාවන් වළක්වා නීතිවිරෝධී ගබ්සාවක් සිදු කර ගැනීම සම්බන්ධ චෝදනාවට ලක් වීමේ අවදානමට පත් කරවයි. එබැවින්, පූතික ගබ්සාව (septic abortion) ශ්‍රී ලංකාවේ මාතෘ මරණ සඳහා පෙරමුණ ගත් සාධකයක්ව පවතී.
- සේවාවන් තිබුණද, නෛතික බාධක තවදුරටත් වෙනස් ලිංගික නැඹුරුතා, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහිත කාන්තාවන් සහ පුද්ගලයන් අත්‍යවශ්‍ය හා ජීවිත රැක දෙන සෞඛ්‍ය සේවාවන් කරා ප්‍රවේශ වීමෙන් වළක්වයි. LGBTIQ + ජනතාවගේ සහ සාමාන්‍ය ජනතාවගේ මූලික සෞඛ්‍ය අවශ්‍යතා එක හා සමාන වන නමුත් ඔවුන්ගේ ලිංගික නැඹුරුව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව, ප්‍රජනන සෞඛ්‍යය ඇතුළු සෞඛ්‍ය හා සම්බන්ධ තොරතුරු සහ සේවාවන් කරා ප්‍රවේශ වීමේදී බාධකයක් ලෙස ක්‍රියා කරයි. ඔවුන් බොහෝ විට සෞඛ්‍ය ආරක්ෂණය ලබා ගැනීමෙන් වැළකී සිටීම හෝ ලබා ගැනීම ප්‍රමාද කරන අතර සේවාවන් කරා ප්‍රවේශ වීමේදී නොගැලපෙන හෝ තත්ත්වයෙන් බාල ආරක්ෂණය ලැබීම, වෙනස් කොට සැලකීමට හා පූර්ව විනිශ්චයන්ට මුහුණ දීමද සිදු වේ. සෞඛ්‍ය ආරක්ෂණ පසුබිම තුළ ඔවුන්ට රහස්‍යභාවය රකිමින් සැලකීම සිදු නොවීමටද ඉඩ ඇත. එසේ වුවද, එච් අයි වී / ඒඩ්ස් සහ ලිංගික වශයෙන් සම්ප්‍රේෂණය වන රෝග වැළැක්වීමේ මැදිහත්වීම් වැඩසටහන් තුළ LGBTIQ + තැනැත්තන් වඩාත් දෘශ්‍යමාන වීම ඔවුන්ගේ සාමාන්‍ය සෞඛ්‍ය හා ප්‍රජනන සෞඛ්‍ය අතර අවශ්‍යතා හඳුනාගැනීමට බාධකයක් ඇති කිරීමට හේතු වනවා මෙන්ම සෘණාත්මක ඒකාකෘති තවදුරටත් තහවුරු කිරීමටද හේතු විය හැකිය.
- ශ්‍රී ලංකාව, දකුණු ආසියා කලාපය තුළ එච් අයි වී/ඒඩ්ස් වසංගතය අඩු මට්ටමින් පවතින රටක් ලෙස කාණ්ඩගත කරනු ලැබ ඇති අතර එච් අයි වී සමඟ ජීවත් වන තැනැත්තන්ට සෞඛ්‍ය සහ අධ්‍යාපන අංශ තුළ සහ ප්‍රජනනය හා පවුල් ජීවිතය තුළ අසාධාරණ ලෙස සැලකීම සිදු නොවන ලෙස විසඳුම් සැපයීම සඳහා ප්‍රතිපත්ති යොදවනු ලැබ ඇත. ස්ත්‍රී ලිංගික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ සේවය ලබා ගන්නන්, පිරිමි සමලිංගිකයන් හා එන්නත්කරන මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් අවදානමට පත් තැනැත්තන් ලෙස සලකනු ලැබේ.
- තමන්ගේම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යයට සම්බන්ධ කරුණු සහ ඔවුන්ගේ ජීවිත, සබඳතා, ලිංගිකත්වය, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ අනාගතය පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට කුසලතා සම්බන්ධයෙන් මිථ්‍යාවෙන් හා වැරදි වැටහීම් වලින් තොර විද්‍යාත්මකව නිවැරදි තොරතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ඇත්තේ අල්ප දැනුමකි. පරිපූර්ණ ලිංගිකත්ව හා ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය අත්‍යවශ්‍ය වුවද, එය තහනම් දෙයක් ලෙස සැලකෙන අතර ලාබාල වයසේදී ලිංගික ක්‍රියාවන්හි නිරත වීම, ලාබාල වියේදී ගැබිණි බව, හා මාතෘත්වය, නව යොවුන් සබඳතා තුළ බලහත්කාරය, ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනය හා ලිංගික වශයෙන් සම්ප්‍රේෂණය වන රෝග වැළඳීමට මග පෑදීමට ඉඩ ඇති ලිංගික හවුල්කරුවන් කිහිප දෙනෙකු සමඟ සබඳතා හෝ අවදානම් චර්යාවන් වැනි නව යොවුන් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යයට සම්බන්ධ වැඩිවෙමින් පවතින ගැටළු වලට විසඳුම් සැපයීමේ වැදගත් මෙවලමක් ලෙස එය හඳුනාගනු නොලැබේ.
- ශ්‍රී ලංකාවේ සාක්ෂි පාදක සෞඛ්‍ය ආරක්ෂණ සැපයුම පෙරට මෙහෙයවන ශක්තිමත් ජනවිකාශ හා සෞඛ්‍ය දත්ත ශ්‍රී ලංකාව සතුව ඇත. කෙසේ වෙතත්, නිවැරදි, යාවත්කාලීන, ඉලක්කගත හා කාලානුරූප සෞඛ්‍ය ආරක්ෂණ තොරතුරු හා සේවාවන් සැපයීම වළක්වන හිදැස් ගණනාවක් මෙම දත්ත තුළ ඇත. එච් අයි වී වැළැක්වීමේදී හැරුණු කොට දත්ත සම්පූර්ණයෙන්ම පාහේ පිරිමි - ගැහැණු යන ද්විත්ව ආකාරයෙන් පමණක්ම උත්පාදනය කරනු ලබන හෙයින්, LGBTIQ + ප්‍රජාව විසින් මුහුණ දෙනු ලබන ගැටළු පැහැදිලි කර ගැනීමට ලිංගික නැඹුරුතාව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව අනුව වෙන් කරන ලද දත්ත දැනට නොමැත. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි සහ ස්ත්‍රී ලිංගේන්ද්‍රිය විකෘති කිරීම/කැපීම ඇතුළු හානිකර සාම්ප්‍රදායික පිළිවෙත් වල ප්‍රතිවිපාක වැනි ගැටළු සම්බන්ධ දත්ත ද නොපවතින්නේ එම ගැටළුවලට ප්‍රතිචාර දැක්වීමේදී අභියෝගවලට මග පාදමිනි.

## 3 .3 මූලික අවශ්‍යතා

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

### දරිද්‍රතාව

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ස්ත්‍රීකරණය නිල මට්ටම් වලදී පූර්ණ ලෙස විමසා බලා විසඳුම් සපයනු ලැබ නොමැත. කාන්තාවන්ගෙන් 14.2% ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ දිවි ගෙවන අතර එය පිරිමින්ගේ අනුපාතිකය හා සමාන වුවකි. ශ්‍රී ලංකාවේ මිලියන 1.1 ක් වන ගෘහ ඒකක අතරින් 23% ක් ගෘහ මූලික කාන්තාවන්වේ. දිළිඳු කාන්තාවන්, අනෙකුත් නිශ්චිත කාන්තා කණ්ඩායම් අතර ගෘහමූලික කාන්තාවන් සහ වියපත් කාන්තාවන් අතිවිශාල දුෂ්කරතාවන්ට මුහුණ දෙන අතර ඔවුනට ඔවුන්ගේ පවුලේ ආර්ථික පැවැත්ම සහතික කිරීම වෙනුවෙන් අරගලයක නිරත විය යුතුව ඇත. අනෙකුත් සාධක අතර කාන්තාවන්ව නුපුහුණු අඩු වැටුප් ලබන රැකියා කරා තල්ලු කළ වැඩි වන ජීවන වියදමෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ජීවිතයේ තත්ත්වය හා රැකියා තත්ත්ව පරිහානියට පත්ව ඇති බව සාර්ව දත්ත හා ක්ෂුද්‍ර අධ්‍යයන පෙන්නුම් කරයි.
- ස්ත්‍රී සහ පුරුෂ දරිද්‍රතාව ප්‍රමාණාත්මකව සංසන්දනය කිරීම හෝ එය වැඩි වන හෝ අඩු වන ප්‍රමාණය නිශ්චිතව ප්‍රකාශ කිරීම දුෂ්කර කරවමින් හා නිල දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන්නන්ගේ පැහැදිලි චිත්‍රයක් ඉදිරිපත් කිරීම දුෂ්කර කරවමින්, වාර්ගිකත්වය,පදිංචිය, ආබාධිකත්වය, විවාහක අවිවාහක බව, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා සහ වයස වැනි සෑම ක්ෂේත්‍රයකටම අදාල වන ගැටලු සැලකිල්ලට ගනිමින් ස්ත්‍රී පුරුෂ බව අනුව වෙන් කරන ලද දරිද්‍රතාව හා සබැඳි දත්ත පහසුවෙන් ලබා ගැනීමට නොහැකිව පවතී.
- කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය විසින් අත්විඳිනු ලබන දරිද්‍රතා මට්ටම් සහ ඒ සඳහා හේතු ජාතික මට්ටමේ දත්ත මගින් පිළිබිඹු නොවේ. ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ අඩු මට්ටමේ සහභාගිත්වය, අවිධිමත් ශ්‍රම අංශය තුළ වේතන විෂමතා, දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහන් කරා ප්‍රමාණවත් ප්‍රවේශය නොමැති වීම, ව්‍යවසාය සංවර්ධනය ණය හා ආයෝජන කරා සීමිත ප්‍රවේශය, මෙන්ම ආදායම කරා කාන්තාවන්ගේ ප්‍රවේශය හා ඒ සම්බන්ධ තීරණ ගැනීමේ බලය සීමා කරන පීතෘමූලික ආකල්ප සහ කාන්තාවන්ගේ ආර්ථික දායකත්වයන් බොහෝ විට පවුලේ යැපීම සහ ළමයින්ගේ වියදම් සඳහා උපයෝජනය කෙරෙන පවුලේ ආදායමට ඒකාබද්ධ කර ගනු ලැබීම හේතුවෙන් කාන්තාවන් අතර දරිද්‍රතාව පවතින බව ඉලක්කගත පර්යේෂණ පෙන්නුම් කරයි. මෙලෙස, කාන්තාවන්ගේ දරිද්‍රතාව පවුල කෙරෙහි ඔවුන්ගේ සමාජ වගකීම් සම්බන්ධ සම්මතයන් සමග සමීපව බැඳී පවතින අතර ගෘහ ඒකක වගකීම් හා රැක බලා ගෙන පෝෂණය කරන්නන් ලෙස ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමේ පමණක් නොව පවුලේ සහ කුටුම්භයෙහි පැවැත්ම සහතික කිරීම සඳහා නිරන්තරයෙන් ආදායම් ඉපයීමට බොහෝ විට කාන්තාවන්ට බල කෙරෙන අතිරේක බරක් ඔවුන් මත පැටවේ.
- දරිද්‍රතාව පිටුදැකීමේ උපායමාර්ග පවුල් පාදක ගෘහ ඒකක දැඩි ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව සංකල්පනය භාවිතා කරයි. කාන්තාවන්ගේ හා පිරිමින්ගේ වගකීම් සහ සහභාගිත්වය වෙන් කර දැක්වීම් බොහෝ සෙයින් පිලිගනු නොලැබ පවතී. පවුලේ ආසන්නතම සුබසාධන අවශ්‍යතා අනුව ගත් කළ සමාජය තුළ පිරිමින්ගේ භූමිකාව පවුලෙන් බාහිරව පවතින බව දක්නට ලැබේ. කාන්තාවන් වඩාත් වගකීම් සහිත, වග වන හා එබැවින් දරිද්‍රතාව පිටුදැකීමේ යෝජනා ක්‍රම වල වඩා හොඳ සේවාලාභීන් ලෙස සලකනු ලැබේ.

- සුබසාධන සහායට වැඩි යමක් සම්බන්ධ වන සහ ප්‍රජා සහභාගිත්වය, යම් මට්ටමක සාක්ෂරතාව සහ ඉතුරුම් රැස් කිරීම ඇතුළත් වන බොහෝ විට කාන්තාවන්ට ප්‍රතිලාභ දෙන රජයේ දරිද්‍රතාව පිටුදැකීමේ වැඩසටහන් වලට සහභාගි වීමට නොහැකි වීම හේතුවෙන් ඒවා දැඩි දරිද්‍රතාවයෙන් පෙලෙන කාන්තාවන්ව කොන් කරන බවට එම වැඩසටහන් විවේචනය කරනු ලැබේ. සාමාජිකයන් තේරීම, දේශපාලනීකරණය සහ ප්‍රජාව තුළ බල පද්ධති පෝෂණය කිරීම සම්බන්ධයෙන්ද ඒවා විවේචනයට ලක් වේ.

- කුඩා පරිමාණ ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රම ආකාරයෙන් ස්වාධීනව ක්‍රියාත්මක කෙරෙන දරිද්‍රතාව පිටු දැකීමේ ක්‍රම රට පුරා කාන්තාවන් සවිබල ගන්වා ඇති නමුත් සක්‍රිය සහභාගිත්වය හා ඉතිරි කිරීමට හා ණය කළමනාකරණය කිරීමට හැකියාව මෙම වැඩසටහන් වලින් අපේක්ෂිත නිශ්චිත

නිර්ණායක වලට අනුකූල වීමට ඔවුනට නොහැකි වීම හේතුවෙන් දරිද්‍රතාවයෙන් පෙලෙන කාන්තාවන් තවත් විශාල සංඛ්‍යාවක් වෙත ළඟා වීමට ඒවාට හැකි වී නොමැත. මෙබඳු යෝජනා ක්‍රම මගින් ක්‍රියාත්මක කෙරෙන ස්වයං රැකියා වැඩසටහන්, තාක්ෂණය කරා ප්‍රවේශය, වෘත්තීය කුසලතා සංවර්ධනය, කළමනාකරණ පුහුණුව හා වෙළෙඳපොල තොරතුරු යන ප්‍රශස්ත ණය උපයෝජනය සඳහා අවශ්‍ය තීරණාත්මක යෙදවුම් නොමැතිකමින් තවදුරටත් අවහිර කරනු ලැබ පවතී.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන්ම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ප්‍රකාශ කිරීමට දරිද්‍රතාවය සාධකයක් වීම සමඟ ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාව සහ කාන්තාවන්ට එරෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අතර සම්බන්ධය පැහැදිලිය.

## ආහාර සුරක්ෂිතතාව

- ආර්ථික හා ආහාර අර්බුද වල පීඩාවට මුහුණ දීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 30කට ආසන්න ප්‍රමාණයක් ආහාර සුරක්ෂිතතාව නොමැතිව සිටී. මූලිකව ප්‍රධාන ආහාර ඇතුළුව ප්‍රමාණවත් හා පෝෂ්‍යදායක ආහාර සහතික කිරීමේ හැකියාව දැඩි ලෙස අඩපණ කරමින් ආහාර උද්ධමනය සියයට 57.4 ක තැතිගන්වන සුළු අගයක් පවතී. වැඩි කැමැත්තක් නොමැති හා පෝෂණ ගුණයෙන් අඩු ආහාර ගැනීම හා පරිභෝජනය කරන ආහාර ප්‍රමාණය අඩු කිරීම වැනි ඔරොත්තු දීමේ උපායමාර්ග වල ප්‍රතිඵලයක් ලෙස ගෘහ ඒකක පහකින් දෙකක් ප්‍රමාණවත් ආහාර වේල් පරිභෝජනය නොකරයි. කෙටිකාලීන අර්බුද හෝ හදිසි අවස්ථා ජීවනෝපාය ඔරොත්තු දීමේ උපාය මාර්ග භාවිතා කෙරෙන අතර ඒවා ආදායම් උත්පාදන ක්‍රියාමාර්ග සහ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් මිනිසුන්ගේ මධ්‍ය සිට දිගුකාලීන හැකියාවට සෘණාත්මක ලෙස බලපායි.
- දරිද්‍රතා දත්ත බොහෝ සෙයින් ආදායම් මට්ටමේ හා පදිංචි ප්‍රදේශ අනුව කාණ්ඩගත කරනු ලැබ ඇති නමුත් වාර්ගිකත්වය, ආගම, ආබාධිකත්වය හා ලිංගික නැඹුරුතාව වැනි සියළු අංශ ඡේදනය කරන සාධක ප්‍රමාණවත්ව ග්‍රහණය කර නොගනී.
- ගෘහ ඒකක ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවයෙහි ආහාර නිපදවන්නන්, ආරක්ෂකයන්, ආදායම් උපදවන්නන් හා තීරණ ගන්නන් සහ ආර්ථික දුෂ්කරතා පවතින සමයන්හිදී ආහාර සැපයුම් වල ස්ථාවර බව කළමනාකරණය කරන්නන් ලෙස කාන්තාවෝ ආහාර සුරක්ෂිතතාවයෙහි කුළුණු සතර වන ලැබිය හැකි බව, ප්‍රවේශය, භාවිතය හා ස්ථාවර බව තුළ ප්‍රධාන කාර්යභාරයන් ඉටු කරති. පවුල රැක බලා ගන්නන් ලෙස කාන්තාවන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා තුළ මෙම කාර්යභාරයන් ඔවුන් මත බර පටවන අතර බොහෝ විට ඔවුනට ඔවුන්ගේම ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය ඒ වෙනුවෙන් කැප කිරීමට සිදු වේ.
- ඉඩම්, ජලය, බලශක්තිය , ණය, දැනුම සහ ශ්‍රමය වැනි ජීවනෝපාය වත්කම් හිමිකාරිත්වය, ඒවා කරා ප්‍රවේශය හා ඒවා මත පාලනයට අදාල ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතාව නිෂ්පාදනය, පාලනය සහ තීරණ ගැනීමේදී හඬ සම්බන්ධයෙන් කාන්තාවන්ට සෘණාත්මක ලෙස බලපායි. දැඩි දරිද්‍රතාවය, අවිධිමත් හා අඩු වැටුප් ලබන වෘත්තීන්හි සේවා නියුක්තිය, ගෙවීම් නොලබන පවුලේ ශ්‍රමිකයන් හා රැක බලා ගන්නන් ලෙස වැඩ කිරීම මගින් බලපෑමට ලක් වූ කාන්තාවන් සහ ඔවුන් පදිංචි ස්ථානය අනුව විශේෂයෙන්ම ග්‍රාමීය කාන්තාවන්, ගෘහ මූලික කාන්තාවන්, වියපත් කාන්තාවන් හා ආබාධිකත්ව සමඟ ජීවත් වන කාන්තාවන් අතර වඩා අහිතකර තත්ත්වයෙන් පවතී.

## ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව

- ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට අනූවකට ජලය කරා ප්‍රවේශය ඇත. ආරක්ෂා සහිත ජලය හා සනීපාරක්ෂාව අහිමි තැනැත්තන් වන්නේ සමාජීය හෝ ආර්ථික වශයෙන් ආන්තීකරණයට ලක්කරන ලද කාන්තාවන්, ගැහැණු ළමුන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය, මූලික වශයෙන් ම වතු අංශයේ හා ග්‍රාමීය ප්‍රදේශවල දිවි ගෙවන්නන් සහ අන්ත දරිද්‍රතාව සහ ආබාධිකත්වය හේතුවෙන් ආන්තීකරණයට ලක්කරන ලද තැනැත්තන්ය. තේ වතු අයත් වන වතුකරයේ ජීවත් වන තැනැත්තන්ගෙන් සියයට 43ට පමණක් ප්‍රමාණවත් ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතා පහසුකම් කරා ප්‍රවේශය ඇත.
- ජලය කරා ප්‍රවේශය නොමැති සියයට දහය, ගංගා, වැව්, දොළ පාරවල්, උල්පත්, අනාරක්ෂිත ළිං ඇතුළු වැඩිදියුණු නොකළ ජල මූලාශ්‍ර සහ අනෙකුත් ආරක්ෂා රහිත ජල මූලාශ්‍ර මත යැපෙති. ජල

මූලාශ්‍රයට අමතරව, ප්‍රවේශ හැකියාවද (ආරක්ෂා සහිත පානීය ජලය කරා ළඟා වීමට ගත වන කාලය අනුව මනිනු ලැබේ) ආරක්ෂා සහිත පානීය ජලය හා සම්බන්ධයෙන් වැදගත් වන්නේ බොහෝවිට කාන්තාවන්ගේ සම්ප්‍රදායික ගෘහ ඒකක වගකීම් වල කොටසක් ලෙස ජලය සපයාගැනීමේ කාර්යය ඔවුනට පැවරෙන බැවිනි.

- විශේෂයෙන්ම, ජල, සනීපාරක්ෂා සහ ස්වස්ථතා පහසුකම් නොමැති ප්‍රදේශවල ඒවා කළමනාකරණය කිරීම පිණිස ප්‍රජා පාදක සංවිධාන ඇතුළු රාජ්‍ය නොවන සංවිධාන මත යැපීම වැඩිවෙමින් පවතින තත්ත්වයක් සහිතව ශ්‍රී ලංකාවේ ජල, සනීපාරක්ෂා සහ ස්වස්ථතා අංශය සම්පූර්ණයෙන්ම පාහේ රජයේ ආයතන සතුව ඒවා මගින් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එසේ වුවද, විශේෂයෙන්ම රජයේ ආයතන තුළ තීරණ ගැනීමේ හා සේවා සැපයීමේ අංශවල ස්ත්‍රී පුරුෂ සමාජභාව සහ එම අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාලව අයවැය සැකසීම සිදු නොවේ.
- සනීපාරක්ෂාව හා ස්වස්ථතාවට අදාලව බොහොමයක් පවුල්වලට ඔවුන්ගේම නිවෙස් තුළ, නිවසින් පිටත ඔවුන්ගේම වතු වල වැසිකිලි පහසුකම් හෝ පොදු වැසිකිලි කරා ප්‍රවේශය ඇත. ප්‍රවේශය නොමැත්තවුන් පිලිබඳව වෙන් වෙන් දත්ත පහසුවෙන් ලබා ගැනීමට නොමැති අතර පිටත පිහිටා ඇති හා පොදු වැසිකිලි වලින් සැපයෙන පෞද්ගලිකත්වය හා ආරක්ෂාව නොමැතිකම සම්බන්ධ ගැටළු හේතුවෙන් මෙම පහසුකම් භුක්ති විඳීම කාන්තාවන්ට, ගැහැණු ළමුන්ට හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට, විශේෂයෙන්ම සංක්‍රාන්ති ලිංගික හා අන්තර් ලිංගික තැනැත්තන්ට වෙනස් වේ. පිරිමින් සහ කාන්තාවන් යන දෙපාර්ශ්වයටම බලපාමින් සනීපාරක්ෂාව වෙත ප්‍රවේශය අනුව වඩාත්ම ආන්තීක තත්ත්වයට පත්ව ඇත්තේ වතු අංශයයි. පවුලේ ආදායම් උපයන එකම තැනැත්තා කාන්තාවක වන විට එබන්දන්ට නිවසේම පෞද්ගලික වැසිකිලියක් තිබීමේ ඉඩකඩ අඩු වන්නේ එවැන්නක් ඉදි කිරීමට දැරීමට සිදුවන පිරිවැය හේතුවෙනි.
- අධික මිල නිසා සනීපාරක්ෂක තුවා ලබා ගැනීම, ජල පහසුකම් නොමැති පිටත හා පොදු වැසිකිලි භාවිතය සහ සනීපාරක්ෂක තුවා සෞඛ්‍යාරක්ෂිත ආකාරයෙන් බැහැර කිරීම අනුව ගත් කළ ආර්ථව ස්වස්ථතාව බරපතල ගැටළුවකි. ආර්තව ස්වස්ථතාව වෙනුවෙන් පාසල්වල විධිවිධාන සලස්වා නොමැති වීම හේතුවෙන් නව යොවුන් ගැහැණු ළමුන්ට වඩාත් අහිතකර අධ්‍යාපන ප්‍රතිඵල ලැබීමට ඉඩ ඇත. ශ්‍රී ලංකාවේ පාසල් වලින් අති බහුතරයක ගැහැණු ළමුන් වෙනුවෙන් වෙන් කරන ලද වැසිකිළි තිබෙන නමුත් නව යොවුන් ගැහැණු ළමුන්ගෙන් අඩකඩ වැඩි පිරිසක් ඔසප්වීම සිදු වන දින වල පාසල් නොයති. ඔසප් වීම හා ඔසප් රුධිරය අපිරිසිදු ලෙස දකින සංස්කෘතික තහංචිද පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස පාසල් ඇතුළු පොදු ස්ථානවලදී ආර්තව ස්වස්ථතා නිපැයුම් බැහැර කිරීම ගැහැණු ළමුන්, කාන්තාවන්, විශේෂයෙන්ම සිසුවියන් අතර අධෛර්යමත් කිරීම සිදු වේ.
- ජල හා සනීපාරක්ෂක අංශයේ නායකත්ව තනතුරු වල කාන්තාවන් සිටීමට අඩු ඉඩක් ඇති අතර ඔවුන් එබඳු තනතුරු වල සිටීනම් සමාජීය ප්‍රතිවිපාක වලට මුහුණ දීමට වැඩි ඉඩක් ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල ප්‍රජාවන්ට සේවය කරන ප්‍රජා පාදක සංවිධාන හා ජලය භාවිතා කරන්නන්ගේ සංගම් කාන්තාවන්ට රැකියා අවකාශ සපයන නමුත් ඔවුන්ව සාමාන්‍යයෙන් නායකත්ව තනතුරු වලින් බැහැර කර තබනු ලැබේ.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය රටේ බොහොමයක් ප්‍රදේශ වල සඵලදායක ලෙස සිදු කෙරෙන අතර ග්‍රාමීය සහ වතු වැනි කොන් කරන ලද ප්‍රදේශවල තවමත් එය වැඩි දියුණු කිරීම අවශ්‍යව පවතී. මෙම ක්ෂේත්‍රවල තීරණ ගැනීමේ ජාතික සහ උපජාතික මට්ටමේදී කාන්තා සහභාගිත්ව ප්‍රමාණවත් නැත.

### වාසස්ථාන - නිවාස සහ ඉඩම් නොමැතිකම

- ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට , පෞද්ගලික මිලදී ගැනීම, රාජ්‍ය ප්‍රදාන හෝ උරුමය මගින් ඉඩම් ලබාගත හැකි අතර නිවාස අයිතිය වෙනුවෙන් පිරිමින් හා සමාන අයිතිවාසිකම් ඇත. කෙසේ වෙතත් ඉඩම හා නිවාස අයිතිය වෙනුවෙන් නීතියේ ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව අවශ්‍යයෙන්ම සැබෑ ලෙස ඉඩම් හා නිවාස අයිතියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහතික නොකිරීමට ඉඩ ඇත. ඉඩම් හෝ නිවාස හිමිකාරිත්වයට කාන්තාවකගේ නෛතික හිමිකම නීතිය මගින් තහවුරු කෙරෙන නමුත්, ඉඩම් සහ නිවාස සම්බන්ධයෙන් තීරණ ගැනීමට කාන්තාවට නොහැකි නම් හෝ පවුල ඇයට ඉඩම් කිසිවක් උරුම කර නොදෙමින් පිරිමි උරුමක්කාරයන්ට අනුග්‍රහය දක්වන්නේ නම් මෙය හුදෙක් නිරර්ථක චාරිත්‍ර විධියක් පමණක් වීමට ඉඩ ඇත. ඇතැම් වාර්ගිකත්වයන්ට හා ආගම්වලට අයත් කාන්තාවන්ට බලපාන

පෞද්ගලික නීතිවල බලපෑම හේතු කොටගෙන ඉඩම් සහ නිවාස සඳහා අයිතිය කොන්දේසිගත වීමේ හැකියාව පවතී. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සම්මතයන් හා ආකල්ප මගින් ඉඩම් හා නිවාස හිමිකම් තවදුරටත් සෘණාත්මක බලපෑමට ලක්වීමට ඉඩ තිබේ. සම්ප්‍රදායික පීතෘවංශීය ප්‍රජාවන් තුළ පීතෘ මූලික පිළිවෙත් දියණියනට වඩා පුතුන්ට වැඩි සැලකිලි දැක්වීමට හේතු විය හැකි අතර සාමාන්‍යයෙන් සීමිත තත්ත්වයන් යටතේ පමණක් කාන්තාවෝ ස්වල්ප සංඛ්‍යාවක් උරුමයෙන් ඉඩම් ලබති. විශේෂයෙන්ම ආර්ථික අර්බුදයකදී හා තමන් අත් හැර දමනු ලැබුවහොත් ඔවුනට ශක්තිය සහ ආධාරක බලයක් ලබා දෙන වැදගත් වත්කමක් ලෙස කාන්තාවන් ඉඩම් සම්බන්ධයෙන් සිතන ආකාරයත් සමඟ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ඉඩම් හා සබැඳී අනුබෝධයන් හා අභිලාෂයන් විවිධාකාර හා සියුම් වූ වෙනස්කම් සහිත වුවද ඔවුනට ඉඩම්වල නෛතික හිමිකාරිත්වය තිබිය යුතුයැයි සියලු කාන්තාවන් විශ්වාස කරන බවක් නොපෙනේ.

- ශ්‍රී ලංකාවේ ජීවත් වන මිලියන හයක් වූ පවුල් අතරින්, යම් ආකාරයක නිවසක් ඇත්තේ මිලියන 5.2කට පමණකි. එමෙන්ම ශ්‍රී ලංකාවේ ඉඩම් හා නිවාස වල හිමිකාරිත්වය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් කරන ලද දත්ත වල බරපතල අඩුවක් පවතී. කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර කණ්ඩායම් විසින් ඉඩම් හා නිවාස හිමිකාරිත්වය දැරීම දක්නට නොමැත.

- ඉඩම් හා නිවාස කරා ප්‍රවේශය නොමැති වීමට හේතුවන ප්‍රධාන ගැටළු වන්නේ දරිද්‍රතාව සහ ඉඩම් නොමැතිකමයි. කාන්තාවන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සහ කොන් කරන ලද පිරිමින් විසින් ඉඩම් හා නිවාස හිමිකාරිත්වය ගැටුම හේතුවෙන් බරපතල ලෙස අහිතකර බලපෑමට ලක් විය. විශේෂයෙන්ම රටේ උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රජාවන්, වැවිලි ප්‍රජාවන්හි ජීවත් වන්නන්, නාගරික අඩු ආදායම් ප්‍රදේශ වල දිවි ගෙවන්නන් සහ ආපදා අවදානමට ලක් විය හැකි ප්‍රදේශ වල දිවිගෙවන්නන් මෙසේ බලපෑමට ලක් විය. නිවාස තිබෙන විටද , බේදජනක තත්ත්වයන්, තාවකාලික ව්‍යුහයන්, දුර්වල වාතාශ්‍රය සහ පිරිසිදු ජලය හා ආරකෂා සහිත සනීපාරක්ෂාව කරා ප්‍රවේශය ප්‍රමාණවත් නොවීම ඇතුළු සුනිසි ජීවිතයකට බාධා ඇති කරවන ගැටළු පවතී. ගෘහ මූලික කාන්තාවන් සිටින කුටුම්භ, ආබාධිකත්ව සහිතව ජීවත් වන තැනැත්තන් අතර සහ වියපත් තැනැත්තන් අතර ඉඩම් හා නිසි නිවාස කරා ප්‍රවේශය නොමැති කම තවදුරටත් දක්නට ලැබේ.

- සාමාන්‍ය සහ අනුසිරිත් නීති වල අංශ ගණනාවක් සමානාත්මතාවයෙන් තොර උරුමය සහ හිමිකාරිත්ව පරිචයන් දිගින් දිගටම පැවතීමට ඉඩ සලසන අතර ඉඩම් හා නිවාස කරා කාන්තාවන්ගේ ප්‍රවේශය සීමා කරයි. පෞද්ගලික නීති සහ විවාහය සම්බන්ධ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ආකල්ප, විශේෂයෙන්ම දායාද දේපල සම්බන්ධයෙන් කාන්තාවන් කෙරෙහි වෙනස්කම් දක්වන සැලකිල්ල නිර්මාණය කරයි. මෙම පෞද්ගලික නීති වල කාන්තාවන් හා ඔවුන්ගේ වත්කම් වල 'භාරකාරත්වය' පිරිමියෙකු විසින් දරනු ලැබීමේ අදහස, කාන්තාවන් සවිබලගැන්වීමට සහ ඉඩම් හිමිකාරිත්වයට හා උරුම කර ගැනීමට කාන්තාවන් සතු අයිතියට ප්‍රධාන බාධකයකි. පවුල් බොහෝ විට ඔවුන්ගේ දියණියගේ සැමියාට හා ඔහුගේ පවුලට දුන් දායාදය ඇයගේ උරුමය ලෙස සලකයි. දායාදාය නීතිය මගින් විශේෂිතව තහනම් කරනු ලැබ නොමැති අතර එය වෙනස් ප්‍රකාශන හා මට්ටම් වලින් තවදුරටත් ඉතිරිව පවතින පිළිවෙතකි.

- සමෘද්ධි යෝජනා ක්‍රමය, ක්ෂුද්‍ර ණය වැඩසටහන් හා විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් විශේෂ වැඩසටහන් වැනි රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන දරිද්‍රතාව පිටු දැකීමේ යෝජනා ක්‍රම තුළ මිනිසුන් වෙනුවෙන් යෝජනා ක්‍රම තිබුණද, අඩු ආදායම් ලාභීන්ට විශේෂයෙන්ම කාන්තාවන්ට, ඉඩම් මිලදී ගැනීම සහ නිවාස ඉදිකිරීම සඳහා විධිමත් මූල්‍ය පහසුකම් කරා ප්‍රවේශ වීම තදබල අවහිරයකි. මූල්‍යමය බාධක සහ අවිධිමත් රැකියා හේතුවෙන් අඩු ආදායම්ලාභී ජනගහනයෙන් නිවාස ණය කරා ප්‍රවේශය ලබන්නේ සියයට 20ක් පමණක් බව වාර්තා වේ. ලබාගත හැකි ණය පහසුකම් කරා ප්‍රවේශ වීමේදී නෛතිකව පිලිගත හැකි ඉඩම් ඔප්පු නොමැතිකම තදබල අවහිරතාවක්ව පවතී.

- ඉඩම් නොමැති තැනැත්තනට රජයේ ඉඩම් ප්‍රදානය කිරීම, දුප්පතුන් වෙනුවෙන් ණය පහසුකම් සහ හිමිකම් ආරවුල් ඇතුළුව ආරවුල් විසඳීම කරා ප්‍රවේශය සම්බන්ධ තොරතුරු දැන ගැනීම පුළුල් ලෙස සිදු නොවේ.

## 3 .4 මාධ්‍ය

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- නව තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ ආගමනයත් සමඟ ශ්‍රී ලංකාවේ මාධ්‍ය දර්ශනය කැපී පෙනෙන වෙනස්කම් සහිතව ජවසම්පන්නව පවතී. කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය ඒකාකෘතිකරණය තුරන් කිරීමට මග පාදමින් කාන්තාවන් ධනාත්මකව නිරූපණය කිරීම තුලින් කාන්තාවන් අභිවෘද්ධිය කරා දායක වීමේ වඩා විශාල විභවයක් එය සතුව ඇත.

- මාධ්‍යවේදීන්, වාර්තාකරුවන්, සමාජ මාධ්‍ය නිර්මාණකරුවන් හා බලපෑම් කරන්නන් වැනි සියළු ආකාරයේ මාධ්‍ය තුල කාන්තා සහභාගිත්වය ශ්‍රී ලංකාව තුළ දක්නට ඇත. එසේ වුවද, සංඛ්‍යාවන් හා හඬ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරයක් පවතී. කාන්තාවන් කිහිප දෙනෙකු විධිමත් මාධ්‍ය ආයතනවල සහ පාලන හා අධීක්ෂණ ආයතන වල තීරණ ගන්නා මට්ටමේ තනතුරු උසුලන නමුත් පිරිමින් හා සැසඳූ කල එය කුඩා සංඛ්‍යාවකි.

- අර්ධකාලීන හා නිදහස් මාධ්‍යවේදීන් ඇතුළුව ආසන්න වශයෙන් මාධ්‍යවේදීන් 4000ක් ප්‍රධාන ප්‍රවාහ මාධ්‍ය වල සේවය කරන බවට ඇස්තමේන්තු කර ඇත. ප්‍රධාන ප්‍රවාහ මාධ්‍ය තුළ සේවය කරන කාන්තාවන් පිළිබඳව ජාතික සංඛ්‍යාලේඛන දැන ගැනීමට නොමැත. මාධ්‍ය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී මානයන් සම්බන්ධයෙන් පවතින එකම අධ්‍යයනය ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් 2011 දී මෙහෙයවන ලද සමීක්ෂණයකි. විද්‍යුත් මාධ්‍ය වන ගුවන් විදුලි (සියයට 35.3) සහ රූපවාහිනී මධ්‍යස්ථානවල (සියයට 33.3) ලෙස ඉතා සුළුවෙන් ඉහළ අගයක් සහිතව කාන්තාවන් ප්‍රතිශතය සියයට 29.3 ක් බව සමීක්ෂණය හෙළි කර ගත්තේය. කාන්තාවන් වැඩිම සංඛ්‍යාව ඉංග්‍රීසි භාෂාවෙන් පළවන පුවත්පත් වල (සියයට 33.4) වූ අතර සිංහල මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය වල සියයට 25.7 ක් පමණක්ද දෙමළ මාධ්‍යවල සියයට 28.8 ක් ද විය. පුවත්පත් මණ්ඩලයේ ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයේ සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 14 දෙනා, අතර කාන්තාවන් දෙදෙනෙක් සිටියහ. තීරණ ගන්නා මට්ටමේ කාන්තාවන් පුවත්පත් වල සියයට 13ක්, ගුවන්විදුලියේ සියයට 14 ක් සහ රූපවාහිනියේ සියයට 6 ක් විය. ශ්‍රී ලංකාවේ මාධ්‍ය සහ පුවත්පත් කලාව වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සාධාරණත්වය සඳහා ප්‍රඥප්තිය (2006) ක්‍රියාවට නංවනු ලැබ නොමැත.

- ජාතික මාධ්‍ය ප්‍රතිපත්තිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආමන්ත්‍රණය කරන්නේ අවම වශයෙනි. එහි උපායමාර්ග 26 අතුරින් දෙකක් පමණක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සබැඳීව ඇත. එයට අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාල කරුණු වලදී ප්‍රතිපත්තියක් ලෙස සාධාරණ හා යුක්ති සහගත සැලකීම සහතික කරන මාධ්‍ය පිළිවෙත් තිබිය යුතු නමුත්, ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උපාය මාර්ග වැදගත් ඒවා වුවත් මාධ්‍ය පිරිස් අතර පුහුණුව සහ දැනුවත් කිරීමට පමණක් සීමා වී ඇත.
  තවද, 2015 වන විට ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබීම නිසා තාවකාලිකව නැවතී තිබුණි.

- කාන්තාවන් හා මාධ්‍ය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර වන්නේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සාධාරණ සහ වගකීම් සහගත වාර්තාකරණයයි. සිදුවීම් සංවේදී ලෙස වාර්තා කිරීම හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමට දායක වීමට සහ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමට දායක වීමේදී නව කාර්යභාරය මහජනතාවට අවබෝධ කර ගැනීමට සැලැස්වීමේදී මාධ්‍ය සතු බලය පූර්ණ ලෙස යොදවා ගනු ලැබ නොමැත.

- කාන්තාවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට එරෙහි වෙනස්කොට සලකන සුළු භාෂාව හා වෛරී ප්‍රකාශන සියළු ආකාරයේ මාධ්‍ය තුළ කණස්සල්ල දනවන කරුණකි.

- මාධ්‍ය තුළ හා මාධ්‍ය ආයතන තුළ කාන්තාවන්ට හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට සදාචාරාත්මක සැලකීම සහ කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය ඝෘණාත්මකව නිරූපණය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සකස් කර තිබෙන නමුත් ක්‍රියාත්මක කරනු ලැබ නොමැත.

- මාධ්‍ය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමේ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහ පූර්ණ ලෙස ක්‍රියාත්මක කර නොමැති අතර කඩදාසියට පමණක් සීමා වූ බැඳීම් ලෙස පවතී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කෙරෙන භාෂණයේ නිදහස අයිතිවාසිකම සහ තොරතුරු දැන ගැනීමේ පනතින් ඇති කර තිබෙන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව දැනුම හා දැනුවත්බව කාන්තාවන් අතර පුළුල්ව පැතිරී නොමැති අතර එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් එම අයිතිවාසිකම භුක්ති නොවිඳීම හා වැඩි භුක්ති විඳීම වෙනුවෙන් අධිවාචනයේ නොයෙදීම සිදු වේ.

- කාන්තාවන්ගේ හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයෙහි අයිතිවාසිකම් වලට ආධාරක වීමේදී මාධ්‍ය සතු කාර්යභාරය ප්‍රමාණවත් ලෙස විමසා බලනු ලැබ නොමැති අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සාධනීය ලෙස ශක්තිමත් කිරීම කරා මාධ්‍ය ඉටු කරන කාර්යභාරයෙහි අඩුපාඩු ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය කර නොමැත.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා සහ කාන්තාවන්ගේ ප්‍රකාශනය වෙනුවෙන් අවකාශය සැපයීම සඳහා ඩිජිටල් තාක්ෂණ උපයෝජනය කෙරෙන නමුත් පෞද්ගලික දේ පොදු බවට පත්වන අවකාශය තුළ එය පීතෘ මූලික අසාධාරණ හා ප්‍රචණ්ඩ ව්‍යුහයන් ශක්තිමත් කරන්නේ කාන්තාවන් හා ගැහැණු ළමුන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය ලිංගික සූරාකෑමට, ප්‍රචණ්ඩත්වයට හා කොන් කරනු ලැබීමට වඩාත් අවදානමට පත් කරමිනි.

- කාන්තා මාධ්‍යවේදීන් සියළු මාධ්‍යවේදීන්ට එරෙහිව කෙරෙන ප්‍රචණ්ඩත්වයේ හා අඩන්තේට්ටම් වල වින්දිතයන් වී ඇති අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අඩන්තේට්ටම් හා අපයෝජනය හරහා වැඩියෙන් ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වී ඇත.

- කාන්තාවන් නිරූපනය කෙරෙන ආකාරය දිගින් දිගටම සංස්කෘතික තත්වාරෝපණය ශක්තිමත් කරන මාධ්‍ය ආයතන විසින් ලාභ උපරිම කර ගැනීමේ අරමුණ ඇතිව වාණිජ කාර්යයන් වෙනුවෙන් කාන්තා රූප භාවිතා කිරීම දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කෙරෙන නමුත් තවමත් ආමන්ත්‍රණය කර පිලියම් යෙදීමට ඉතිරිව තිබෙන ගැටළුවයි.

- වෘත්තියක් ලෙස මාධ්‍ය තුළ කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය ඉලක්ක කරගත් අධ්‍යාපනයෙහි හා පුහුණුවෙහි හිදැස් පවතින්නේ මාධ්‍ය තුළ කාන්තාවන්ගේ රැකියා සහ රැකියා අභිවෘද්ධි අවස්ථා දැනට තිබෙන අධ්‍යාපන හා පුහුණු අවස්ථා සමඟ උපායමාර්ගිකව සම්බන්ධ නොවූ තත්ත්වයක් තුළය. මාධ්‍ය ක්ෂේත්‍ර, විශේෂයෙන්ම ප්‍රධාන ප්‍රවාහ මාධ්‍ය වලට ප්‍රවිෂ්ඨ වන කාන්තාවන් මත පැටවෙන ඒකාකෘතිකරණයට ලක් වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා සහ අපේක්ෂාවන් මගින් මාධ්‍ය තුළ රැකියා තෝරා ගැනීම කෙරෙහි දිගින් දිගටම සෘණාත්මක බලපෑම් ඇති කෙරේ.
- කාන්තාවන් විවිධාකාර මාධ්‍ය භාවිතා කිරීම පිරිමින්ට සාපේක්ෂව අඩුය. කාන්තාවන් අතර පවතින ඉහළ සාක්ෂරතා අනුපාතික පිරිමින් හා සම මට්ටමින් ඔවුන්ව ප්‍රධාන ධාරාවේ මාධ්‍ය පාරිභෝගිකයන් බවට පත් කරවන නමුත් කාන්තාවන් මත පැටවෙන සෘණාත්මක ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා හා අපේක්ෂාවන් හේතුවෙන් කාන්තාවන්ගේ මාධ්‍ය අන්තර්ක්‍රියා පිරිමින්ට වඩා පහළ මට්ටමක ඇත.

- කාන්තාවන්ගේ රාජ්‍ය නොවන හා සිවිල් සමාජ සංවිධාන මාධ්‍ය තුළ දායක වන්නන්, භාවිතා කරන්නන්, කාන්තා අයිතිවාසිකම් හා මාධ්‍ය තුළ කාන්තාවන් ධනාත්මකව නිරූපණය කිරීම සම්බන්ධව සුපරීක්ෂාවෙන් සිටින්නන් හා අධිවාචනයෙහි යෙදෙන්නන් ලෙස ශක්තිමත් සහභාගිත්වයක් සහිතව සිටී.

# 04 වැනි තේමාගත ක්ෂේත්‍රය: පරිසරය සහ ආපදා කළමනාකරණය

## සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- පරිසරය මත යැපෙන ප්‍රමාණය  නිශ්චය කිරීමේදී පමණක් නොව පාරිසරික හානි හා ආපදා වල අවදානමට ලක්වීමේ ප්‍රමාණය සහ බලපෑම්වල දරුණුකමද නිශ්චය කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන නිර්ණායක අතර පවතී.
- පාරිසරික අර්බුද සහ සංවාද, සමාජයක් තුළ සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සබඳතා වෙනස් කිරීමේ නැඹුරවැක් ඇත. ජාත්‍යන්තර බැඳීම් සහ දේශීය නීති තුළ අවධාරණය කෙරෙන පරිදි, ස්ත්‍රී පුරුෂ සමාජභාවීයව සැලකිලිමත් විය යුතු කරුණු හා දෘෂ්ටිකෝණ සැලකිල්ලට ගැනීම තිරසාර සංවර්ධනය වෙනුවෙන් සහ සංවර්ධන සහ පාරිසරික ප්‍රතිපත්ති කාන්තාවන් මත ඇති කරන බලපෑම තක්සේරු කිරීම සඳහා ජාතික හා ප්‍රාදේශීය මට්ටම් වල යාන්ත්‍රණ ශක්තිමත් කිරීම හෝ පිහිටුවීම තීරණාත්මක වේ.
- මේ දක්වා වන ප්‍රතිපත්ති දේශගුණික විපර්යාස වල බලපෑම් අත්දැකීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් මෙන්ම අනුවර්තනය වීම හා බලපෑම් අවම කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන සුළු ස්වභාවයේ උපායමාර්ග යොදා ගැනීම හඳුනාගෙන නොමැත.
- වන විනාශය සහ වන සංරක්ෂණය, ආපදා අවතැන්වීම සහ නැවත පදිංචි කිරීම, මිනිස් වන සත්ව ගැටුම, අපද්‍රව්‍ය, කෘෂි රසායන වල බලපෑම්, ගෘහස්ථ වායු දූෂණය, වැනි ප්‍රධාන ගැටළු කාන්තාවන් කෙරෙහි බලපෑම තවදුරටත් වැඩි කරන එම ගැටළු වල අන්තර් සම්බන්ධිත බව සැලකිල්ලට ගනිමින් ආමන්ත්‍රණය කළ යුතුව ඇත.
- පාරිසරික ආපදා අවදානම අඩු කිරීමේ ප්‍රතිචාර, දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම, පුනර්ජනනීය බලශක්තිය කළමනාකරණය තුළ කාන්තා සහභාගිත්වය සහ පාරිසරික ආරක්ෂාව වෙනුවෙන් තාක්ෂණය කරා ප්‍රවේශය ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතාව පවතින ක්ෂේත්‍ර වේ.

# 05 වැනි තේමාගත ක්ෂේත්‍රය: තීරණ ගැනීමේදී සමානාත්මතාව

## සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- බලය බෙදා හදා ගැනීමේ හා තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි කිරීමේදී ශ්‍රී ලංකාව තුළ දේශපාලන, ආර්ථික සහ සමාජ ආර්ථික සන්දර්භය මෑත වර්ෂ වලදී අඩු වැඩි වීමක් පෙන්නුම් කර ඇත.
- ශ්‍රී ලංකාවේ කාන්තාවෝ හා පිරිමි 1931 දී සර්වජන ඡන්දබලය අත්කර ගත්හ. එසේ වුවද, කාන්තාවන් ඡන්දය ප්‍රකාශ කිරීමේ හා දේශපාලන ක්‍රියාකාරකම් වල සක්‍රියව නිරත වන නමුත් දේශපාලන නිලතල වල ඔවුන් තථ්‍ය නියෝජනය දුර්ලභය.
- ජනගහනයෙන් සියයට 50 ක් කාන්තාවන්ගෙන් සැදුම් ලබන නමුත්, ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාවලි තුළ ඓතිහාසික වශයෙන් කාන්තා සහභාගිත්වය අවම වී තිබේ. වර්තමානයෙහි රටේ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය කලාපයෙහි අඩුම මට්ටමේ පවතී. ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලනය තුල කාන්තා නියෝජනය කිසිදු අවස්ථාවක සියයට 6 ඉක්මවා නොමැත.
- 2016 දී පළාත් පාලන නීති සංශෝධනයෙහි ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලනය තුළ කාන්තාවන්ට සියයට 25ක කෝටාවක් ව්‍යවස්ථාදායක වෙන් කිරීම සිදුවූ අතර එය සර්වජන ඡන්ද බලය අත් කර ගැනීමෙන් පසුව කාන්තාවන් ලැබූ ඓතිහාසික ජයග්‍රහණයකි. පළාත් පාලනයට කැපී පෙනෙන කාන්තාවන් සංඛ්‍යාවක් ප්‍රවිෂ්ඨ වී තිබියදීත්, තීරණ ගැනීමේ බලය ඇති මට්ටමේ කාන්තා නියෝජනය, දේශපාලන තීරණ වලදී හඬ හා අර්ථවත් සහභාගිත්වය, සහ ඒක්කෘතිකරණය වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන්ට අනුව කාන්තාවන්ට කාර්යභාරයක් හා වගකීම් පැවරීම සම්බන්ධ ගැටළු තවමත් පවතී.
- ජනාධිපති හා අග්‍රාමාත්‍ය තනතුරු ඇතුළුව ඉහළම මට්ටමේ තීරණ ගැනීමේ තනතුරු තනි කාන්තාවන් විසින් හොබවනු ලැබ තිබුනද, මෙම තනි ජයග්‍රහණ සමාජය තුළ කාන්තාවන්ගේ බලයෙහි පොදු දියුණුවක් පිලිබිඹු කරන බවට සැලකීමේ හැකියාවක් නොමැත. මූලික වශයෙන්ම දේශපාලනයෙහි එබඳු තීරණ ගන්නා තනතුරු හෙබවූ කාන්තාවන් හෝ බහුතරය එම තත්ත්වයට පැමිණියේ සමාජය තුළ වරප්‍රසාද හා බලපෑම් කිරීමේ සහායක ජාල වල ශක්තිය හේතුවෙනි. ඇතැමුන් දේශපාලන අනුග්‍රහයේ ප්‍රතිලාභ ලබා ඇත. සමාජයේ යම් තනතුරු අත්කරගත් කාන්තාවන් පවා එසේ කර තිබෙන්නේ ඔවුන්ගේම හැකියාව හේතුවෙන් නොව යම් අසාධාරණ වාසියක්, වරප්‍රසාදයක් හෝ අනුග්‍රහයක් නිසා යැයි සමාජය දැකීම හේතුවෙන් මෙම තනතුරු සමස්තයක් ලෙස කාන්තාවන් කෙරෙහි සෘණාත්මක බලපෑමක් පවා ඇති කර තිබේ. මෙයින් ප්‍රදර්ශනය වන්නේ ජාතියේ සදාචාරාත්මක බවෙහි හා ගෞරවයෙහි සුරක්ෂිතාගාර ලෙස කාන්තාවන්ගේ භූමිකාව දකින කිඳා බැස ඇති ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන් හා වටිනාකම් හේතුවෙන් බලය සහිත ඉහළ තනතුරු අත් කර ගැනීමට කාන්තාවන්ගේ තනි හැකියාව ප්‍රතික්ෂේප කරන සමාජයේ පීතෘ මූලික අදහස් වන අතර මෙය කාන්තාවන්ගේ යහපත්කම සහ චරිතය සියුම් පරීක්ෂාව තවදුරටත් වැඩි කිරීමට මග පාදා ඇත.
- දේශපාලනයෙහි සහ ඇතැම් අංශවල තීරණ ගන්නා මට්ටම් වල කාන්තාවන් නොසිටීම හේතුවෙන්, කාන්තාවන් සුළු සංඛ්‍යාවන්ගෙන් දක්නට ලැබෙන ඉහළ මට්ටමේ දේශපාලන සහ අනෙකුත් තනතුරු වල සහභාගිත්වය අත් කර ගැනීමට කාන්තාවන් වෙනුවෙන් අවකාශය නිර්මාණය කිරීම පිණිස ඡන්දදායක අධ්‍යාපනය සහ මෙම පීතෘ මූලික ව්‍යුහයන් හා ආකල්ප සම්බන්ධ සංවාදය ඇතුළුව සක්‍රිය දැනුවත් කිරීම හා අධ්‍යාපනය අවශ්‍යව පවතී.
- තවද දේශපාලන විෂයයෙහි ස්ත්‍රී පුරුෂ සමාභාවී සමානත්වය නිර්මාණයේදී ඉදිරියට ගමන් කිරීමට රටේ අධ්‍යාපන ප්‍රගමනය අසමත් වී ඇත. කාන්තාවන්ට දේශපාලනයේ නිරත වීමට ඇති ආයතනික හා ව්‍යුහමය බාධක රැසකි. ඒවා අතර කාන්තාවන්ගේ ප්‍රජනන භූමිකාව හා සබැඳී ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා/ඒකාකෘති මූල්‍ය සාධක, දේශපාලනය හා බැඳුනු ප්‍රචණ්ඩත්වය සහ සව්ශක්තිය, කාන්තාවන්ට නාම යෝජනා ලබා දීමට දේශපාලන පක්ෂ වල අකමැත්ත, කාන්තා දේශපාලන ක්‍රියාකාරින්ට එරෙහි දැඩි සෘණාත්මක ප්‍රතිචාර, ඔවුන්ගේ හැසිරීම, තීරණ සහ කාර්යසාධනය සම්බන්ධ නුවමනා විවේචන සහ ඔවුන්ගේ කුසලතා සහ අධ්‍යාපනය තුළ අවම ආයෝජනය කාන්තාවන් දේශපාලන නියෝජනය අත් කර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබේ.

- දේශපාලන ක්‍රියාවලි පිළිබඳව කාන්තාවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන් මෙහෙයවනු ලැබුවද, දක්ෂතා මගින් තීරණය වන දේශපාලන සංස්කෘතියක් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ගැළපෙන මධ්‍යස්ථ දේශපාලන සංස්කෘතියක් නොපවතින ක්‍රමයක් තුළ, දේශපාලන තනතුරු වල කාන්තා නියෝජනය අවම වීමේ ගැටළුව තවදුරටත් පවතී.
- දේශපාලනයෙහි තීරණ ගන්නා මට්ටම් වලට ප්‍රවිෂ්ඨ වීමට කාන්තාවක් සූදානම් කිරීමේදී කාන්තාවන්ට නාම යෝජනා ලබා දීමේදී හා ඔවුන් තේරී පත්වීම සහතික කිරීමට කටයුතු කිරීමේදී දේශපාලන පක්ෂ ඉටු කරන කාර්යභාරය, සියළු දේශපාලන ආයතන තුළ අඩු සංඛ්‍යා වලින් කාන්තා නියෝජනය සමග බැඳී පවතී. කණස්සල්ල දනවන කරුණු ප්‍රකාශව තිබියදීත් දේශපාලන පක්ෂ කාන්තා දේශපාලනඥයන් වැඩි කිරීමට ප්‍රමුඛතාව ලබා දී නැත. මෙම ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගිත්වය අවම වීමට හේතු සංකීර්ණය. ශ්‍රී ලාංකික කාන්තාවන් මත පැවරී ඇති සම්ප්‍රදායික කාර්යභාරය, පිරිමි නායකත්වය පිලිගැනීම, අනම්‍ය මැතිවරණ ක්‍රම හා නීති හේතුවෙන් කාන්තාවන් ක්ෂේත්‍රය තුළට ගෙන ඒවා තහවුරු කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම කල්ගත වන හා විවාදාත්මක ක්‍රියාවලියක් වීම, වඩ වඩා ප්‍රචණ්ඩ වන දේශපාලන වාතාවරණය හා පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ දැඩි ලෙස මධ්‍යගත වූ දේශපාලන පක්ෂ විසින් අපේක්ෂකයන් තෝරන විට කාන්තාවන්ට නාම යෝජනා ලබා දීමේ සීමාවන් එබඳු හේතු අතර වැදගත් වේ.
- දේශපාලන ක්ෂේත්‍රයෙන් පරිබාහිරව ශ්‍රී ලංකාවේ කාන්තාවන්, අධ්‍යාපනය වැනි විශේෂිත අංශවල රජයේ නිලතල වල මෙන්ම ප්‍රජා හා අවිධිමත් සංවිධානවල සැලකිය යුතු නායකත්වය ප්‍රදර්ශනය කර තිබේ. කෙසේ වෙතත්, ආයතනික පාලනයෙහි ඉහලම මට්ටම් වලින් ඉවත්ව සිටීමට කාන්තාවන් විසින්ම ස්වේච්ඡාවෙන් තෝරා ගැනීම හෝ කාන්තාවන් ඔවුන්ගේ තනතුරු අත් කර ගැනීම වැලැක්වීම පිණිස පෞද්ගලික අංශයෙහි පිරිමි ප්‍රධානීන් විසින් ප්‍රවේශමෙන් ස්ථාපනය කරන ලද ස්පර්ශ කළ නොහැකි බාධකයක ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශයේ බලය හා තීරණ ගැනීමේ තනතුර කරා ප්‍රවේශ වීමට කාන්තාවන් බලවත් පරිශ්‍රමයක් දරා ඇත.
- රටේ පශ්චාත් යුද තත්ත්වය තුළ සාම ක්‍රියාවලිවල තීරණ ගැනීමේදී හා නායකත්වයෙහි කාන්තා සහභාගිත්වය අවම මට්ටමක පවතී.
- තොරතුරු තාක්ෂණ අංශය වැනි නව හා නැගී එන අංශ තුළ, සමස්ත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශ්‍රම බලකායෙන් සියයට පහට අඩු ප්‍රතිශතයක් කාන්තාවන් වන අතර ඔවුන් අඩු කුසලතා සහිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රැකියාවලට ඒකරාශී වී සිටීමේ නැඹුරුවක් පවතී. කාන්තාවන්ගේ අඩු සහභාගිත්වය හේතුවෙන් හා පිරිමින්ට වඩා කාන්තාවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් අඩු වැටුප් කාණ්ඩවල සිටීම සමඟ තොරතුරු හා සන්නිවේදන වෘත්තිකයන් අතර සියළු වැටුප් තල හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනසක් ද පවතී.
- සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍ය ක්ෂේත්‍රය තුළ කාන්තා සහභාගිත්වය සැලකිය යුතු මට්ටමක තිබෙන නමුත් ඒ තීරණ ගැනීමේ මට්ටමේදී නොවේ.
- සිවිල් සමාජ සංවිධානවල, රාජ්‍ය නොවන සංවිධානවල සහ ප්‍රජා පාදක සංවිධානවල කාන්තා සහභාගිත්වය අංශය අනුව වෙනස් වේ. කාන්තාවන් වෙනුවෙනේ සුබසාධන, ඉතුරුම් හා ණය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් කටයුතු කරන සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම්වලට ආධාර කරන කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන හා කාන්තාවන්ගෙන් සැදුම් ලබන සංවිධානවල කාන්තාවන් සක්‍රියව සහභාගි වන අතර කාන්තාවන් කෙරෙහි කේන්ද්‍රගත නොවූ සංවිධාන තුළ කාන්තාවන් ඒකාබද්ධ කර ගැනීම අල්පය.

# 06 වැනි තේමාගත ක්ෂේත්‍රය: යුක්තිය, සාමය සහ ආරක්ෂාව කරා ප්‍රවේශය

## 6.1 යුක්තිය කරා ප්‍රවේශය

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිරිමින් සහ කාන්තාවන් නීතිය ඉදිරියේ සමාන බව තහවුරු කරන අතර ලිංග භේදය මත පදනම්ව වෙනස් කොට සැලකීමට අවස්ථාව නොදෙයි. දේශීය නීති රාමුව, කාන්තාවන්ගේ අයිතිවාසිකම් හඳුනාගන්නා සහ ඒවා උල්ලංඝනය කරනු ලැබූ විට පිළියම් වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ අනෙකුත් යාන්ත්‍රණ ඉඩ සලස්වයි.
- විධායක හෝ පරිපාලනමය ක්‍රියාමාර්ග මගින් සමානාත්මතාවට ඇති තම අයිතිය උල්ලංඝනය කරනු ලැබූ කවර හෝ තැනැත්තකුට ඉහළම අධිකරණයෙන් සහන පැතිය හැකි බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තවදුරටත් විධිවිධාන සලස්වයි. කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් නීති, රෙගුලාසි හෝ පරිපාලනමය ක්‍රියාමාර්ග මගින් සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් විශේෂ විධිවිධාන සැලැස්විය හැකි බවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිලිගනී.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කිරීම සහ ශක්තිමත් අධිකරණ පද්ධතියක් තිබියදීත් ශ්‍රී ලංකාවේ ප්‍රබල අධිකරණ පද්ධතිය කරා ප්‍රවේශ වී එයින් අවශ්‍ය සහන ලබා ගැනීමට කාන්තාවන්, පිරිමින්, ගැහැණු ළමුන්, පිරිමි ළමුන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය අසමත් වන අතර ඒ අනුව යුක්තිය කරා ප්‍රවේශ වීමට ඔවුනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති අයිතිය අහිමි කරනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ නීති ස්වභාවයෙන් මෙන්ම ඒවා ආදේශ කෙරෙන ආකාරය අනුවද සංකීර්ණය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉහළම නීතිය ලෙස තිබියදී නීති පද්ධතිය සාමාන්‍ය නීතියෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිලිගනු ලබන සමානාත්මතා අයිතියට ඇතැම් අවස්ථාවලදී පටහැනි වන මුස්ලිම් නීතියෙන්, තේසවලමේ නීතියෙන් හා උඩරට නීතියෙන් සමන්විත පෞද්ගලික නීති වලින් සැදුම් ලබයි.
- කාන්තාවන් (සහ ළමුන්ගේ) ශාරීරික ඒකාග්‍රතාව ආරක්ෂා කිරීමේදී අපරාධ නීතිය ශක්තිමත් කිරීම සඳහා 1995 දී හා 1998 දී දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන ලදී. ස්ත්‍රී දූෂණ නීති වලට සංශෝධන, ව්‍යවස්ථාපිත දූෂණය හඳුනා ගැනීම, නීති විරෝධී ලිංගික සංසර්ගය වෙනුවෙන් කවර හෝ තැනැත්තකු සම්පාදනය වැනි වැරදි, මිනිස් ජාවාරමට එරෙහි නීති, ලිංගික අපයෝජනය සහ ලිංගික අඩන්තේට්ටම් ඇතුළුව ලිංගික ප්‍රචණ්ඩත්වය අපරාධ වරදක් බවට පත් කිරීම, ව්‍යභිචාරය වරදක් ලෙස පිලිගැනීම සහ ලිංගික අපරාධ වල වින්දිතයන්ගේ අනන්‍යතාව හෙළි කරන විස්තර ප්‍රසිද්ධ කිරීම තහනම් කිරීම මෙම සංශෝධන අතර වේ. අයාල ආඥාපනත වැනි යල්පිනූ නීති පැහැදිලිවම කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම සිදු කරයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයෙහි අයිතිවාසිකම් වලට පටහැනිව, 'ස්වභාව ධර්මයේ නීතියට එරෙහි මෛථුනය' ලෙස නොපැහැදිලිව විස්තර කිරීම හරහා සමලිංගික සබඳතා දණ්ඩ නීති සංග්‍රහයෙන් අපරාධ වරදක් බවට පත් කෙරෙන්නේ වසර දහයක් දක්වා වූ සිර දඬුවමකින් දණ්ඩනයට විධිවිධාන සලස්වමිනි. අධ්‍යාපන ආයතනයක් තුළ කවර හෝ තැනැත්කු විසින් ලිංගික අඩන්තේට්ටම්, බරපතල තුවාල සිදුකිරීම, ප්‍රාණ ඇපයට ගැනීම, නීතිවිරෝධීව සිර කර තබා ගැනීම හා නවක වදය දීම අපරාධ වරදවල් බවට පත් කරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත (1998) සහ වධහිංසා පනත (1994) අර්ථ දැක්වීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ඇතුලත් වන වධහිංසාව, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම හෝ දඬුවම් කිරීමට එරෙහිව ආරක්ෂාව සලස්වයි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනතෙහි (2005) සහ වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනතෙහි (2015) ආරක්ෂක නීති අන්තර්ගතව ඇත.
- නෛතික ව්‍යුහය තුළ ඉඩම්, ජාතික වැදගත්කමකින් යුතු ගැටළුවක්ව පැවතී ඇති අතර ඉඩම් වල නිවාස වලට අයිතිය අහිමි කිරීම හා දේපල හා සබැඳි ගැටළු ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අදාළ දෘෂ්ටිකෝණයකින් ආමන්ත්‍රණය කරනු ලැබිය යුතුය. සන්නද්ධ අරගලය, ස්වාභාවික ආපදා, විනිශ්චයක හා පරිපාලනමය වැරදි අර්ථදැක්වීම් හා යුක්තියට ප්‍රවේශය හා නෛතික සාක්ෂරතාව නොමැති වීම වැනි විවිධ සාධක හේතුවෙන් මෙබඳු අහිමි කිරීම් හා වෙනස් කොට සැලකීම් සිදුව ඇති අතර එහි බලපෑම කාන්තාවන්ට අසාධාරණ සහ අවාසිසහගත වී තිබේ.

- ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් කාන්තාවන්ට අහිතකර ලෙස බලපා ඇති වඩාත්ම තීරණාත්මක ගැටළු අතරින් එකකි. නීති ප්‍රමාදයන් පුළුල් ලෙස දක්නට ඇති අතර එබඳු ප්‍රමාදයක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව වින්දිත කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාභාවීමය සුළුතරය කෙරෙහි සෘණාත්මකව බලපායි.
- අධිකරණයෙහි, නීතිපති දෙපාර්තමේන්තුවෙහි, නීතිඥයන් සහ නීතිය ක්‍රියාවේ යොදවන්නන් අතර ඇතුළුව අධිකරණ පද්ධතියෙහි ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංවේදීතාව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන සුළු බව නොමැති වීම, විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව වින්දිතයන් විධිමත් අධිකරණ පද්ධතියට බිය වීම හෝ ඔවුන් තුළ ඒ කෙරෙහි විශ්වාසය නොමැති වීමට හේතු වී ඇත. පහසුකම්, ධාරිතා නොමැති වීම අධිකරණ සේවා සැපයීමේදී අවම ප්‍රමිති වලට අයිතිය නොමැති වීම, සංවේදී නොවන අධිකරණ නිලධාරීන් සහ විශේෂ අධිකරණ වැනි විශේෂ ක්‍රියා පටිපාටි නොමැතිකම යුක්තිය කරා ප්‍රවේශයට තවදුරටත් බාධා ඇති කර තිබේ.
- කාන්තාවන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය, විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව වින්දිතයන් තුළ වන අධිකරණ පද්ධතිය කෙරෙහි සිත තුළ පවතින බිය හා නිෂේධන ප්‍රචණ්ඩත්ව සිදුවීම් වාර්තාකරණය වළක්වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස නීතිය ක්‍රියාවේ යොදවන ආයතන වෙත වාර්තා කිරීම අඩු මට්ටම් වල පවතී. සමාජය බොහෝ විට කාන්තාව මත වරද පැටවීම හේතුවෙන් බොහෝ කාන්තාවෝ නීතියේ පිළිසරණ පැතීමේ සමාජ ප්‍රතිවිපාක වලට බිය වන අතර නෛතික සහන ක්‍රියාවලිය මගින් තැති ගන්වනු ලබති.
- සාපරාධී දඬුවම් පැමිණවීම් නොමැති වීම, පලිගැනීම සහ ප්‍රචණ්ඩත්වය උග්‍ර වීම පිළිබඳ බිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය දඬුවම් නොලබන සංස්කෘතියක් නිර්මාණය කරන අතර එය තවදුරටත් ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයන් අධිකරණ පද්ධතිය කෙරෙහි විශ්වාසය තැබීමෙන් වළක්වයි.
- යුක්තිය වෙනුවෙන් විශේෂ ක්‍රියාවලි නියම කරන පෞද්ගලික නීතියේ තිබෙන වෙනස් කොට සලකන විධිවිධාන කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයෙහි, විශේෂයෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගෙන සිටින වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතාවලට සංවේදී නැත.
- කාන්තා කොමිසමක් හෝ ඔම්බුඩ්ස්මන්වරියක වැනි සියල්ලන්ට ඉහලින් පිහිටි දුක්ගැනවිලි වලට සහන සැලසීමේ යාන්ත්‍රණ නොමැති වීම, කොන් කරන ලද සහ අවදානම් තත්ත්වයේ සිටින පිරිස් යුක්තිය කරා ප්‍රවේශ වීමට බාධා කරන්නේ යුක්තිය වෙනුවෙන් පවතින එකම විකල්පය විධිමත් අධිකරණ පද්ධතිය බවට පත් කරමිනි.
- ආරවුල් විසඳීම, මූලික වශයෙන්ම සමථකරණ විකල්ප යාන්ත්‍රණ කරා ප්‍රවේශය ශ්‍රී ලංකාව තුළ පුළුල්ව පවතී. එසේ වුවද, මෙම පද්ධති වලට බරපතල අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වලට සහන සැලසිය නොහැකිය, මෙම පද්ධති තුළ කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර කෙරෙහි සංවේදී මට්ටම් දුර්වලය. එබැවින් කාන්තාවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට සමාන සහ සාධාරණ යුක්තිය කරා ප්‍රවේශය වෙනුවෙන් යෝග්‍ය පරිසරයක් නිර්මාණය නොකරයි.
- දැනට පවතින වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණ වල ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දක්වන සුළු බව සමෝධානය වී නොමැති අතර, එමගින් කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතර එබඳු ආරක්ෂක යාන්ත්‍රණවල සහාය කරා ප්‍රවේශ වීම වළක්වනු ලබයි.
- ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය ඇතුළු දුප්පත් තැනැත්තන්ට නීති ආධාර සපයනු ලැබේ.
- කාන්තාවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට , විශේෂයෙන් ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් දිවි බේරාගෙන සිටින වින්දිතයන්ට වින්දිත දිවි බේරාගත්තවුන් නියෝජනය සහ ආරක්ෂා කිරීම වැනි වඩාත් වැඩි දියුණු වූ සේවාවන් සපයන නීති ආධාර කරා නිදහසේ ප්‍රවේශ වීමට එබඳු ජනතාවට යෝග්‍ය අවකාශයක් නිර්මාණය කරන සක්‍රිය නීති ආධාර සේවා අවශ්‍යව පවතී.
- කාන්තාවන්ට පවතින අයිතිවාසිකම් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සරලව ප්‍රකාශ කිරීම පිළිබඳව දැනුවත්කම නොමැති වීම, නිලධාරිවාදී ක්‍රියාවලි නුහුරු වීම සහ ඔවුනට අදාලවන්නේ කුමන නීතිද? නෛතික ලේඛනයට අඩංගු වන දේ මොනවාද? හෝ එවැනි ලේඛන අවශ්‍ය වන්නේ මක් නිසාද යන්න ගැන පවා සාමාන්‍ය දැනුවත්කම නොමැති වීම, කාන්තාවන් යුක්තිය කරා ප්‍රවේශ වීමට බාධා පමුණුවන අනිකුත් තීරණාත්මක කනස්සල්ල දනවන කරුණු වේ.

## 6.2 සාමය සහ ආරක්ෂාව

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- ගැටුම කාන්තාවන්, ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය සහ අවදානමට පත් පිරිමින් මත ඇති කරන බලපෑම විනාශකාරී ය. දරිද්‍රතාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස් කොට සැලකීම, කාන්තාවන්ගේ බහුවිධ වගකීම්, සීමිත සහායක ව්‍යුහයන්, අනාරක්ෂිත බව , අවදානම් ආකාරයේ රැකියා, සහ අත්දකින ලද කම්පනයෙහි ප්‍රමාණය බහුවිධ ආකාරයේ සූරාකෑම සහ අවදානමට පත් වීම ඇති කිරීමට ඒකරාශී වෙයි. ව්‍යුහාත්මක වෙනස් කොට සැලකීම මෙන්ම පශ්චාත් ගැටුම් ගැටළුව පිළිබඳව පරිපූර්ණ දීර්ඝකාලීන කේන්ද්‍රගතවීම නොමැති වීම මගින් මේවා වඩාත් අවහපත් තත්ත්වයට හරවනු ලැබේ.
- කාන්තාවන්ට යුද්ධයේ බලපෑම සහ ගැටුම් විසඳීම, සාමය ගොඩනැගීම, සාමය පවත්වා ගැනීම, මානුෂීය ප්‍රතිචාර සහ පශ්චාත් ගැටුම් යලි ගොඩනැගීම තුළ කාන්තාවන්ගේ පූර්ණ සහ සමාන සහභාගිත්වයෙහි වැදගත්කම ආමන්ත්‍රණය කරන කාන්තාවන්ගේ සාමය හා ආරක්ෂාව පිලිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මතයෙහි (2000 අංක 1325) බැඳීම් වලට අනුකූලව ශ්‍රී ලංකාව සාමය ගොඩනැගීම, ප්‍රතිසන්ධානය සහ යහපාලනය වෙනුවෙන් බැඳීම් ගණනාවකට යටත් වී ඇත. මෙම යෝජනා සම්මතයට අනුව ගැටුම හා සබැඳි වින්දිත ප්‍රචණ්ඩත්වයෙන් කාන්තාවන් හා ගැහැණු ළමුන් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.
- ශ්‍රී ලංකාවේ ප්‍රතිසංධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම පිලිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනා සම්මත 30/1 තුළ තවත් නිශ්චිත බැඳීම් තවදුරටත් දක්වා තිබේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනා සම්මත 30/1 හි දක්වා ඇති පරිදි 2015 සිට ශ්‍රී ලංකාව, සාමය ගොඩනැගීම, ප්‍රතිසංධානය සහ යහපාලනය වෙනුවෙන් බැඳීම් ගණනාවකට යටත් වී ඇත. මෙම බැඳීම් සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කිරීම සඳහා උපදේශක කාර්ය සාධක බලකායක් සංක්‍රාන්ති යුක්තිය සහ පශ්චාත් ගැටුම් යලි ගොඩනැගීම තුළ කාන්තාවන්ගේ පූර්ණ සහ සමාන නියෝජනය සහ සහභාගිත්වය සාමය ගොඩනැගීම සඳහා කාන්තාවන්ගේ අර්ථවත් සහ සඵලදායක සහභාගිත්වය සහ දායකත්වය අවධාරණය කළ ශ්‍රී ලංකා සාමය ගොඩනැගීමේ ප්‍රමුඛතා සැලැස්ම රජය සහ එක්සත් ජාතීන් විසින් ඒකාබද්ධව සකස් කිරීම නිර්දේශ කළේය.
- ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලසුම (2017-2021) තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිලිබඳ පරිච්ඡේදයට නීති ප්‍රතිසංස්කරණ, යුද්ධයේ බලපෑමට ලක් වූ කාන්තාවන්, රැකියා සහ ආයතනික යාන්ත්‍රණ වැඩි කිරීම වැනි ගැටලු වලට විසඳුම් සැපයීම සඳහා විධිවිධාන ගණනාවක් ඇතුලත් වේ. කාන්තා ගෘහ මූලිකයන් සඳහා පුහුණුව පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2019-2021) සම්බන්ධ කැබිනට් පත්‍රිකාව සහ ඉන් අනතුරුව වූ කෙටුම්පත ගැටුමෙහි බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම අරමුණු කරයි. රජයද දැනට කාන්තාවන් සාමය සහ ආරක්ෂාව පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කරමින් සිටී.
- කාන්තා ගෘහ මූලිකයන් බවට පත්වෙමින් කාන්තාව විශේෂයෙන්ම යුද්ධය හේතුවෙන් සෘණාත්මක බලපෑමට ලක් වූහ. යුද්ධය සහ අභ්‍යන්තර ගැටුම හේතුවෙන් ස්වාමිපුරුෂයන් සහ වැඩුණු දරුවන් අහිමි වූ කාන්තාවන් මෙන්ම සොල්දාදුවන්ගේ වැන්දඹුවන්ද ශ්‍රී ලංකාවේ ගෘහමූලික කාන්තාවන් සහිත ගෘහ ඒකක සංඛ්‍යාව වැඩි කිරීමට හේතු වී ඇත. විශේෂයෙන්ම ගැටුමේ බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා කාන්තා ගෘහ මූලික ගෘහ ඒකකවෙනුවෙන් ජාතික රාමුව හඳුන්වා දෙන ලදී.
- දරිද්‍රතාව පිටුදැකීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සඳහා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම වෙනුවෙන් ණය පහසුකම් වැනි සේවා සපයන ලදී. එබඳු පවුල් වල ගැහැණු ළමුන්ට ශ්‍රම වෙළඳපොලට පිවිසීමේදී අවස්ථා සපයන තාක්ෂණික ක්ෂේත්‍ර වලට පිවිසීම උනන්දු කරවීම සඳහා ප්‍රයත්නයන්ද තිබී ඇත. එනමුත් එම රාමුවේ කාල රාමුව ඉකුත් වී ඇති අතර එය සංශෝධනය කරනු ලැබ නොමැත.
- අත්දකිනු ලබන කම්පනයට අමතරව ගෘහ මූලික කාන්තාවෝ පවුලේ ආදායම් උපයන්නන් අතුරුදහන් වීම, දරිද්‍රතාව, ගැටුමෙන් පසු ඉඩම් සහ දේපල කරා ප්‍රවේශය නොමැති වීම, ආරක්ෂාව සම්බන්ධ කරුණු සහ කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ඉහළ මට්ටම් ඇතුළුව යුද්ධය හා සබැඳි ගැටලු හේතුවෙන් දිගින් දිගටම සෘණාත්මක බලපෑමට ලක් වෙති.

- ගැටුම අතරතුරදී  ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ සාම ක්‍රියාකාරීත්වය සැලකිය යුතු මට්ටමක තිබුණද, පශ්චාත් ගැටුම් සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් තීරණ ගැනීමේ සමුළු වලදී කාන්තාවන් බොහෝ සෙයින් බැහැර කර දමනු ලැබ ඇත. ගැටුම අවසන් කිරීමේ සහ ප්‍රතිසන්ධානයේ තීරණ ගැනීමේ මට්ටමේදී කාන්තාවන්ගේ ප්‍රමාණවත්වන සහභාගිත්වය සහ සංක්‍රාන්ති යුක්තිය සහ පශ්චාත් ගැටුම් යලි ගොඩනැගීම් සහ ප්‍රතිසංධාන ක්‍රියාවලි තුළ කාන්තාවන්ගේ පූර්ණ සහ සමාන නියෝජනය සහ සහභාගිත්වය, ඒ හා සබැඳි නීති ප්‍රතිසංස්කරණ, ආරක්ෂාව හා රැකියාව හා සබැඳි ආයතනික යාන්ත්‍රණ නොමැති වීම මෙයට ඇතුලත් වේ.
- කල් පවත්නා සාමය ගොඩනැගීමෙහි කාන්තාවන්ගේ සහභාගිත්වය සාම ක්‍රියාවලි තුළ කාන්තාවන් ඇතුලත් කර ගැනීම සහ වඩාත් කල් පවත්නා සහ ස්ථිර සාමය අතර වැඩි සබඳතාවක් නිර්මාණය කරයි.  කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ ප්‍රජාවන් තුළ සහ පිටත යන දෙකේදී ම ඔවුන්ව වඩාත් ඉහළ මට්ටම් වල ප්‍රචණ්ඩත්වයට සහ වෙනස් කොට සැලකීමට ගොදුරු කරවමින් ඔවුන්ගේ අයිතිවාසිකම් වලට විශේෂිත අභියෝග ඇති කරන වාර්ගික , ආගමික ආතති සහ ප්‍රචණ්ඩත්වයට සඵලදායක ලෙස  විසඳුම් සැපයීම ඇතුළුව සාමය ගොඩ නැගීමට කාන්තාවන්ගේ අර්ථවත් සහ සඵලදායක සහභාගිත්වය සහ දායකත්වය වැඩි කිරීමට තවත් කළ යුතු දේ ඇත.
- පශ්චාත් ගැටුම් සංවාදය සහ ක්‍රියාමාර්ග තුළ කාන්තාවන්ගේ සහ කාන්තා කණ්ඩායම්වල සහභාගිත්වය ඇතුළුව සිවිල් සමාජ නිරත වීම ශක්තිමත්ව තිබී ඇත. සිවිල් සමාජය මත පනවන ලද ව්‍යුහාත්මක, නෛතික සහ පටිපාටිමය සීමාවන් මෙන් ම සිවිල් සමාජය සහ එහි වැඩ කෙරෙහි සැකය සහ ඒවා දුරස් කිරීම ප්‍රතිසංධානය සහ සාමය ගොඩනැගීම තුළ සිවිල් සමාජයේ  පරිපූර්ණ නිරත වීම වළක්වයි.
- ගැටුම් වල බලපෑමට ලක් වූ සමාජයේ කොටස් සම්බන්ධයෙන් අධිකරණ ක්ෂේත්‍රයේ සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශ වල ප්‍රමාණවත් නොවන අවබෝධය සහ ඒ හේතුවෙන් වන සංවේදී නොවන සහ සඵලදායක නොවන ප්‍රතිචාර දුක්ගැනවිලි වලට සහන සැලසීම කරා ප්‍රවේශය අහිමි කර සාධාරණ සැලකීමට බඳුන් කරයි.
- අභ්‍යන්තර ගැටුම්වල බලපෑමට ලක් වූවන්ගේ  දීර්ඝ කාලයක් තිස්සේ පවතින දුක් ගැනවිලි වලට සහන සලකා බලමින්  පශ්චාත් යුධ සහ ප්‍රතිසංධාන ගැටලු වලට විසඳුම් සැපයීමේදී අධිකරණ යාන්ත්‍රණ, සත්‍ය කොමිෂන් සභා සහ මානව හිමිකම් කොමිසමේ සක්‍රිය සම්බන්ධ වීම සහතික කිරීම අවශ්‍යව ඇත.
- පශ්චාත් යුධ යථා තත්ත්වයට පැමිණීම සහ යලි ගොඩනැගීම සම්බන්ධයෙන් කාන්තාවන්ගේත් ගැහැණු ළමුන්ගේත් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයේත් සහ කොන් කරන ලද පිරිමින්ගේ සහ පිරිමි ළමුන්ගේ  අදහස්, බලාපොරොත්තු සහ අපේක්ෂාවන් සලකා බැලීමට දීර්ඝ කාලීනව නිරත වීම සහ සෘජුව සහ වක්‍රව බලපෑමට ලක් වූ ජන කොටස් වල දීර්ඝ කාලයක් තිස්සේ පවතින දුක් ගැනවිලි වලට විසඳුම් සැපයීම පශ්චාත් යුධ යථා තත්ත්වයට පැමිණීම සහ යලි ගොඩනැගීම ඉලක්ක කරගත් ව්‍යුහයන් සහ ක්‍රියාවලී මගින් සහ සංක්‍රාන්ති යුක්තිය සහතික කිරීමේදී නොසලකා හරිනු ලැබ ඇත.
- නැවතත් යුද්ධයක් ඇති වීම වැලැක්වීම හා කාන්තාවන් , ගැහැණු ළමුන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරය ඇතුළුව රටේ සියලු පෙදෙස් වල සියලු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස සාමය සහ ආරක්ෂාව පිලිබඳ දැනුවත් කිරීමේ අවශ්‍යතාව පවතී.

# 07 වෙනි තේමාගත ක්ෂේත්‍රය: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් නිදහස

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ වයස, ආගම, පන්තිය, අධ්‍යාපනය, ආබාධිකත්වය, ලිංගික නැඹුරුතාව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව හෝ භූගෝලීය පිහිටීම කුමක්ද යන්න නොසලකා ඔවුහු පෞද්ගලික, පොදු, වෘත්තීයමය සහ ඩිජිටල් අවකාශ තුළ ප්‍රචණ්ඩත්වය ඇතුළුව සියලු ආකාරයේ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය අත්විඳිති. මෑත කාලවලදී බොහෝ දෙනෙකුට ඔවුන්ගේ නිවෙස් වලට සීමා වී සිටීමට බල කළ කොවිඩ් 19 වසංගතය සහ වර්තමාන ආර්ථික අර්බුදය මගින් නිර්මාණය කරන ලද විවිධාකාර ආතති වල බලපෑම මගින් වඩා අයහපත් තත්ත්වයට පත් කරන ලදුව ගෘහස්ථ අවකාශයේ සහ ඩිජිටල් ප්‍රචණ්ඩත්වය තැතිගන්වන ප්‍රමාණ වලින් ඉහළ ගොස් ඇත.
- සෑම කාන්තාවන් හතර දෙනෙකුගෙන් එක් අයෙකුම (සියයට 24.9) වයස අවුරුදු 15 සිට හවුල්කරුවකු හෝ හවුල්කරුවකු නොවන අයෙකුගේ ශාරීරික හා/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය අත්දැක ඇති බව කාන්තාවන්ගේ ජීවිත කාලය තුළ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව අත්දැකීම් පිළිබඳව ජාතික කාන්තා යහපැවැත්ම පිළිබඳ සමීක්ෂණය (2019) පෙන්නුම් කරයි. අතිශය සමීප හවුල්කරුගේ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් සමීක්ෂණය හෙළි කරන්නේ කවර අවස්ථාවක හෝ හවුල්කරුවකු සිටි සෑම පස්දෙනෙකු අතරින් එක් අයෙකුම (සියයට 20.4) ඔවුන්ගේ ජීවිත කාලය තුළ කවර හෝ සමීප හවුල්කරුවකුගේ ශාරීරික හා/හෝ ලිංගික ප්‍රචණ්ඩත්වය අත්විඳ ඇති බවයි.
- අනුමැතිය රහිත ලිංගික ක්‍රියා සහ අඩු වයස් ගැබ් ගැනීම් ගැහැනු ළමුන් පීඩාවට පත් කරන ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි ප්‍රධාන ආකාර දෙක වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සුළුතරයට එරෙහි ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වාර්තා කිරීමේ බරපතල ඌනතාවක් පවතින අතර වින්දිතයන් සහ දිවි ගලවා ගත්තවුන් පිළිබඳ අන්තර් ආංශික විශ්ලේෂණය සම්බන්ධයෙන් එය වඩාත් ඌනතාවයෙන් පවතී.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හෝ අතිශය සමීප හවුල්කරුවකුගේ ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ වඩාත්ම පැතිරීමක් සහිත සහ බහුල ආකාරය වේ. කෙසේ වෙතත්, අවිධිමත් මාර්ග හරහා උපකාර පැතීමට පෙර වින්දිතයෝ වසර ගණනාවක් ඇතැම් විට, දශක ගණනාවක් දක්වා නිහඬව පීඩා විඳිති. සමාජ සංස්කෘතික සම්මතයන් පවුල් ආරවුල් සහ ප්‍රචණ්ඩත්වය පෞද්ගලික අවකාශයට සීමා කර තබා ගැනීමට කාන්තාවන්ට බල කරන්නේ වාර්තා කිරීම සහ නීතිය සහ අධිකරණ අංශය තුළින් සහන ලබා ගැනීමේ විධිමත් ක්‍රම වල සහාය ලබාගැනීමෙන් වින්දිතයන්ව අධෛර්යමත් කිරීම
- පොදු ප්‍රවාහනය භාවිතා කරන අතරතුර ලිංගික අඩන්තේට්ටම් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහිව වැඩියෙන්ම පැතිරී පවතින ප්‍රචණ්ඩත්ව ආකාරය වේ. ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ සහභාගිත්වයට සහ කාන්තාවන්ගේ සංචරණයට අහිතකර ලෙස බලපාන සාධක අතරින් මෙය ප්‍රධාන එකක් වුවත්, වින්දිතයන්ම, අවට සිටින්නන් හෝ බලධාරීන් විසින් අපරාධකරුවන්ට එරෙහිව ක්‍රියා කිරීම ඉතා අඩු හෝ සිදු නොවන තරම් ය.
- ස්ත්‍රී දූෂණය, ව්‍යවස්ථාපිත දූෂණය, වෛවාහික දූෂණය , සමූහ දූෂණය, බරපතල ලිංගික අපයෝජනය සහ ව්‍යභිචාරය ඇතුළුව අනිකුත් ආකාරවල ලිංගික සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දත්ත හිඟ අතර ඒකාකාර ලෙස දත්ත රැස්කිරීමක් සිදු නොවේ. ලිංගිකව සූරාකෑමට ලක් වීමේ ලැජ්ජාව වින්දිතයන් මත විනාශකාරී සහ කොන් කරන ආකාරයේ බලපෑම් ඇති කර එබඳු ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමෙන් හෝ වෛද්‍ය හෝ මනෝ සමාජමය සහාය සහ නීතියේ පිළිසරණ පැතීමෙන් ඔවුන්ව වළක්වයි.
- විශේෂයෙන්ම බලහත්කාර ශ්‍රමය හා ලිංගික සූරාකෑම වෙනුවෙන් කාන්තා හා පිරිමි මිනිස් ජාවාරම ශ්‍රී ලංකාවේ දේශ සීමා තුළ හා හරහා සිදු වේ. වින්දිතයන් හා බලධරයන් විසින් ගැටළුව අවබෝධ කර ගැනීම සීමිත වීම වින්දිතයන් තෝරා බේරා හඳුනා ගැනීම, විමර්ශනයට සහ චෝදනා ඉදිරිපත් කිරීමට බාධා පමුණුවන අතර සේවා කරා ප්‍රවේශය තවදුරටත් සීමා කරයි.
- ආරක්ෂා වීම, ඉවසීමෙන් සිටීම හා ඉවසා දරා ගැනීම පිළිබඳ වගකීම කාන්තාවන්ට පවරන සමාජීය පීඩනය, අපකීර්තියට පැමිණීමේ බිය හා යල් පැන ගිය සමාජ සංස්කෘතික සම්මතයන්, මිත්‍යා විශ්වාස

සහ වැරදි අවබෝධයන් බොහෝ විට ඔවුන් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය සාධාරණීකරණය හා සුළු කොට තැකීම සිදු කර වින්දිතයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීම සඳහා පෙරට ඒමෙන් වළක්වයි. එබැවින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව සිද්ධි බොහොමයක් වාර්තා නොවී හා නිල සංඛ්‍යාලේඛන වල පිළිබිඹු නොවී පවතී. අපරාධ වාර්තා කිරීමේදී පොලිසියේ සිට විධිමත් උසාවිය දක්වා අධිකරණ දාම ආයතන වින්දිතයන් බිය ගන්වන හා ඔවුනට වෙනස් කොට සලකන ආකාරයේ විය හැකි අතර බොහෝ දෙනෙක් මෙම විධිමත් මාර්ග මග හැරීමට තෝරා ගනිති.

- ලිංගික සංචාරක කර්මාන්තය, පාසල්, රැකවරණ නිවාස, ආගමික ආයතන, රැඳවුම්/සහ අනෙකුත් සමාන පසුබිම් යන සන්දර්භ තුළ පවතින පිරිමි ළමුන් ලිංගික අපයෝජනය දැඩි ලෙස වාර්තා නොවී පවතී. පිරිමින් අපයෝජන හා සූරාකෑම් අවදානමට ගොදුරු නොවන බවට දැඩි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ සම්මතයන් හා පිරිමිකම පිළිබඳ අදහස් ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමෙන්, සහන පැතීමෙන් හා පිරිමින් විසින් මුහුණ දෙනු ලබන ලිංගික ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා වන සීමිත සේවා කරා ප්‍රවේශ වීමෙන් පිරිමින්ව වළක්වයි.
- ස්ත්‍රී සම ලිංගික, පුරුෂ සම ලිංගික, ද්වි ලිංගික, සංක්‍රාන්ති ලිංගික, ලිංගිකත්වය අපැහැදිලි හා අන්තර් ලිංගික (LGBTQ1+) පුද්ගලයන්ද බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචන්ඩත්වයෙහි වින්දිතයන් ලෙස නොදැක සිටිනු ලබති. නීතියෙහි අර්ථ ව්‍යාකූල බව සහ නීතිය ක්‍රියාවේ යොදවන්නන් ඔවුන්ට එරෙහිව යොදා ගන්නා දණ්ඩනීය දෘෂ්ටි කෝණය, LGBTQ1+ ප්‍රජාව හා වාණිජ ලිංගික ශ්‍රමිකයන් පවා නෛතික, වෛද්‍ය හා අනෙකුත් සහාය සේවා කරා ප්‍රවේශ වීමට නියාමනය කරනු ලබන රාමුවෙන් පිටමං කිරීමට කටයුතු කරයි.
- ස්ත්‍රී පුරුෂ සමාජභාතාව මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා අපරාධ බොහොමයකට ප්‍රතිචාර දැක්වීමට ශක්තිමත් ව්‍යවස්ථාදායක රාමුවක් ශ්‍රී ලංකාව සතු ය. එසේ වුවද, යල් පැන ගිය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති සහ සංස්කෘතික විශ්වාසය, නීති ගණනාවක පිළිබිඹුව පවතින අතර අනෙක්වා වර්තමාන වෙනස්කම් හා අනාගත අභියෝග ආමන්ත්‍රණය සඳශා ප්‍රමාණවත් නොවී පවතී. වර්තමාන ස්ත්‍රී දූෂණ නීතිය, පිරිමින් දූෂණයෙහි වින්දිතයන් ලෙස පිලිනොගන්නා අතරම අධිකරණමය වෙන්වීමකදී හැර වෛවාහක දූෂණය වරදක් ලෙස පිලිනොගනී. වර්තමාන ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව නීතිය ආරක්ෂක නියෝග වෙනුවෙන් පමණක් හැකියාව ලබා දෙන නමුත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සාපරාධී වරදක් නොකරන අතර ඒ අනුව වරදකරු ආමන්ත්‍රණය සඳහා විධිවිධාන කිසිවක් නොමැත.
- කාන්තාවන් ජීවිතයට අවදානමක් පවතින්නේ නම් හැර, දූෂණ සහ ව්‍යභිචාර සිද්ධි වලදී පවා, ගබ්සාව සාපරාධී වරදක් කරනු ලැබේ. සයිබර් ප්‍රචණ්ඩත්වය හා තර්ජන, සීඝ්‍ර තාක්ෂණික දියුණුව සමඟ වැඩිවෙමින් පවතින ඩිජිටල් හා සමාජ මාධ්‍ය වේදිකා හරහා ප්‍රචණ්ඩත්වය හා බිය ගැන්වීම් ආමන්ත්‍රණය කිරීමට ද ප්‍රමාණවත් නීති නැත.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයන්ට සඵලදායක ප්‍රතිචාර දක්වන, සෞඛ්‍යය, ආරක්ෂක, අධිකරණ, අධ්‍යාපන සහ මාධ්‍ය වැනි විවිධ අංශ වල ප්‍රධාන ක්‍රියාකාරීන් රැසක් සිටින නමුත් ඔවුන් අතර සම්බන්ධීකරණය, තිරසාර කැපවීම හා සංවේදීබව අල්පය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව ආමන්ත්‍රණ කරන සහාය සේවා ප්‍රමාණවත් නොවන අතර රට පුරා ප්‍රමාණවත්ව ලබා ගැනීමට නොමැත. ප්‍රමාණවත් උපදේශනය , නීති ආධාර, රැකවරණ ස්ථාන හා වින්දිත හිතකාමී අධිකරණ නොමැතිකම, පොලිස් ස්ථාන සහ අධිකරණ වල ප්‍රමාණවත් කාන්තා කාර්ය මණ්ඩලය සහ ප්‍රශ්න කිරීම හා විමර්ශනය වෙනුවෙන් පුහුණු නිලධාරීන් නොමැතිකම, ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම පිණිස ප්‍රමාණවත් නොවන සම්පත් හා පුහුණුව, සහ ප්‍රදේශයේ සියළු භාෂාවන්ගෙන් සේවා සපයන්නන් නොමැති වීම මේ අතරට අයත් වන නමුත් ඒවාට සීමා නොවේ. නිසි මාර්ගෝපදේශ, ක්‍රියාවලි නොමැති වීම හා සීමිත සම්පත් හේතුවෙන් ප්‍රජාවන් හා වින්දිතයන් වෙනුවෙන් ප්‍රත්‍යානුකලන සහාය සහ පවුල් පිලිබඳ පසුවිපරම පහළ මට්ටමක පවතී.
- විශේෂයෙන්ම අපරාධකරුවන් සිදු කරන ලද ප්‍රචණ්ඩත්ව හා අපරාධ ක්‍රියා වෙනුවෙන් ඔවුන්ව වගවීමට සැලැස්විය හැකි හා නෛතික පිලියම් බලාත්මක කළ හැකි එකම පද්ධතිය එය වන හෙයින්, ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමේදී විධිමත් අධිකරණ පද්ධතියට ඉටුකිරීමට වැදගත් කාර්යභාරයක් පවතින බව හඳුනාගැනීම සිදු නොවේ. අධිකරණ අංශයේ පිරිස් හා සේවා සපයන්නන් (විනිසුරුවරුන්, නීතිඥයන්, අධිකරණ කාර්ය මණ්ඩල, පොලිසිය, ළමා ආරක්ෂක නිලධාරීන්, වෛද්‍ය හා අධ්‍යාපනික නිලධාරීන්, උපදේශකයන්, සමථකරුවන් හා සුබසාධන සේවාවල යෙදී සිටින්නන් සහ පුද්ගලයන් හා ආයතන ඇතුළත්ව) අතර සංවේදීබව හා උපායඥානය නොමැති වීම, වරදට දඬුවම් නොලැබීම හා ප්‍රචණ්ඩත්වය සිදුකළ තැනැත්තන්ට නියම

කෙරෙන අත්හිටවූ දඬුවම්, යුක්තිය කරා ප්‍රවේශය අවම කරන හෝ සීමා කරන වෙනස් කොට සලසන ආකාරයේ ආකල්ප, කාන්තාවන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්ව නඩු අභිචෝදනයේදී සීමාව ඉක්මවූ ප්‍රමාදයන්, බොහෝ විට කාලය ගතවන, ආගන්තුක හා බියගන්වන නඩු විභාග ක්‍රියාවලි, බොහෝ විට වින්දිතයාට බරපතල චිත්තවේගී, මනෝසමාජීය හා ආර්ථික ප්‍රතිවිපාක ඇති කර අධිකරණය වින්දිතයකු පිහිට පතන අවසාන ස්ථානය බවට පත් කරවයි.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්ව වැළැක්වීම හා එයට ප්‍රතිචාර දැක්වීම සඳහා සේවා සපයන්නන්, නීතිය ක්‍රියාවේ යොදවන්නන්, අධිකරණ අංශ පිරිස් හා අනෙකුත් බලධාරීන් විධිමත් පුහුණු කිරීමේ හා සංවේදීකරණයෙහි අඩුවක් පවතී. එබැවින්, වින්දිත සහාය සැපයීමෙදී ඔවුන්ගෙන් බොහොමයක් තුළ පීතෘ මූලික ආකල්ප, යල්පැන ගිය දැනුම, සංවේදී නොවන ප්‍රතිචාර හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙහි මානසික, ශාරීරික, ආර්ථික හා පරම්පරික බලපෑම් පිළිබඳ අල්ප අවබෝධය දිගින් දිගටම පවතී. එබැවින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කරන බොහොමයක් ප්‍රතිචාර, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අන්ධව හා එබඳු ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගෙන සිටින කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගේ සැබෑ අත්දැකීම් හා අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර නොදක්වමින් පවතී.
- අධ්‍යාපන අංශය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වෙනුවෙන් ඌන උපයෝජනය කරන ලද සම්පතක් ලෙස පවතී. එක් අතකින් වින්දිතයන් වීමට ඉඩ ඇති බොහෝ දෙනෙකු ඔවුන්ගේ අයිතිවාසිකම්, ඔවුන්ව ආරක්ෂා කරන නීති හා සැපයෙන සේවාවන් පිළිබඳව නොදැන සිටින බැවින් ඔවුන්ව සවිබලගැන්වීමට සහ අනෙක් අතට, පිරිමින් හා පිරිමි ළමුන්ද ඔවුන් උල්ලංඝනය කරන අයිතිවාසිකම් හා නීති පිළිබඳව නොදන්නා හෙයින්ද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පිරිමිකම සම්බන්ධයෙන් කිඳා බැස ඇති අදහස් ඔවුන් තුළ පවතින හෙයින්ද මෙන්ම ඔවුන්ගේ චිත්තවේග පාලනය කර ගැනීම ප්‍රචණ්ඩ නොවන හා විකල්ප කුසලතා වලට නිරාවරණය නොවන හෙයින්ද අපරාධකරුවන් වීමට ඉඩ ඇති තැනැත්තන් එයින් වැළැක්වීමට අධ්‍යාපනය සම්පතකි.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ අනෙකුත් ආකාරවල ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සිදු කරන අපරාධකරුවෝ ඔවුන්ගේ අපරාධ වෙනුවෙන් දඬුවම් අත්හිටවූ දඬුවම් වල වාසිය ලබන අතර ඉතා සුළු වන්දියක් හෝ කිසිදු වන්දියක් නොමැතිව නිදහස් වෙති. අපරාධකරුවන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්, පුනරුත්ථාපන හෝ සහාය සේවා ප්‍රමාණවත් නොවන අතර ලිංගික අපරාධ සිදු කරන්නන් පිළිබඳ කිසිදු නාම ලේඛනයක් නොතිබීම එම අපරාධකරුවන්ට දිගින් දිගටම අපරාධ කිරීමට අවකාශ සලසයි.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට මුල් බැස ගත් හේතු, එම ප්‍රචණ්ඩත්ව වල බහුවිධ පැතිකඩ සහිත බලපෑම් සහ විකාශය වන ස්වභාවය මෑත සාක්ෂි මගින් පෙන්නුම් කරයි. අතිශය සමීප හවුල්කරුවන් විසින් සිදුකරන ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ගේ අකල් මරණ හා අස්වාභාවික මරණ හා සම්බන්ධ කරනු ලැබ ඇති අතර ගැබිණිබව අතරතුරදී ප්‍රචණ්ඩත්වය ගබ්සා වීම්, මළ දරු උපත් හා මාතෘ මරණ ඇතුළු ගැබිණි මවට අදාල සෘණාත්මක ප්‍රතිඵල වලට මග පාදන බව පෙන්නුම් කෙරේ. ප්‍රචණ්ඩත්වයෙහි වඩාත් පුළුල් සමාජ ආර්ථික පිරිවැය සහ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ආර්ථික ඵලදායිතාව අහිමිවීමද ගණන් බැලීම සිදු කෙරෙමින් පවතී.

- පසුගිය දශක කිහිපය මුළුල්ලේ ශ්‍රී ලංකාව තුළ අත්දකින ලද බාහිර කම්පන, හදිසි තත්ත්වයන් හා ආපදා (දිගින් දිගට ඇදී ගිය යුද්ධය, සුනාමි, කොවිඩ් 19 ගෝලීය වසංගතය, සමාජ - දේශපාලන සහ ආර්ථික අර්බුදය ඇතුළු) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට දායක වී හා එය වඩාත් නරක තත්ත්වයට පත් කර ඇති බව පෙන්නුම් කරනු ලැබ ඇත. කාන්තාවන්ගේ අවදානම් තත්ත්වයන් වැඩි වන අතර, එබඳු තත්ත්වයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීමට අල්ප ප්‍රමුඛත්වය දීම හා සම්පත් වෙන් කිරීම සිදු වේ.

## 08 වැනි තේමාගත ක්ෂේත්‍රය: ළමයින් - ගැහැණු ළමයා පිළිබඳ විශේෂ අවධානය සහිතව

### සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන කරුණු

- ශ්‍රී ලංකාවේ ජනගහනය, ගැහැණු හා පිරිමි ළමයින්ගේ මෙන්ම නව යොවුන් ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ සමාන ව්‍යාප්තියක් පෙන්නුම් කරයි.
- 1990 දී අත්සන් තබන්නකු බවට පත්වෙමින්, 1991 දී සාධන පත්‍රය අපරානුමත කරමින් හා 1992 දී ළමා ප්‍රඥප්තිය සකස් කරමින් ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අත්සන් තැබූ මුල් රාජ්‍ය කිහිපය අතර විය. පනතක් මගින් පවරන ලද පූර්ණ බලතල සහිතව 1998 දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපනය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් යන දෙපාර්ශ්වයම අධ්‍යාපනයෙහි ලියාපදිංචි කිරීම සියයට 99 ක් තරම් ඉහළ අගයක් ගනී. අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ යම් ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා සහිතව උසස් අධ්‍යාපනය තුළ කාන්තාවෝ පිරිමින් හා සමානව සහභාගි වෙති.
- මෙම බැඳීම් තිබියදීත්, සිවිල් සමාජය සමඟ එක්ව වැඩ කරන සියළු අදාල රාජ්‍ය ආයතන එකට එක් කරන සමස්ත ළමා ආරක්ෂක පද්ධතිය ශක්තිමත් කිරීම හෝ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් කෙටුම්පත් කරන ලද සියල්ලන් ඇතුළත් කර ගන්නා ප්‍රතිපත්ති රාමුවක් තවමත් සකස් වී නොමැත.
- ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය සඳහා නීතිමය වයස අවුරුදු 16 කි. එසේ වුවද, විශේෂයෙන්ම ගෘහස්ථ වැඩ, කුඩා කර්මාන්ත හා කම්හල් වල වැඩ වල සහ පවුලේ ව්‍යාපාර සහ කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල ගෙවීම් නොලබන සේවකයන් ලෙස, අඩු වැටුප් ලබන හෝ වැටුප් නොලබන සේවකයන් ලෙස ගැහැණු හා පිරිමි ළමුන්ගේ ශ්‍රමය සූරා කෑම ඔවුන්ගේ අධ්‍යාපනයට හා විවේකයට හානිදායක ලෙස සිදු වේ.
- රැක බලාගන්නන්ගේ සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් සහ ගැහැණු ළමුන්ගෙන් අපේක්ෂා කෙරෙන ඒකාකෘති චර්යාවන් ගැහැණු ළමුන්ට පවරමින් ළමයින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතිකරණය දක්නට ලැබෙන අතර එයින් තමනට ලැබෙන අවස්ථා පූර්ණ ලෙස භුක්ති විඳීමේ හැකියාව ගැහැණු ළමුන්ට අහිමි කරනු ලැබේ. මෙය පිරිමි ළමුන්ටද බලපාන නමුත් ගැහැණු ළමුන්ට වඩාත් සීමාකාරී වේ.
- ගැහැණු ළමුන්ට විවාහය වෙනුවෙන් වඩා අඩු වයසක් පිළිගන්නා ඇතැම් පෞද්ගලික නීති මගින් පාලනය වන කාන්තාවන් හා ගැහැණු ළමුන් සම්බන්ධයෙන් හැරුණු කොට ශ්‍රී ලංකාවේ සියළුම කාන්තාවන්ට ගැහැණු ළමුන්ට අදාළව විවාහ වීමේ නෛතික අවම වයස අවුරුදු 18 කි. ගැහැණු ළමුන් මානසිකව හා ශාරීරිකව විවාහයට සූදානම් නොමැති වයසකදී ඔවුන්ව විවාහයට නිරාවරණය කරමින් මෙම පෞද්ගලික නීති ගැහැණු ළමුන්ගේ විශ්වීය අයිතිවාසිකම් උල්ලංඝනය කරයි. බහුතරයක් ගැහැණු ළමුන්ට විවාහ වීමේදී අදාල නෛතික අවම වයස තිබුණද, නීතිය පිළිනොගන්නා අඩු වයස් සබඳතා හා එක්වීම් පවතින්නේ එබඳු ගැහැණු ළමුන්ට විවාහයක් තුළ අයිතිවාසිකම් අහිමි කරමිනි. අඩු වයස් විවාහ බොහෝ විට අඩු වයස් ගැබ්ගැනීම් වල ප්‍රතිඵලයකි. පරිපූර්ණ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය අධ්‍යාපනය, ප්‍රමාණවත් දෙමාපිය ආරක්ෂාව සහ මග පෙන්වීම නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙසද රටේ සියළු ප්‍රදේශවල අඩු වයස් ගැබ් ගැනීම් දක්නට ලැබේ. අඩු වයස් මව්වරුන් අපකීර්තියට හා අත් හැර දමනු ලැබීමට පත් වන අතර රාජ්‍යය හා සිවිල් සමාජය මගින් මෙහෙයවන අඩු වයස් මව්වරුන් වෙනුවෙන් රැකවරණය ප්‍රමාණවත් නැත.
- ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවේ බරපතල ගැටළුවකි. ලිංගික ප්‍රචණ්ඩත්වය සහ ළමුන් ලිංගිකව සූරාකෑම - ව්‍යවස්ථාපිත දූෂණය, ව්‍යභිචාරය, සහ තාක්ෂණය මගින් පහසුකම් සැලසෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ඇතුළු ලිංගික අපයෝජනය සහ ලිංගික අඩන්තේට්ටම් මෙයට ඇතුළත්ය. වයස අවුරුදු 8 ට අඩු මෙබඳු ප්‍රචණ්ඩත්වයෙහි වින්දිතයන් බොහෝ විට අමතර අභියෝග සහ වෙනස් කොට සැලකීමට මුහුණ දෙන අතර ඔවුන්ගේ අධ්‍යාපනය දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂාව සහ සහාය නොලබයි.
- අයුතු බලය පෑම, ගැහැණු හා පිරිමි ළමයින්ට එරෙහිව පුළුල්ව පැතිර ඇති ප්‍රචණ්ඩත්ව ආකාරයකි. ළමයින් වෙනත් ළමයින්ට අයුතු බලය පෑම හෝ ආක්‍රමණශීලී හැසිරීම සිදු කිරීම රට පුරා පැතිර

ඇති බරපතල ගැටළුවකි. අයුතු බලය පෑම, කණස්සල්ල, බිය හා අනාරක්ෂිත බව සහිත වාතාවරණයක් නිර්මාණය කරමින් ළමුන්ගේ මානසික හා ශාරීරික යහපැවැත්ම, සහ අධ්‍යාපනයේ ගුණාත්මක බව, විනෝදාස්වාදය පීඩාවට පමුණුවා ළමා විය පූර්ණ ලෙස අත්විඳීමේ අවස්ථාව ළමුන්ට අහිමි කරවයි. අයුතු බලය පෑමේ විපතට පත්වීමේ සහ වරද සිදු කිරීමේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී වෙනස්කම්, එම අනුපාතික ගැහැණු ළමුන්ට සාපේක්ෂව පිරිමි ළමුන් අතර සැලකිය යුතු ලෙස වැඩි බව පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, ගැහැණු ළමුන් වින්දිතයන් වීමෙන් හෝ වරද සිදු කරන්නන් වීමෙන් නිදහස් බව මෙයින් අදහස් නොවේ. ළමුන් විසින් සහ දෙමවුපියන්, ගුරුවරුන් හා ක්‍රීඩා පුහුණුකරුවන් ඇතුළු වැඩිහිටියන් විසින් අධ්‍යාපන ආයතන, ක්‍රීඩා තුළ හා නිවෙස් තුළ පවා අයුතු බලය පෑම සුලබය. ළමුන් අථත්‍ය අවකාශ (virtual spaces) සහ සමාජ මාධ්‍ය වේදිකා වල සක්‍රිය තත්ත්වය තුළ සයිබර් අයුතු බලය පෑම මෙම ගැටළුවට තවත් සංසිද්ධියක් එක් කරයි.

- ශාරීරික දඬුවම ශ්‍රී ලංකාව තුළ තවමත් පිලිගත් සම්මතයක් වන අතර බොහෝ විට ළමුන් හදා වඩා ගැනීමේදී හා ඔවුන්ට අධ්‍යාපනය ලබා දීමේදී අවශ්‍ය වූවක් ලෙස නිරූපණය කරනු ලැබේ. ශාරීරික දඬුවම් ළමුන් මත ඇති කරන මානසික බලපෑම පිළිබඳ සැලකිල්ලකින් තොරව බොහෝ විට හේතුව හා තදබල බව අනුව ශාරීරික දඬුවම් සාධාරණීකරණය සිදු කරනු ලැබේ. ළමුන් අතර පවා එය සාමාන්‍යකරණය වී ඇති තත්ත්වයක මෙය බරපතල ගැටළුවකි.
- නොසලකා හැරීම සාධාරණීකරණය කිරීමට යොදා ගන්නා දරිද්‍රතාව ළමුන් පමණට වඩා ආරක්ෂා කිරීම, වැනි විවිධාකාර හේතු මත එක් අතකින් ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නොසලකා හැරීමද, අනෙක් අතින් දෙමවුපියන්, ගුරුවරුන් හා සමස්තයක් ලෙස සමාජය විසින් අධ්‍යාපනය, ක්‍රීඩා හා විෂය බාහිර ක්‍රියාකාරකම් තුළ කාර්යසාධනය හා 'හොඳ ළමයින්' යන යථාර්ථවාදී නොවන ප්‍රතිරූප වලට අනුකූල වීමට ළමුන් මත ඇති කරන බලපෑමද ගැහැණු හා පිරිමි ළමුන්ට හානිකර පිළිවෙත් යන ගැටළුවක දෙපැත්ත වේ.
- යුක්තිය සහ දුක්ගැනවිලි වලට සහන කරා ප්‍රවේශය බොහෝ තැන්වලදී ලබාගැනීමට නොහැකි වී හෝ නොදන්නා තත්ත්වයක් තුළ ළමුන්ට එවැනි දේ කරා ඇත්තේ අල්ප ප්‍රවේශයකි. නීතිය හා සම්බන්ධ වන හෝ ගැටෙන ළමුන්ට විධිමත් අධිකරණ පද්ධතියක් හරහා ගමන් කිරීමට සිදුවන අතර බාලක යුක්තිය වෙනුවෙන් නිර්මාණය කරනු ලැබ ඇති පද්ධති තුළ පවා ප්‍රමාණවත් සංවේදී බවක් නොමැත. අපරාධ වල යෙදුණු ළමුන්, අපරාධ වින්දිත ළමුන් හා අපරාධ වලට සාක්ෂිකාර ළමුන් වෙනුවෙන් පවතින ක්‍රියාවලි හා ක්‍රියා පටිපාටි යොදා ගැනේ. මුළුමනින්ම නුසුදුසු පද්ධති තුළ ළමුන් සිරගත කිරීම බහුල අතර බැඳීම් තිබියදීත් රාජ්‍යය සක්‍රිය හා ප්‍රායෝගික ආකාරවලින් මේවාට විසඳුම් සැපයීම සිදුවන්නේ කලාතුරකිනි.
- ළමුන් වෙනුවෙන් විකල්ප රැක බලා ගැනීම මූලික වශයෙන්ම කේන්ද්‍රගතව ඇත්තේ අවදානමට පත් සහ කොන් කරන ලද ළමුන් වෙනුවෙන් ආයතනගත රැක බලා ගැනීම කෙරෙහිය. රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, රජයේ භාර ගැනීමේ නිවාස, පුහුණු හා උපදේශක මධ්‍යස්ථාන ලෙස මෙම ආයතන විවිධ වර්ගවලට කාණ්ඩගත කෙරෙන අතර මේවා අතරින් තුනෙන් එකක්ම පිහිටා තිබෙන්නේ බස්නාහිර පළාත තුළ ය. අවශ්‍යතා සහිත ළමුන් වෙනුවෙන් හොඳම විකල්ප රැකවරණ වැඩපිළිවෙල ලෙස ආයතනගත කිරීම ගෝලීය වශයෙන් පිලිගනු නොලබන අතර වඩා යෝග්‍ය ලෙස සැලකෙන ළමුන් නැවත සමාජානුයෝජනයට සහාය වන කැපකරු රැක බලා ගැනීමේ ක්‍රම ලංකාවේ දක්නට නොමැත. ආයතනික රැක බලා ගැනිමේ පද්ධති තුළ පරිසරය ළමුන් ශාරීරික, මානසික හෝ ලිංගික අපයෝජනයට ලක්කරන ප්‍රචණ්ඩ ඒවා බවට ඇතැම් අවස්ථාවල වාර්තා වී තිබේ. දරිද්‍රතාව, ඉහළ කාර්යසාධනය වෙනුවෙන් පීඩනය, සමාජීය වශයෙන් පිලිගත් සහ බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන්ට අනුකූල වීමට සිදු වීම ඇතුළු විවිධාකාර හේතු මත ශ්‍රී ලංකාවේ ගැහැණු හා පිරිමි ළමුන් අතර ආතතිය සහ සාංකාව වාර්තා වී ඇත. රට වසා දැමීම් සහ පාසල් යාමේ හෝ විනෝදාස්වාද ක්‍රියාකාරකම් වල නිරතවීමට නොහැකි වීම ඇතුළුව කෝවිඩ් 19 සහ ආර්ථික අර්බුදය හා සබැඳි ගැටළු මෙන්ම ළමුන්ට එරෙහි වැඩි වූ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මානසික සෞඛ්‍ය ගැටළු සහ දිවි නසා ගැනීම් පවා මෙම තත්ත්වය වඩා අහිතකර අතට පත්කර තිබේ. මෙලෙස , ළමුන් වෙනුවෙන් පරිපූර්ණ, ළමා හිතකාමී සහ ප්‍රවේශ විය හැකි මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම හා මනෝසමාජමය සහාය පද්ධති අවශ්‍ය වී පවතී.
- ළමයින්ට නිවාස පාදක කරගත් මාර්ගගත අධ්‍යාපනය ලැබීමට සිදුකරමින් සහ සම වයස් කණ්ඩායම් සමඟ අන්තර්ක්‍රියා කිරීම සහ පාසල් පාදක විෂය බාහිර ක්‍රියාකාරකම් වල යෙදීමේ අවස්ථාව සීමා කරමින් කෝවිඩ් 19 සහ ආර්ථික අර්බුදයේ බලපෑම් ළමුන්ගේ අධ්‍යාපනයට දැඩි බාධක එල්ල කර තිබේ.

- වැඩි වශයෙන්ම මිළදී ගැනීමට වත්කම නොමැති වීම හේතුවෙන් ජංගම දුරකථන, ලැප්ටොප් පරිගණක සහ මේසය මත තබන පරිගණක නොමැතිකම, දුර්වල විකාශන සංඥා සහ අවිචාරවත් විකාශන කාලසටහන් ඇතුළු සාධක ගණනාවක් මගින් කොවිඩ් 19 වසංගතය අතරතුරදී මාර්ගගත අධ්‍යාපනය කරා ප්‍රවේශය සීමා වූ අතර නාගරික සහ තදාසන්න ළමුන්ට වඩා ග්‍රාමීය ළමුන්ට වැඩි අවාසි අත් විය.
- ගැහැණු ළමුන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව විෂයයන් ඉගෙනීමට, භූමිකා ඉටු කිරීමට හා ඇතැම් අවස්ථාවල ගැහැණු ළමුන් නිදහස් අධ්‍යාපනයේ නීති සහ සහාය සේවා හරහා පූර්ණ ප්‍රතිලාභ සහ තෝරා ගැනීම හා සංචරණය වෙනුවෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් භුක්ති විඳීමෙන් වළක්වන ආරක්ෂක ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අපේක්ෂා කිරීම සමඟ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අධ්‍යාපනික බෙදා වෙන් කිරීම රට තුළ දක්නට ඇත.
- ගැහැණු ළමයින් වැඩි විය පැමිණි විට ජලය සහ සනීපාරක්ෂාව විශේෂ වැදගත්කමකින් යුතු වන අතර ඔසප් සෞඛ්‍යය සහ පෞද්ගලිකත්වය පිළිබඳ ගැටළු පවතී. පාසල් තුළ දුර්වල ජල හා සනීපාරක්ෂක පහසුකම් තරුණ ගැහැණු ළමුන් අතර පාසල් නොපැමිණීමට දැනට ප්‍රධාන හේතු අතරින් එකක්ව පවතී. ඔසප් වීම හා බැඳුණු සමාජ අපකීර්තිය, ගුරුවරියන් කරා දුර්වල ප්‍රවේශය හා පාසලේදී හා නිවසේදී නිසි ඔසප් සෞඛ්‍යය පිළිබඳ දැනුවත්බව අඩු බව මෙම ගැටළු උග්‍ර අතට හරවා ඇත.
- ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම් සහ දරිද්‍රතාව, අධ්‍යාපනය හා මාධ්‍ය ඇතුළුව තොරතුරු මූලාශ්‍ර කරා නිසි ප්‍රවේශය නොමැති වීම හා සම්පව බැඳී ඇති ගැටළු පිළිබඳ පිරිමි ළමුන්ට ඇත්තේ අල්ප දැනුවත් බවක් හා ප්‍රවේශයකි. මෙය ළමුන්ගේ ශාරීරික සහ චිත්තවේගී යහපැවැත්ම කෙරෙහි අහිතකරව බලපානවාක් මෙන්ම අනවශ්‍ය ගැබ් ගැනීම් සහ ලිංගික වශයෙන් සම්ප්‍රේෂණය වන රෝග වලට මග පාදයි.
- ස්ථූලතාව, ඌණ පෝෂණය සහ මන්දපෝෂණය නව යොවුන් ගැහැණු ළමුන් අතර පුළුල්ව පැතිර පැවතීම තුළ නව යොවුන් ගැහැණු ළමුන්ගේ පෝෂණ අවශ්‍යතා කණස්සල්ල දනවන කරුණකි.
- ද්‍රව්‍ය අවභාවිතය (මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය) සහ එහි බලපෑම පිලිබඳ තොරතුරු නොමැති වීම, ද්‍රව්‍ය අවභාවිතය දෙස විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයකින් තොරව ධර්මිෂ්ඨ දෘෂ්ඨිකෝණයකින බැලීම ගැහැණු හා පිරිමි ළමුන් සම්බන්ධයෙන් නොසලකා හරිනු ලැබ ඇති තවත් ක්ෂේත්‍රයකි. ළමුන් අතර ද්‍රව්‍ය අවභාවිතය සම්බන්ධයෙන් අල්ප අවබෝධය හා ස්ත්‍රී පුරුෂ බව අනුව වෙන් කරන ලද අල්ප තොරතුරු පවතී.
- දුගී සහ ග්‍රාමීය ළමුන් , වීථි ළමුන් සහ ගැටුමෙහි බලපෑමට ලක් වූ ළමුන් ඉහත දක්වා ඇති සියළු ආකාරයේ සෘණාත්මක බලපෑම් වලට ලක්වීමේ විශේෂ අවදානමක් ඇත.

UNFPA

UN WOMEN

U N D P